# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 පෙබරවාරි 19 වන අඟහරුවාදා**
2013 பெப்ரவரி 19 செவ்வாய்க்கிழமை
Tuesday 19th February 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

çê°êõËù°ù, ² ÛÁô^ê°êäÇõ, îìä°òðù° îæèç°Îçæìô ëèôê°éê, ¡ù.204 ¡ù° Îëù° ëèæèú òéçÁðä° ÇêðÁ æì°ìê° îêèÆêðÁðù° íéëå°Êó°ó ÇêðÁ òéç ëÈìçê°êðù° åéìîç÷°÷ …ì°ìë°.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.50 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.50க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.50a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේ රත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදනය
## ANNOUNCEMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"සභා ලේකම්තුමා විසින් දැනටමත් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලිඛිතව දැනුම් දී ඇති පරිදි බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය 2013.02.11 වන දින සිට බත්තරමුල්ල, සෙත්සිරිපාය, 5 වන මහල, බී පර්යන්තයෙහි ස්ථාපනය කර ඇති බව කාරුණිකව දැනුම් දෙනවා.*

*කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පිහිටුවා තිබුණු සභා ලේකම් කාර්යාලය සහ ඊට අනුබද්ධිත කාර්යාලය මඟින් මෙතෙක් ලබා දුන් සියලු සේවාවන් නව කාර්යාලය පිහිටි ස්ථානයෙන් ලබා ගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත නැවතත් කාරුණිකව අවධානය කර සිටිනවා."*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

i. 2013.02.05 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව

ii. 2012.01.01 දින සිට 2012.12.31 දින දක්වා කාලය තුළ බස්නාහිර පළාතේ පළාත් සභාවේ මහජන පෙත්සම් කාරක සභාව විසින් විභාග කළ පෙත්සම් පිළිබඳ සාරාංශය ඇතුළත් ලේඛනය.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that copies of the relevant reports are placed on the tables of Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අංගොඩ, කුඩාබුත්ගමුව, අංක 122 හි පදිංචි එච්.එම්.ඩී රත්නායක යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Karmal Kuruppu

ගරු සභාපතිතුමනි, දංඕවිට, මඩබාවිට, අංක 114 හි පදිංචි එස්.එම්. ආරියරත්න යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ නමින් යුත් ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට එවෙලේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා සභා ගර්භයේ නොසිටි බැවින් ප්‍රශ්නය ඊළඟ සභාවට යොමු කරන හැටියට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*As Hon. Chief Opposition Whip, U. George Perera was not in the Council Chamber at the time to refer the question in the name of the Hon. Chief Opposition Whip, referred to under No. 01 in the agenda to the Hon. Chief Minister for obtaining a reply, the Chairman ordered that the question be presented to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 02 සහ 03 යටතේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට මාසයක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්න අදාළ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The questions in the name of the Hon. Nalinda Jayathissa, Member, under item No. 02 & 03 of the agenda, were*

*presented to the Hon. Chief Minister and as one months' time was asked for, Hon. Chairman ordered the questions to be referred to the relevant Council sitting.*

## පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පෞද්ගලික පැහැදිලි කිරීම් කරන මේ වේලාවේ මේ කාරණයට සම්බන්ධ ගරු ඇමැතිතුමා සභාවේ නැති වුණත් මම මේ කාරණය ඉදිරිපත් කරන්න කැමැතියි. ඒ හේතුව තමයි, මේ සභාවේම අපි දීර්ඝ කාලයක් සාකච්ඡා කරලා සමූපකාර ප්‍රඥප්තියක් ගොඩනැඟුවා. මේ සමූපකාර ප්‍රඥප්තියේ මූලිකම බලාපොරොත්තුව වුණේ, මහජන ව්‍යාපාරයක් විධියට මහජනයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න වාගේම ඒ ව්‍යාපාරයට එල්ල වන විවිධ බලපෑම් වලින් සමූපකාර ව්‍යාපාරය ආරක්ෂා කර ගන්නයි. නමුත් අද තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වෙමින් යන යුගයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. හේතුව සමූපකාර සේවක කොමිෂන් සභාව සමූපකාර සේවකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, සමූපකාර සේවකයාගේ යුතුකම් ටික රැකලා දෙන්න, සමූපකාර ව්‍යාපාරය ආරක්ෂා කරන්න තිබෙන ස්වාධීන ආයතනයක් වුණාට අද සමූපකාර සේවක කොමිෂන් සභාව සම්පූර්ණයෙන්ම අයාලේ යන ආයතනයක් බවට පත් වෙමින් තිබෙනවා. විශේෂයෙන් සමූපකාර සේවකයින්ගේ ආරක්ෂාව පිළිබඳව සහතික වීමක් නැති, සමූපකාර ව්‍යාපාරය ආරක්ෂා කරන්නට ඕනෑය කියලා උවමනාවක් නැති සමස්ත සමූපකාර ව්‍යාපාරයම දේශපාලනයට යට කරමින් යන දූෂිතයන්ට, දූෂණයට පත් වුණු මිනිස්සුන්ව ආරක්ෂා කරන තැනක් බවට අද පරිවර්තනය වෙමින් යනවා, ගරු සභාපතිතුමනි. ඒ නිසා විශේෂයෙන්ම සමූපකාර ප්‍රඥප්තියට අනුව සමූපකාර සේවකයෙක්, සමූපකාර කොමිෂන් සභාවේ අගතියක් ඇති වුණොත් ඒ සඳහා ඒකේ ඉල්ලීමක් කරන්නට ඕනෑ, Appeal කරන්නට ඕනෑ අදාළ සභාපතිවරයාට. අදාළ අමාත්‍යවරයාට. නමුත් අපට තේරෙනවා. මේ ගන්න සමහර දුර්වල තීන්දුවලින් සමස්ත සමූපකාර ව්‍යාපාරයම අද විනාශ වෙනවා කියලා.

දැන් උදාහරණයක් විධියට කොළොන්නාව සමූපකාර සමිතිය ගත්තත්, අද වැහෙන්න යන තැනට පත් වෙමින් තිබෙනවා. මිලියන 2000 ක් විතර පාඩු ලබමින් තිබෙන ආයතනයක් අද වර්තමාන සභාපතිවරයා යටතේ පාලනය වෙනවා. මෙහි දූෂණයන් අනන්ත අප්‍රමාණ විධියට ඉයවහ ගිහිල්ලා. අනික් පැත්තෙන් සමූපකාර ව්‍යාපාරයේ අපි අලුත් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කළාට මේ අලුත් ප්‍රඥප්තිය යටතේ ඡන්දය තිබිය යුතු නියමිත වේලාවට ඡන්දය තියන්නේ නැහැ. දැන් උදාහරණයක් විධියට කොළොන්නාවේ සමිතියේත් අද ඡන්දය නිසි වේලාවට, නිසි කලට පවත්වන්නේ නැහැ. කොළොන්නාව සමිතියේත් මේ සභාපතිවරයාගේ දූෂණයන් පිළිබඳව මේ කොමිෂන් සභාවට, අදාළ කොමසාරිස්වරුන්ට සියලුදෙනාටම දැනුම් දීලා තිබුණත් මේවා දේශපාලන යට ගැසීම් නිසා මේ සභාපතිවරයා සම්පූර්ණයෙන්ම ආරක්ෂා වෙමින් යනවා. මේ නිසා සමූපකාර ව්‍යාපාරය අනාරක්ෂිත තත්ත්වයකට පත් වෙනවා.

දැන් මේකේ චෝදනා ගණනාවක් තිබෙනවා. මේ චෝදනා පිළිබඳව අදාළ කොමසාරිස්වරයාව දැනුවත් කරලා තිබෙන්නේ. මේ පිළිබඳව පරීක්ෂණ පවත්වන්න කියන්නේ. මම එදත් මේක මතක් කළා. කොමසාරිස්වරුන් තමන්ගේ තත්ත්වය, නිලය ආරක්ෂා කර ගන්නවා ඇරෙන්න මේ ව්‍යාපාරය ආරක්ෂා කරන්න වැඩ කටයුතු කරන්නේ නැති තැනක සමස්ත ව්‍යාපාරයම විනාශ වෙමින් යනවයි කියන එක ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතක් කරන්නට ඕනෑ. ඒ නිසා වැරදි කරපු නිලධාරීන්ට විරුද්ධව, එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්න, සමූපකාර සේවක කොමිෂන් සභාවේ උසස් වීම් වැරදි විධියට දුන්නාම ඒ සේවක කොමිෂන් සභාවට සේවකයන් පැමිණිලි කළාම ඒ පිළිබඳව නොතකා හරින, තමන්ට හිතුමතේ තමන් කටයුතු කරන තැනක් බවට පරිවර්තනය වෙනවා. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ එකම දෙයයි. නුදුරේම මේ සමස්ත සමූපකාර මහජන ව්‍යාපාරය කාබාසිනියා වන තැනකට අද පත් වෙමින් තිබෙනවා. එවැනි තැනකට මේක පත් කරනවා කියන එක ඔබතුමාට මතක් කරමින් මේ කාරණා සම්බන්ධයෙන් විධිමත් වූ පරීක්ෂණයක් - මම මේ සම්බන්ධව තමයි පෙත්සම් කාරක සභාවට පෙත්සම ඉදිරිපත් කළේ. විධිමත් වූ වැඩ පිළිවෙළකට ගෙනියන්න අවශ්‍ය කටයුතු කරන්නය කියන එක මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අද අපේ අවධානය විශේෂයෙන් යොමු කරන්න ඕනෑ කාරණාවක් තමයි, දැන් බස්නාහිර පළාත් සභාවේ බල ප්‍රදේශය ඇතුළේ වැඩිම අපරාධ වාර්තා වෙනවා. මෙහිදී ජනතාවගේ අවධානයත්, ඒ එක්කම සැලකිය යුතු සංවිධාන රාශියක අවධානයත් මේ සම්බන්ධයෙන් යොමු කරන්න ඕනෑ. අපි දන්නවා. පුද්ගලයෝ වශයෙන් අපි නම් සඳහන් නොකළාට කැලණිය, ඒ එක්කම මීරිගම, දැන් මෑතම සිද්ධිය අත්තනගල්ල. නන්නාඳුන පිරිස් අවි ආයුධ අරගෙන ඇවිල්ලා වෙඩි තියනවා. මේ දැයට වටිනා ජීවිත අහිමි කරනවා. මේ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් තවම ක්‍රියාත්මක වෙන්නේ නැහැ, මේ අපරාධ රැල්ල නවත්ත ගන්න. මෙහිදී මා ඔබතුමා මගින් අපේ ගරු මහ ඇමැතිතුමාට මතක් කර සිටිනවා. විශේෂයෙන්ම ප්‍රාදේශීය දේශපාලඥයින්ගේ සම්බන්ධතා ඇති යම් යම් කල්ලි විසින්, ඒ පුද්ගලයන් විසින් තමයි මේ අපරාධ රැල්ල මෙහෙයවනු ලබන්නේ. ඒ කාර්යයන්ට සහාය දෙන්න සමහර පොලීසියේ නිලධාරීන් - විශේෂයෙන්ම ඉහළ නිලධාරීන් සහාය දෙනවා. ජන මාධ්‍ය මගින් දැනගන්න ලැබුණා මෑතකදී යම් පරීක්ෂණයක් පවත්වන්නත් නියම කළා කියලා. මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා මේ සියලුම ප්‍රාදේශීය දේශපාලන නායකයින් පිළිබඳව, ඒ ගොල්ලන්ගේ ක්‍රියා කලාපයන් පිළිබඳව සොයා බලලා අපි මේ ගැන විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක

කරන්න අවශ්‍යයි. ඒ එක්කම යුද්ධය පවතින වකවානුවේ අපි දැක්කා, මේ ආයුධ තිබුණේ එක පිරිසක් අතර. නිශ්චිත ප්‍රදේශයක. ප්‍රහාර එල්ල කෙරුවේ එක තැනක ඉඳගෙන. මේ පුද්ගලයෝ කවුද කියලා අපි අඳුරගෙන තිබුණා. දැන් අද මේ මැර ප්‍රහාර ක්‍රියාත්මක කරන, ම්ලේච්ඡ ප්‍රහාර ක්‍රියාත්මක කරන අය තවම හඳුනා ගැනීමටවත් හැකියාවක් නැහැ. නන්නාඳුන තුවක්කුකරුවෙක් වෙඩි තිබ්බා කියන ප්‍රකාශය තමයි මාධ්‍යවල පළ වෙන්නේ. එතැනින් එහාට කවුද මේකේ පිටිපස්සේ ඉන්නේ කියන සමහර කාරණා වැහිලා යනවා. අපි ඉතාම කනගාටුවට පත් වෙන කාරණාවක් තමයි මේ අපරාධ රැල්ල නවත්වන්න පැමිණිලි කරන්න එන පුද්ගලයා සමහරවිට ටික කාලයක් යන විට කම්පනයට පත් වුණාය කියලා අහන්න ලැබෙනවා. එහෙම නැත්නම් දිවුරුම් ප්‍රකාශයකින් පැමිණිල්ල ඉල්ලා අස් කරගන්නවා කියලා අහන්න ලැබෙනවා. මේ ප්‍රවනතාවයත් මේ රටට ගැළපෙන වැදගත් ප්‍රවනතාවයක් නොවෙයි. ඒ නිසා කුමන තරාතිරමක කෙනෙක් හෝ වේවා. මේ අපරාධ සම්බන්ධයෙන් ආයුධ අතේ අරගෙන ඉන්නවා නම්, ඔහු කාගේ හරි දේශපාලන රැකවරණයක් ලබාගෙන ඉන්නවා නම් මේ සම්බන්ධයෙන් රජය වහාම පියවරක් ගන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාව රජයේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ ජනගහනය වැඩි, ඒ එක්කම විශාල ආර්ථිකයට දායකත්වයක් සපයන වැදගත් ජනතාවක් සිටින ප්‍රදේශයක් හැටියට. ඒ එක්කම මුළු රටට ආදර්ශයක් දෙන්න ඕනෑ. පළාත් සභාවක් හැටියට මේ කාරණාව ගැන විශේෂ අවධානය යොමු කරලා, මේ හිෂණ, මර්දන ඒ එක්කම ම්ලේච්ඡ ප්‍රහාර වහාම නවත්වලා මේ අවි ආයුධ දරන නිල නොවන පුද්ගලයින්ව අත්අඩංගුවට අරගෙන මේ පිළිබඳව වහාම වැදගත් වැඩ පිළිවෙළකට පියවර තබන්න කියලා ඔබතුමා මඟින් ගරු මහ ඇමැතිතුමාට මම යෝජනා කරනවා. මේ ගැන සියලුදෙනාගේම අවධානය යොමු කර සිටිනවා. ස්තූතියි.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

ගරු සභාපතිතුමනි, පිළියන්දල අංක එක කණිෂ්ට විද්‍යාලයේ ගුරුවරියක් ළමයින්ට කරන අඩන්තේට්ටම් පිළිබඳව මීට ප්‍රථම දෙමව්පියන් විසින් විදුහල්පතිතුමා දැනුවත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව කිසිම කටයුත්තක් නොකර තිබෙනවා. දෙවනුව නැවත වාරයක් මහජන නියෝජිතයෙක් හැටියට මා වෙත දැනුවත් කළා. ඒ දැනුවත් කිරීම සම්බන්ධව මම අදාළ ප්‍රශ්නය පිළිබඳව ඇහුවාම කිව්වා, එහෙම ප්‍රශ්නයක් වෙන්නේ නැහැයි කියලා. ඒ ගුරුවරියගේ ප්‍රශ්නය පිළිබඳව, ළමයින්ට අඩන්තේට්ටම් කිරීම පිළිබඳව කලාප අධ්‍යක්ෂතුමාව දැනුවත් කළා. කරුණු සම්බන්ධව. මම ඊට පස්සේ - ඒ දෙමව්පියන්ට කිව්වා පුළුවන්නම් මට මේක අල්ලලා දෙන්න ක්‍රමයක් හදලා දෙන්න කියලා. මා අතේ ඒ වීඩියෝ පටිය තිබෙනවා. ඒ ගුරුවරිය ළමයින්ට උදේ පාසලට පැමිණි අවස්ථාවේ ඉඳලා වරින් වර කරන අඩන්තේට්ටම් පටිගත කළ වීඩියෝ පටිය මා ළඟ තිබෙනවා. මේ පිළිබඳව කලාප අධ්‍යක්ෂතුමාව දැනුවත් කරලා කිව්වා, මේ ප්‍රශ්නය දුරදිග නොයවා මේ ගුරුවරිය සම්බන්ධව යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නය කියලා. නමුත් කලාප අධ්‍යක්ෂතුමා කිසිම ඇහුම් දීමක්, කන්දීමක් කළේ නැහැ. එතුමා ඇත්තටම නිකන් විකටයෙක් වාගේ හැසිරෙන පුද්ගලයෙක්. දැනට ඉන්න කලාප අධ්‍යක්ෂතුමා. මේ ළමයින්ගේ ප්‍රශ්නය කිව්වාට පස්සේ මේකට කැස්බෑව කලාපයේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ දේශපාලඥයෙක් - මම පැහැදිලිව කියනවා. මේ ගුරුවරිය ආරක්ෂා කරගන්න යම්කිසි ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවා. ඒකට භයේ තමයි මේ කලාප අධක්ෂතුමා කිසිම වගකීමක් නැතිව මේ ගුරුවරිය සම්බන්ධව කටයුතු නොකළේ. මම ලිඛිතව භාර දුන්නා මේ ගුරුවරිය සම්බන්ධව. මගේ ගාව තිබෙනවා. මේ වීඩියෝ පටිය මම විදුහල්පතිතුමාට පෙන්නුවා. විදුහල්පතිතුමා මේ වීඩියෝ පටිය පිළිගත්තා. ඒ ළමයින්ට ගහන එක සම්බන්ධව. මේ පාසලේ මීට පෙරත් යම් යම් සිදුවීම් වෙලා ඒ පිළිබඳව අධිකරණය පවා යම්කිසි කටයුතු - ගුරුවරුන්ගෙන් වුණු යම් ප්‍රශ්න පිළිබඳව අධිකරණයේ පවා මේ වන කොට කටයුතු ක්‍රියාත්මක වෙනවා. මේ වීඩියෝ පටිය මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට භාර දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඕක සභාගත කරන්න.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

මම හිතන්නේ මේ ගුරුවරිය සම්බන්ධව කලාප අධ්‍යක්ෂවරයා මේ වනතෙක් කටයුත්තක් කළේ නැහැ. අද වනකොට මට ආරංචි වුණා, දෙමළ මාධ්‍යයේ ගුරුවරියක් - විදුහල්පතිතුමාට මේකේ කරන්න කාරියක් නැහැ. එතුමාට ගුරුවරු නැහැ දෙන්න. ඒ නිසා එතුමා බොහොම උත්සාහ කළා මේ ප්‍රශ්නය විසඳන්න. ගුරුවරියක් ලබා ගන්න. නමුත් කලාප අධ්‍යක්ෂතුමා කිසිම විටක ඒ කටයුත්ත සම්බන්ධව කටයුතු කළේ නැහැ. ඒ කටයුතු නොකර එතුමා මේක නිකන් එහෙට මෙහෙට විසි කර කර සිටියා. අන්තිමට ළමයින්ට උගන්වන්න පාසලේ ගුරුවරියක් නැති කළා. ඒ විතරක් නොවෙයි. දෙමව්පියන්ට යම් යම් ප්‍රශ්න ඇති කළා. පොලීසියට පවා කියලා. ඒ පරීක්ෂණ කරන්න පොලීසිය පවා මේ වන කොට කටයුතු කරලා තිබෙනවා. මේ වීඩියෝ කිරීම සම්බන්ධව කටයුතු කරන්න. ඇත්තටම මමයි කිව්වේ. මට මේක අල්ලලා දෙන්න කියලා. ඒ සම්බන්ධව කටයුතු කරලා ඒ Piece එක මා ළඟ තිබෙනවා. ඒ ගුරුවරිය කරන අඩන්තේට්ටම් පිළිබඳව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දේශපාලඥයාට කියන්න.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

දේශපාලඥයෙක් මේ ගුරුවරිය ආරක්ෂා කරන්න කටයුතු කරලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධීක්ෂණ මන්ත්‍රීතුමාට කිව්වේ නැද්ද?

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට නොවෙයි, මේ කටයුත්ත කරන්නේ. ඒ කලාපයට ගිහිල්ලා, කලාපයට තර්ජනය කරලා ඒ ගුරුවරිය ආරක්ෂා කරන්න කටයුතු කරලා තිබෙනවා. මේ වන විට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයා. කැස්බෑවේ ඉන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවුරුදු 18 ක් විතර පාලනය කරලා එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දික් කරන්න එපා. තමුන්නාන්සේලාගේ වගකීම කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය බාධා කිරීම්වලට යන්න එපා.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

අපි ඇත්ත කථා කරන්නේ. මේ පිළිබඳව කටයුතු කරන්න මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට භාර දෙනවා. මේ ඉන්න කලාප අධ්‍යක්ෂතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද? මන්ත්‍රී. කියන්න කෝ?

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

මම භය නැතිව කියනවා. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධීක්ෂණ මන්ත්‍රී කවුද?

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

අධීක්ෂණ මන්ත්‍රීවරු අපට නැහැ. එහෙම මන්ත්‍රීවරු අපේ නැහැ. අපේ අධීක්ෂණ මන්ත්‍රීවරු නැහැ. මේ ඉන්න ගුරුවරිය ආරක්ෂා කිරීම සම්බන්ධව කලාප අධ්‍යක්ෂතුමා ගෙනියන වැඩ පිළිවෙළ සම්බන්ධව - එතුමාව මෙතැනින් ඉවත් කරලා මේකට සාධාරණ පරීක්ෂණයක් කරන්නය කියන ඉල්ලීම මම කරනවා. මේ සභාවෙන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තමුන්නාන්සේලාගේ අධීක්ෂණයේ හොඳකම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය ප්‍රකාශය ඉදිරිපත් කරන කොට කවුරුත් ඔබතුමියට බාධා කිරීම් කළේ නැහැ නේ? ඒ නිසා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, පිළියන්දල පාසල් දෙක අතරින් තිබෙන හොඳම පාසල. අපි කැමැති නැහැ, මේ පාසල විනාශයට යනවා දකින්න. ශිෂ්‍යත්වයෙන් ලකුණු අරගෙන වැඩිම ළමයින් සංඛ්‍යාවක් ශිෂ්‍යත්ව විභාගයෙන් පාස් වෙන පාසල් දෙක තමයි පිළියන්දල කණිෂ්ට අංක 01 විද්‍යාලයත්, සෝමසිරි චන්ද්‍රසිරි විද්‍යාලයත්. ළමයින් ඇතුළත් කිරීම සඳහා දෙමව්පියන්ගේ විශාල ඉල්ලීමක් තිබෙන පාසල් දෙක. මේ පාසල මෙහෙම ගියොත් විනාශයට පත් වෙනවා. ඒ නිසා කරුණාකරලා මේ පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් කරන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ දැන ගැනීම සඳහා මම මේ වීඩියෝ පටිය ඔබතුමාට භාර දෙන්න කටයුතු කරනවා. දැනට කලාප අධ්‍යක්ෂතුමා මෙම ස්ථානයෙන් ඉවත් කරලා මෙම කටයුත්ත කරන්නය කියන එක මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වීඩියෝ පටිය සභාගත කරලා මෙහෙට එවන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් පාසලක ගුරුවරියක් ඒ පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිදු කරන අඩන්තේට්ටම් පිළිබඳව කථා කළා. හොඳයි, අධ්‍යාපනය සම්බන්ධයෙන් එහෙම අවධානයක් යොමු කිරීම ගැන. ඒ වාගේම මම මේ අවස්ථාවේදී අවධානය යොමු කරන්න කැමැතියි. ඒ ගුරුවරිය නොවෙයි. මේ බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන ඇමැතිවරයා සහ සමස්ත කැබිනට් එක, ඊළඟට අපේ රටේ අධ්‍යාපන අමාත්‍යාංශය විශේෂයෙන් බස්නාහිර පළාතේ පාසල් ළමුන් පීඩාවට පත් කරමින් තිබෙනවා. අර ගුරුවරියට වඩා වැඩි දඬුවමක් ළමයින්ට ලබා දෙමින් පවතිනවා. ඔබතුමා දන්නවා. මේ පසුගිය පළාත් සභා වාර දෙක අතරේදී සිදු වුණු රටේ මහත් ආන්දෝලනයට ලක් වුණු සිදුවීමක්. කළුතර දිස්ත්‍රික්කයේ හොරණ අධ්‍යාපන

කලාපයේ මේධංකර මහා විද්‍යාලයේ දහතුන් හැවිරිදි ශිෂ්‍යාවක් පාසලට තීන්ත ගාන්න රුපියල් 800/- ක් ගේන්න කියලා, පොල් ගෙඩි අටක් හොරකම් කරලා වෙච්ච ආන්දෝලාත්මක සිදුවීම. මේකෙන් මේ සමස්ත අධ්‍යාපනයේ ඛේදවාචකය මොනතරම්ද කියලා පේනවා. දැන් මේ සිද්ධිය වාර්තා වුණාට පස්සේ ගරු සභාපතිතුමනි, මේකට සම්බන්ධ වුණු පාර්ශවයන්ගේ හැසිරීම කොහොමද? ඔබතුමා දන්නවා. මේකට පාර්ශව කීපයක් සම්බන්ධයි. අර ශිෂ්‍යාව සම්බන්ධයි. ශිෂ්‍යාවගේ දෙමව්පියන් සම්බන්ධයි. විදුහල්පති සම්බන්ධයි. පොලීසිය සම්බන්ධයි. අධිකරණය සම්බන්ධයි. මහ ඇමැතිවරයා සම්බන්ධයි. ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැතිවරයා සම්බන්ධයි. හැබැයි හැමදෙනාම බෝලේ පාස් කර කර සිටියා. කට්ටියක් කිව්වා, විදුහල්පතිගේ වැරැද්ද කියලා. කට්ටියක් කියන්න ගත්තා ශිෂ්‍යාවගේ වැරැද්ද කියලා. පොලීසිය කිව්වා, තාත්තා බොන හින්දා මේ දරුවාට සල්ලි දෙන්න විධියක් නැහැයි කියලා. මේ වාගේ දේවල් තමයි කියමින් සිටියේ. හැබැයි ඇත්තටම වෙලා තිබෙන්නේ මොකක්ද? මේ ඇවිල්ලා මහා දුරක, හද්දා පිටිසර නොවෙයි. හොරණ ඉඳන් කිලෝ මීටර් දෙකක් ඇතුළත රටේ ප්‍රධාන නගරයක් ආශ්‍රිතව තිබෙන පාසලක්. මේක හද්ද පිටිසර නොවෙයි. හැබැයි පාසලේ මුදල් එකතු කරනවා. මොකටද? තීන්ත ගාන්න. මහ ඇමැතිවරයා පිළි අරගෙන තිබෙනවා, මේ පාසලේ දෙමව්පියන් කවයක් එකතු වෙලා අබලන් ඩෙස් පුටු සකසා තීන්ත ආලේප කිරීමට, අල්මාරියක් මිලදී ගැනීමට රුපියල් 800/- ගණනේ එකතු කළාය කියලා. එහෙම තමයි එකතු කරලා තිබෙන්නේ. එහෙමනම් මේක රටේ හැමතැනම සිද්ධ වන දෙයක්. මේක මේ දැන් පළමුවැනි සිද්ධිය වාගේ ඇහුවේ. ඊට පහුවෙනිදා රැස් වුණු කැබිනට් මණ්ඩලයේදී ජනාධිපතිවරයා කම්පා වුණාය. දුක් වුණාය. මගේ රටේ මෙහෙම දේවල් වෙනවාද කියලා කම්පා වුණා කියලා පත්තරවල වාර්තා කරලා තිබුණා. ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා. හැම වාරයකම පන්ති කව තියලා දෙමාපියන්ගෙන් සල්ලි එකතු කරනවා. මේකේ අට සියයි. දාහ, දෙදහ, පන්දාහ එකතු කරන පාසල් තිබෙනවා. මේක වාර්තා වෙලා දවස් දෙකකට පස්සේ ගම්පහ සල්ලි එකතු කරපු පාසල් ගණනාවක් වාර්තා වුණා. එතකොට ඇයි සල්ලි එකතු කරන්න වෙලා තිබෙන්නේ. මේකේ අපි සලකන්න ඕනෑ කාරණාව පොල් ගෙඩි අටද? දහයද? දෙකද? එහෙම නැත්නම් මේක සමථ මණ්ඩලයට ගියේ නැත්තේ ඇයි? අධිකරණයට ගියේ ඇයි කියන කාරණය නොවෙයි. පාසල්වලට මුදල් වෙන් කරලා නැහැ. 2012 සමස්ත අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන්නේ 1.86% යි. ගුරුවරු විසි දාහක් විතර පෙළපාලි ගියා 6% ක් වෙන් කරන්න කියලා. හැබැයි 1.86% ය බැස්සා 1.49% ට. ගරු සභාපතිතුමනි, 2010 මේ සමස්ත පාසල්වලට 1.54% ක් වෙන් කරන කොට 2013 වසරේ බැස්සා 1.17% ට. 1.17% ට බැස්සාට පස්සේ ඒ සල්ලි ටික එකතු කරන්න විදුහල්පතිවරුන්ට බල කරනවා දෙමව්පියන්ගෙන්. ඒ නිසා මේක විදුහල්පතිවරුන්ගේ වැරැද්දක් නොවෙයි.

මම දැක්කා, හොරණ ආසනයේ ප්‍රධාන සංවිධායක වෙච්ච, හිටපු අගමැතිතුමාගේ පුතා වෙච්ච විදුර වික්‍රමනායක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කියනවා මේ විදුහල්පතිට චෝදනා ගොඩක් තිබෙනවා කියලා. ඇත්ත. චෝදනා ඇති. මොකද, එක සැරයක් සිරිකමල් ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහපු වේලාවේ මේ පළාත් සභාවේ මහ ඇමැතිතුමා කිව්වා, හොරණ මේධංකර විද්‍යාලයේ 2012 ළමුන් බඳවා ගන්න කොට - මේකේ නම් තිබෙන්නේ, එක් ලක්ෂ දහ නව දාහයි කියලා. මම වගකීමෙන් කියනවා. රුපියල් ලක්ෂ දහයකට වඩා එකතු කරලා තිබෙනවා. රුපියල් ලක්ෂ දහයක්. හැබැයි, මේක පොඩි ගාණක්. විදුහල්පතිට ඒ පාසල් පවත්වාගෙන යන්න බැහැ, සල්ලි දෙන්නේ නැති හින්දා. ඉතින් බලන්න. රටේ ජනතාව බදු ගෙවනවා. අධ්‍යාපනය වෙනුවෙන් බදු පිට බදු ගෙවනවා. තමන්ගේ දරුවාට උගන්වන්න කියලා. ඒකෙන් අධ්‍යාපන ඇමැතිවරු 16 ක් රටේ ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අධ්‍යාපන ඇමැතිවරු 16 ක් රටේ ඉන්නවා. 16 ක් තියාගෙන දරුවෝ පොල් ගෙඩි අහුලන තැනට රට පත් කරලා තිබෙනවා. මෙන්න අධ්‍යාපනයේ ඛේදවාචකය. ඒ නිසා මේකට අර මහ ඇමැතිතුමා කිව්වා වාගේ දරුවාට Counseling කරලා හරියන්නේ නැහැ. Counseling එක නොවෙයි ප්‍රශ්නය. දරුවාට මානසික ලෙඩක් නැහැ. මේ විධියට මුදල් වෙන් නොකර දරුවන්ව ඒකට පත් කරන ආණ්ඩුවටයි Counseling කරන්න ඕනෑ. ඊළඟට මේකට මුවා වෙලා මුදල් එකතු කරන චක්‍රලේඛයක් ගේනවා නම් අපි සියලු දෙනාම විරුද්ධයි කියන එක ප්‍රකාශයට පත් කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිවරයා හැටියට කටයුතු කිරීම පිළිබඳව මෙතුමාගේ කථාවේදී කිව්වා. ගරු සභාපතිතුමනි, මම වගකීමෙන් මේක ප්‍රකාශ කරන්න ඕනෑ. නැත්නම් මාධ්‍ය හරහා වැරදි ප්‍රකාශයක් යනවා. මෙතුමන්ලා වාගේ දරුවාව විකුණාගෙන දේශපාලන වාසි ගන්න අපි කටයුතු කරන්නේ නැහැයි කියන කාරණාව පළමුවෙන්ම කියන්න ඕනෑ. මේ දරුවාගේ සිද්ධියේදී දරුවා පිළිබඳව තිබෙන කාරණා - විශේෂයෙන්ම මම සියලුම මාධ්‍යවේදීන්ට ස්තුතිවන්ත

වෙනවා. මම තොරතුරු අරගෙන, මාධ්‍ය සාකච්ඡාවක් තියලා, ඒ අයගෙන් ඉල්ලීමක් කරලා මේක රටට හෙළි කරන්න එපාය කියලා, තත්ත්වය පැහැදිලි කරලා දුන්නා ගරු සභාපතිතුමනි. ඊට පස්සේ මුල් දවස්වල හැසිරුනු විධියට වඩා වෙනස් විධියට මාධ්‍ය හැසිරිලා මේකේ සාධාරණය ඉටු කරන්න කටයුතු කළා.
[ ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා ]

මෙතුමන්ලා කියන කාරණාවේදී මම එකක් පිළිගන්නවා. සියලුම බහුතර පාසල්වල වාර්ෂිකව යම් යම් මුදල් එකතු කරනවා. ඒක නැහැයි කියන්නේ නැහැ. අපි කුඩා කාලේ පාසල් යනකොටත් අපේ පාසල්වල මුදල් එකතු කිරීම තිබුණා. මේක මේ රටේ අලුත් දෙයක් නොවෙයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පහසුකම් සේවා ගාස්තු.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, නැහැ ගරු මන්ත්‍රීතුමා. අපි දීලා තියෙනවා. ඊළඟට අපේ දරුවෝ පාසල් යනකොට. ආදි ශිෂ්‍යය සංගමය යටතේ අපේ දරුවෝ පාසලට ඇතුළත් කර ගන්නකොට අපි ගෙවපු මුදල් පවා - ඒ වාගේම පාසැල්වලට අපි කරපු සේවාව බලනවා. මේක හැමෝම දන්නවා. මේක හංගන්න දෙයක් නොවෙයි ගරු සභාපතිතුමනි. මම මෙතුමාට කියන්නම්. මම එතැනට එන්නේ. ගරු සභාපතිතුමනි, මුදල් එකතු කිරීම පිළිබඳ වගකීම අපි භාර ගන්නවා. හැබැයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමාට ඒ පිළිබඳව විවාදයකට යන්න දෙන්න අමාරුයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, විවාදයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා කියපු කාරණාව Quote කළේ නැත්නම් - ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් වෙන්නේ නැහැ ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව දැනට ඒ දරුවා සම්බන්ධයෙන් Counseling කරන එකත් සෞඛ්‍ය ඇමැතිතුමා මැදිහත් වෙලා, පාසලේ සියලුම දරුවන් සම්බන්ධයෙන් මේ වනකොට කටයුතු කරනවා. බස්නාහිර පළාතේ -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

දරුවෝ Counseling කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, නැහැ. මේ පාසලේ. ඒක විශේෂ කාරණයක් වුණා. මොකද, මාධ්‍ය හරහා ගිය ප්‍රචාරයත් එක්ක ඒ දරුවෝ, පාසලේ ගුරුවරු පවා යම් අසහනයකට පත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා ඔය කරන සෑම ප්‍රකාශයකදීම ඒ දේ වෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා අද ඒ ඉස්කෝලයේම Counseling ක්‍රමයක් මොකද, Counseling කියන එක අපට නොවෙයි එතුමන්ලාටත් කරන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ මිනී මරපු හැටි, ඉස්කෝල ගිනි තියපු හැටියට, බස් ගිනි තියපු හැටියට ඒවාට විතරක් නොවෙයි. පක්ෂයේ සියලුම අයට Counseling කරන්න වෙනවා. ගිනි තියපුවයි, මරපු මිනිස්සු ගාණයි, විදුහල්පතිවරු මරපු ගාණයි ඔබතුමන්ලාම කියන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා විවාදයකට යන්න -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගුරුවරු මරපු ගාණ කියන්න. මෙතුමන්ලාගෙන් අහන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික ප්‍රකාශ සම්බන්ධයෙන් විවාදයකට යන්න දෙන්න බැහැ. ගරු ප්‍රධාන ඇමැතිතුමා විවාදයකට යන්න දෙන්න අමාරුයි. ඉඩකඩ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඊළඟට ගරු සභාපතිතුමනි -

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

දැන් මේකට පැහැදිලි කිරීමක් කරන මුවාවෙන් එහෙම කථා කරන්න, මඩ ගහන්න දෙන්න බැහැ. දැන් මෙතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මුදල් එකතු කිරීම පිළිබඳව – මෙතුමන්ලා කිව්වා පළාත් සභාවෙන් මුදල් වෙන් කරලා නැහැයි කියලා ගරු සභාපතිතුමනි. අපි පාසල් 1268 ටම යම් මුදලක් වෙන් කළා. පළාත් සභා ඉතිහාසයේ පළමුවෙනි වතාවට පහුගිය අවුරුදු දෙකේ තමයි සියලුම පාසල් ආවරණය වන විධියට මේ මුදල් ප්‍රතිපාදන ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙන්නේ. ශිෂ්‍යයින් සංඛ්‍යාව පදනම් කරගෙන ඒක කළා. අපි කියන්නේ අපි කැමැතියි. අද වෙලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, සෑම දෙමව්පියෙක්ම කැමැතියි තමන්ගේ දරුවාට ඉහළම පහසුකම් සහිත පාසලක අධ්‍යාපනය ලබා දෙන්න. මම කැමැතියි මගේ දරුවාට එහෙම කරන්න. මෙතැන හංගලා කථා කරන්න දෙයක් නැහැ. හැමෝම කැමැතියි. මේක කථා කරන්න කවුරුත් බයයි. හැමෝම කැමැතියි තමන්ගේ දරුවාට උවමනා හොඳ අධ්‍යාපනයක් – මගේ දරුවාට AC කාමරයක උගන්වන්න පුළුවන් නම් මම ඒකට කැමැතියි. සමහර මහජන නියෝජිතයෝ කථා කරන්නේ අහසින් වැටිලා වාගේ.

ගරු සභාපතිතුමනි, සමහර දෙමව්පියෝ පන්ති කාමරවල පන්ති කව තියලා මුදල් එකතු කිරීමේ ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි එතැනදීත් මෙතුමා හංගලා කථා කළා. එතැනදී තිබෙනවා, ග්‍රාම සේවක සහතිකය ඉදිරිපත් කළාට පස්සේ ඒ දරුවන්ව මුදල් අය කිරීමෙන් නිදහස් කරන්න පුළුවන්. අර පාසලේ ඒ දේ කරලා තිබුණා. අඩු ආදායම්ලාභී. ඒ පාසලේ ඒ දේ කරලා තිබුණා. ඒ දරුවාගෙන් මුදල් ඉල්ලා තිබුණේ නැහැ. අද මෙතුමා මේ ප්‍රකාශයත් කරලා කළේ, මාධ්‍ය හරහා අර දරුවාව විකුණාගෙන කෑමක් ගරු සභාපතිතුමනි. ඒකට මම තරහයි. ඒකටයි මම ඒ වෙනුවෙන් කථා කළේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එතුමා මගේ ප්‍රකාශය පිළිබඳව උත්තර දුන්නා නම්, මටත් අයිතියක් තිබෙනවා –

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා විවාදයකට යන්න දෙන්න අමාරුයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එතුමා අර විධියට –

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයකට උත්තර දුන්නේ. එච්චරයි. ආයිත් නැවත කථා කරන්න දෙන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එතුමාට ඒ අයිතිය තිබෙනවා නම් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

විවාදයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්වලට කොහේද පැහැදිලි කිරීම් තියෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. විවාදයකට යන්න දෙන්න බැහැ. ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා, කොටුව – කරාඹුගස්හන්දිය බස් ධාවනය පිළිබඳව ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, ඊයේ දවසේ දිවයින පුවත්පතේ සිව්දෙස අතිරේකයේ සඳහන් වෙලා තිබුණා, "*කොටුව – කරාඹුගස්හන්දිය බස් යළි අතරමඟ නවතී*" කියන කාරණාව. මම මේ අවස්ථාවේදී

විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, දිවයින පුවත්පතට. ඊයේ දවසේ පැහැදිලි හෙළිදරව් කිරීමක් සිද්ධ කරලා තිබුණා, කොටුව - කරාඹුගස්හන්දිය මාර්ග අංක 356 බස් ධාවනය පිළිබඳව. විශේෂයෙන් දීර්ඝ කාලයක් තිස්සේ මගීන් විශාල ලෙස මේ මාර්ගයේ පෞද්ගලික බස් ධාවනය පිළිබඳව චෝදනා ගණනාවක් ඉදිරිපත් කරලා තිබුණු වේලාවක්. මේ ඊයේ දවසේ දිවයින සිව්දෙස අතිරේකය විසින් මේ පිළිබඳව හොඳ අධ්‍යයනයක්

[ ගරු ගුණසිරි ජයනාත් ]

කරලා, හෙළිදරව්වක් කරලා තිබෙනවා, මේ බස් ධාවනයේදී මගී ජනතාවට සිදුවන අසාධාරණය පිළිබඳව. මම මේ පුවත්පතේ ඒ කොටස සභාගත කරනවා. අපේ ප්‍රවාහන අමාත්‍ය උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ දැඩි අවධානයට යොමු කරනවා. ගරු ඇමැතිතුමා විශාල උත්සාහයක් ගන්න බව අපි දන්නවා. විශේෂයෙන් ප්‍රායෝගිකව එතුමා මාර්ගවලට ගිහිල්ලා සොයා බලලා කටයුතු ක්‍රියාත්මක කළත් මේ ප්‍රවාහන අධිකාරියේ ඉන්න නිලධාරී මහත්වරුන්ගේ තිබෙන අකාර්යක්ෂමතාවය නිසා තමයි මෙවැනි සිද්ධ වීම් සිද්ධ වෙන්නේ. විශේෂයෙන් ඊයේ දවසේ මේ දිවයින පුවත්පත හෙළි කරපු කාරණාව අනුව ගරු සභාපතිතුමනි, කොටුවෙන් පිටපත් වෙලා කරාඹුගස්හන්දියට පැයකින් වාගේ ගමනාන්තය ඉවර කරන්න පුළුවන් ධාවන මාර්ගය, මේ පුවත් පතේ සඳහන් කරලා තිබෙන සමීක්ෂණය අනුව පැය දෙකහාමාරක වාගේ කාලයක් ගත කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, මේ මාර්ගය කොටුව - කරාඹුගස්හන්දිය කියලා තමයි මාර්ග ධාවන බලපත්‍රයේ තිබෙන්නේ. නමුත් මේ 356 මාර්ග ධාවනයේ යෙදෙන බස් රථ හිමියන් සවස් කාලයේ කොටුවෙන් බස් රථය ආරම්භ කළාම කරාඹුගස්හන්දිය දක්වා යන්නේ නැතිව කිරිබත්ගොඩින් ධාවනය අවසන් කරනවා. බස් රථයට තිබෙන්නේ කොටුව - කරාඹුගස්හන්දිය Route Permit එක. බස් රථයේ සඳහන් වෙලා තිබෙන්නෙත් එහෙමයි. නැග්ග ගත්තාට පස්සේ මේක යන්නේ කිරිබත්ගොඩට විතරයි කියලා ඒ ගමන් වාරය කරාඹුගස්හන්දිය දක්වා නොගොස් කිරිබත්ගොඩින් සෙනඟ ටික බස්සනවා. බස්සලා ඉවර වෙලා නැවත කාලයක් ඉඳලා ඒ මගීන්ම නැවත ආයේ බස් එකකට නග්ගගෙන කරාඹුගස්හන්දිය දක්වා යන වැඩ පිළිවෙළක් පිළිබඳව ඊයේ දිවයින පුවත්පත හෙළිදරව්ව කරලා තිබෙනවා. මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න ඕනෑ.

කොටුව සිට කරාඹුගස්හන්දිය දක්වා ගමනාන්තය එක දිගට ගියොත් ගමන් ගාස්තුව වෙන්නේ රුපියල් 38/- යි. හැබැයි ගරු සභාපතිතුමනි, කිරිබත්ගොඩින් බස්සලා ටිකක් වෙලා ඉඳලා නැවත ඒ බස් එකම කරාඹුගස් හන්දිය දක්වා යන විට රුපියල් 51/- ක් දක්වා මගීන්ට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. දැඩි අසාධාරණයක්. එකක්, පැය දෙකාහාමාරක් වාගේ කාලයක් ගත වෙනවා. ඒ වාගේම රුපියල් 38/- ක් ගෙවන්න ඕනෑ ගමනාන්තයට රුපියල් 51/- ක් දක්වා ගෙවන්න සිද්ධ වෙනවා.

මෙහිදී විශේෂයෙන් අවධාරණය කරන්න කැමැතියි. පසුගිය දිනවල මම මාධ්‍යයෙන් දැක්කා. අර ගැමුණු විජේරත්න, බස් සංගමයේ සභාපතිතුමා සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රයට විශාල චෝදනාවක් කළා. විශේෂයෙන් එතුමා කියනවා, මම දැක්කා. ප්‍රවාහන අධිකාරිවල ඉන්න නිලධාරීන්ගේ තිබෙන අකාර්යක්ෂමතාවයයි, අල්ලසට ගිජු වීම නිසයි මේ සියලු පහසුකම් මගී ජනතාවට දෙන්න බැරි වෙලා තිබෙනවා කියලා. මොකද, ඒ ගොල්ලෝ අල්ලස් අරගෙන ඒ සියලු පහසුකම් මගී ජනතාවට දෙන ඒවා නැති කරලා තිබෙනවා කියලා. දැන් මේ කාරණයේදීත් අපට හිතන්න සිද්ධ වෙනවා. ඒ ගැමුණු විජේරත්න මහත්මයා කිව්ව කාරණය සත්‍යයක් කියලා. ඇයි? මාර්ග පරීක්ෂකවරු ඉන්නවා. ඊට පස්සේ ප්‍රාදේශීය කළමනාකරුවන් ඉන්නවා. මේ අය හරියට අධීක්ෂණය කරලා සොයා බැලීම කරනවා නම්, මේ කරන මාෆියා වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගන්න සිද්ධ වෙන්නේ නැහැ. අද අපේ ඉන්න මාර්ග පරීක්ෂකවරු. අපි දන්නවා. මේ බස් හිමියොත් එක්ක, බස් රියැදුරු මහත්වරු, කොන්දොස්තර මහත්වරුත් එක්ක එකතු වෙලා Party දාන එක තමයි කරන්නේ. මොනවා හරි Complain එකක් ගියාම බොරුවට අල්ල ගන්නවා. අල්ලගෙන එකතු වෙලා බෝතලේ ගහන තත්ත්වයට අද මේ මාර්ග පරීක්ෂකවරුන් පත් වෙලා තිබෙනවා. මෙන්න මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න ඕනෑ. මේ කොටුව - කරාඹුගස්හන්දිය මාර්ගය පමණක් නොවෙයි. මට උදාහරණයක් කියන්න පුළුවන්. දෙල්ගොඩ - පිටකොටුව 234 මාර්ගයේත් මේ වාගේම තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රවාහන ඇමැතිතුමාගේ දැඩි අවධානයට යොමු කරනවා. මම විශ්වාස කරනවා. දැන් ප්‍රවාහන අධිකාරියට නව සභාපතිවරයෙක් ඊයේ පෙරෙයිදා පත් වෙලා සිටින නිසා විධිමත්, කාර්යක්ෂම, නිලධාරීන් හරියට මෙහෙයවන බස්නාහිර පළාතේ මගී ජනතාවට කාර්යක්ෂම සේවාවක් සපයන්න පුළුවන් තත්ත්වයට මේ ප්‍රවාහන අධිකාරිය නව සභාපතිවරයා හරහා පත් කරගන්න ගරු අමාත්‍යතුමාට හැකිවේවා කියා ප්‍රාර්ථනය කරමින් මේ ඊයේ දිවයින පුවත්පතේ හෙළිදරව්ව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරන්න. මේ දිවයින පුවත්පතේ සඳහන් කරලා තිබෙනවා, බස් රථවල අංක පවා ඒ අයට දෙන්න පුළුවන් කියලා.

ඒ නිසා ප්‍රවාහන අධිකාරිය මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරලා, මේ බස් මාර්ගයේ ඒ දවසේ දුවපු ඒ බස් රථවල අංක දිවයින පුවත්පත සතුව තිබෙන නිසා, විධිමත් පරීක්ෂණයක් කරලා, සාධාරණය ඉෂ්ට කරලා මේකට දැඩි ක්‍රියාමාර්ගයක් ගන්නා හැටියට ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු සභාපතිතුමනි, දැනටත් මොහොතකට කලින් කථා කරපු මේ පොල් ගෙඩි අටේ සිද්ධිය පිළිබඳව මේ සභාවේ කථා කළ යුතු පුද්ගලයෙක් වශයෙන් මම විශ්වාස කරන්නේ, මම කථා කිරීම නිවැරදියි කියලා. එහෙම නැත්නම් මේ කථාව කථා කරන්න ඕනෑ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාත්, කිත්සිරි කහටපිටිය

ගරු මන්ත්‍රීතුමාත් තමයි. මේ සිද්ධියේ කිට්ටුම පුද්ගලයා වන කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ ගෙදර ඉඳන් ඇත්තේ මීටර් 500 ක් වාගේ දුරක්. මේ කථාව. මට කාලය දෙන්න ගරු සභාපතිතුමනි. මේ සිද්ධිය පිළිබඳව අද රටේ විශාල ආන්දෝලනයකට පත් වෙලා, පාසල් ඇතුළේ විදුහල්පතිවරු සහ ගුරුවරු විශාල කළකිරීමකට පත් වෙලා, ගරු මහ ඇමැතිතුමා වාගේ ප්‍රධාන අමාත්‍යවරයෙක් මේ සභාවේ නොසිටින්න අද මේ වන කොට පාසල් පද්ධතියම විශාල ආන්දෝලනයකට පත් වෙන සිද්ධියක් බවට පත් වන මොහොතක්. මේ සිද්ධිය මොකක්ද කියන එක පිළිබඳව දැන ගෙන මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්වත් අවම වශයෙන් මේ ගැන කථිකාවතක් පවත්වලා, සිද්ධිය මෙන්න මේ වාගේ දෙයක් කියන එක පිළිබඳව දැනුවත් කිරීමක් කරනවා නම්, පුළුල් දැනුවත් කිරීමක් කරනවා නම් එය කාලෝචිතයි කියන එකයි මම හිතන්නේ.

මම විශ්වාස කරන්නේ, ගරු සභාපතිතුමනි. මේ සිද්ධිය මෙච්චර දුර ගෙනි යන්න, මෙච්චර ප්‍රචාර මාධ්‍යයක් දෙන්න, වැරැදි දරුවෙකුට මේ වාගේ ඒ වැරැද්දට පොළඹවන ආකාරයේ ජනප්‍රිය කරන්න තවත් තැගි හෝග දෙන්න කර්තව්‍යයක් නොවෙයි මේක. ඒ වැරැදි කරපු දරුවෙක් පිළිබඳව අර ගරු මහ ඇමැතිතුමා කිව්වා වාගේ මම මේ සභාවේ කථා කරන්න ලැහැස්ති නැහැ. මොකද, දරුවෙක් නිසා. පාසල් දරුවෙක් නිසා. ඒ නිසා ඒ පැත්ත කථා නොකර මේ සිද්ධිය සිද්ධ වුණු අවස්ථාවේ ඒ අම්මා මේ සිද්ධියට සම්බන්ධ වුණු ආකාරය තමයි මේකේ මූලික හරය වුණේ. මේ පොල් වත්ත අයිති පුද්ගලයා මේ වාගේ නරක චේතනාවකින් නොවෙයි පොලීසියට පැමිණිලි කළේ. මේ දරුවාව හදා ගන්න. දිගින් දිගටම මේ ආකාරයේ ප්‍රදේශවාසීන්ට මහා හිරිහැරයක් නිසා මේ පවුල යම් මට්ටමකටවත් මට්ටු කරන්න ඕනෑ නිසා තමයි මේ සිද්ධිය පොලීසිය දක්වා අරගෙන ගියේ - පොලීසියට අරගෙන ගිහිල්ලා ඒක උසාවි දක්වා අරගෙන ගියේ ගරු සභාපතිතුමනි, ගම්වාසීන් හිතුවා උසාවියට අරගෙන ගියාම මේ ළමයාව පරිවාසයට ගෙනියන්න හරිම ලෙහෙසියි කියලා. පරිවාසයට වාර්තාවක් අරගන්න ඕනෑ නිසා තමයි මේ අය උත්සාහ වුණේ උසාවියට ගෙනියන්න. උසාවියට ගෙන ගියායින් පස්සෙයි සිද්ධිය වෙනස් වුණේ. උසාවියට ගෙන ගියාට පස්සේ ඒ උසාවියේ පෙනී හිටපු නීතිඥවරයායි මේ ප්‍රශ්නය උඩ දිවෙව්වේ. ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට නීතිඥවරයා අනුකම්පාව ගන්නත්, උපක්‍රමශීලීව දේශපාලනය පාවිච්චි කරන්නත් නඩුකාරයා ඉදිරියේ ප්‍රකාශ කළා,

*"මේ දරුවා ස්වාමීනී මේ හොරකම කළේ, මේ පාසලට සල්ලි ගෙවා ගන්නයි"*

කියන ප්‍රකාශය කළා. දරුවාට ඇප ගන්න, නැත්නම් බේරාගන්න. අන්න එතැනයි ගැටලුව. ඒ නීතිඥවරයා හොරණ ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා කියන එක මම භය නැතිව ප්‍රකාශ කරනවා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයායි මේ නීතිඥවරයා. නොමිලයේ අනුකම්පා හිතලා, නොමිලේ කථා කරපු නීතිඥවරයා ඔහු. ඔහු ඊට පස්සේ කළේ මොකක්ද? මේ මාධ්‍යවේදීන් උසාවියේ සිටියේ නැහැ. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේ අහගන්න. පත්තර වාර්තාකරුවෝ උසාවියේ සිටියේ නැහැ. අර නීතිඥවරයා උසාවියේ ඉඳන් ටෙලිෆෝන් එකෙන් කථා කරලා පත්තර වාර්තාකරුවන්ට කිව්වා, මෙන්න රුපියල් 50000/- ක දඩයක් ගැහුවා. පාසලට සල්ලි ගෙවන්න පොල් ගෙඩි අටක් හොරකම් කරපු දරුවාට කියලා. මෙන්න කථාව ගොතපු ආකාරය. මෙන්න පත්තරයට ගියපු ආකාරය. මේක තමයි මේ ආන්දෝලනයකට පත් වුණේ. මේ සිද්ධියේ පිටිපස්සේ දේශපාලනය තිබුණා. මේ සිද්ධිය අද වන කොට ගරු සභාපතිතුමනි, විශාල ආන්දෝලනයකට ගියා. මට හරිම භයක් හිතුණා. අපේ ගරු මහ ඇමැතිතුමා මොන වාගේ තීන්දුවක් අරගනියිද? මොකද මේ විද්‍යාලය අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාත්, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. අපි තුන්දෙනා මේ කොට්ඨාශයේ බොහොම අසල්වාසීන්. අපි දන්නවා. මෑත කාලයේදී බොහොම ඉක්මණින් ජනප්‍රිය වුණු පාසලක්. දෙමව්පියන් සල්ලි එකතු කරනවා. මම තාත්තා කෙනෙක්. මගේ දරුවා ඉන්න ඉස්කෝලෙට ගිහිල්ලා මම අඩුපාඩු බලනවා. පන්ති කාමරයට මම ගිහිල්ලා බලනවා. අඩුපාඩු සකස් කරනවා. හැබැයි, නීත්‍යානුකූලව තාත්තලා වුණු නැති අය තමයි මේ කථාව ඉන් එහාට ගෙනි යන්නේ. නීත්‍යානුකූලව තාත්තා වෙච්ච නැති අයට මේක ක්‍රමයක් නැහැ ගෙනි යන්න. අන්න ඒක නිසා මේ කථාවේ ඇත්ත කථාව තේරුම් ගන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මම අහනවා, පාසල් සංවර්ධන සමිතියකට යම් මුදලක් එකතු කරලා පාසලේ අඩුපාඩු ටිකක් කරන්න බැරි නම්, රෝහලට ගිහිල්ලා රෝහල් කමිටුවේ අපි කොහොමද සල්ලි එකතු කරලා රෝහලේ අඩුපාඩුකම් කරන්නේ. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා දන්නවා. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා දන්නවා. හොරණ රෝහලේ එකම වාට්ටුවයි තිබෙන්නේ රජයෙන් හදපුවා. රජයෙන් හදපු එක වාට්ටුවයි තිබෙන්නේ. අනික් ඔක්කෝම ගමේ ඉන්න දානපතියෝ, පරිත්‍යාගශීලීන් හැදුවේ. මොකද, අපේ ලෙඩාට වැඩියෙන් සලකන්න කියලාද? පගාවක්ද ගැහුවේ? නැහැ. අපි රෝහලට ගිහිල්ලා රෝහල් කමිටුවේ අපි එකතුවෙලා අපි කරපු දේවල් අනන්තයි, අප්‍රමාණයි. ඒ විතරක් නොවෙයි. පන්සලේ දායක සභාව එකතු වෙලා අපි සල්ලි එකතු කරනවා. එකතු කරලා තාප්පේ බඳිනවා. තීන්ත ගානවා. අනික් අඩුපාඩුකම් කරනවා. මේවා පන්සලේ හාමුදුරුවන්ට වැඩි පුර බණ කියන්න කියලා පගාවක් ගහනවාද? නැහැ. මේවයි පවතින්නේ. මහජන ආයතන. ඒක නොවෙයි. අද යම් කොටසකට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අද ගැටලුවක් වෙලා තිබෙනවා. අද පාසල් පද්ධතිය ඉතිහාසයේ නැති විධියට ලස්සන වෙලා තිබෙනවා. අලංකාර වෙලා තිබෙනවා. ඉතිහාසයේ නැති විධියට. තමුන්නාන්සේලා තේරුම් ගන්න ඕනෑ. දරුවෝ පුදුමාකාර තරම් ආසාවෙන් දැන් පාසලට එන්නේ. පන්ති කාමරයකට ගියාම පුදුමාකාර ආසයි.

පුදුමාකාර අලංකාරයි. අවශ්‍ය කරන ආකාරයේ සියලුම දේවල් පන්ති කාමර ඇතුළේ සකස් කරලා තිබෙනවා. දෙමව්පියන් කරලා තිබෙන්නේ. ගරු මහ ඇමැතිතුමා, සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ මේ පාසල්වලට ඕනෑ දේවල් කරන්න, අලංකාර කරන්න පොඩි හයියක් දුන්නා. ලක්ෂ 01 1/2 ක මුදලක්. මේ ලක්ෂ 01 1/2 ක මුදලෙන් තට්ටු හතර පහේ Building වල පලංචි බැඳලා අපට පුළුවන්ද මේක කරන්න. බැහැ. දොස්තර

[ ගරු යසපාල කෝරළගේ ]

මහත්මයෙක් ඉන්නවා. දොස්තර මහත්මයා පන්ති කාමරයේ පන්ති කවයට ඇවිල්ලා කියනවා, අනේ මහත්මයෝ ඔයගොල්ලෝ කියන ගණනක් මම දෙන්නම්. මගේ Channel එක පරක්කු වෙනවා. මට රෝගීන්ව බලන්න ඕනෑ. ඒක නිසා මම තාත්තා තමයි. මගේ කොටස කියන්න. මම දෙන්නම්. එහෙම තමයි මේවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නලින්ද නොවෙයි නේ?

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

නලින්ද නොවෙයි. එහෙම තමයි මේවා කළේ. මෙන්න මේ වැඩ සටහන් තුළ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

අද විශාල සංවර්ධනයක්, විශාල ප්‍රගතියක් වෙලා තිබෙනවා, මේ වැඩ සටහන යටතේ. ඒක නිසා මම මීට වඩා කථා කරන්නේ නැහැ. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මාධ්‍ය තුළින් කථා කරනවා මම අහගෙන සිටියා. මේ පිළිබඳව බොහොම වෙනත් පැත්තකින් කථා කළා. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා නීත්‍යානුකූල තාත්තා කෙනෙක් කියන එක මම විශ්වාස කරමින්, අපේ ඉන්න සියලුම තාත්තාලා මේ කර්තව්‍ය කරන්න අපි මැදිහත් වෙලා ඉන්නවා. ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් ඉල්ලනවා. මේ කථාව මාධ්‍ය කථිකාවතක් කරලා - තමුන්නාන්සේලාත් එක්ක අපි කථා කරන්න ලැහැස්තියි. මාධ්‍යයට කථා කරන්න අපි ලැහැස්තියි. කථිකාවතක් කරලා මේක විදුහල්පතිවරුන්ගේ හෝ ගුරුවරුන්ගේ හෝ ආත්ම ශක්තිය ඉදිරියට ගෙනියන්න, ඊට එහාට ගෙනියන්න අවස්ථාව ලබා දෙන්න කියන කාරුණික ඉල්ලීම කරමින්, ගරු මහ ඇමැතිතුමා මේ සඳහා පෙනී සිටිය ආකාරය පිළිබඳව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශංසාව සහ විදුහල්පතිවරුන්ගේ ප්‍රශංසාව පළ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.20 ට යළිත් රැස්විය.***
*Sitting, accordingly suspened untill 11.20 a.m. and then resumed.*

# ශෝක ප්‍රකාශ යෝජනාව : I
# ගරු සුසිල් මුණසිංහ මැතිතුමා :
# හිටපු ගරු ප්‍රථම ප්‍රධාන අමාත්‍යතුමා
## MOTION EXPRESSING CONDOLENCES : I
## HON. SUSIL MUNASINGHE, MEMBER:
## FORMER HON. FIRST CHIEF MINISTER

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට හා දෙවන පළාත් සභාවට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වී බස්නාහිර පළාතේ ප්‍රථම ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් වසර පහක පමණ කාලයක්ද බස්නාහිර පළාතේ පළාත් සභාවේ විපක්ෂ නායක වශයෙන් වසරකට අධික කාලයක්ද බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, ගරු සුසිල් මුණසිංහ මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."* කියන යෝජනාව මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

වර්ෂ 1930 පෙබරවාරි මස 11 වන දින පියදාස මුණසිංහ මැතිතුමාට සහ සීතා මුණසිංහ මැතිනියට දාව කොළඹදී උපත ලැබූ සුසිල් මුණසිංහ මැතිතුමා සහෝදර සහෝදරියන් දෙදෙනෙකුගේ පවුලේ දෙවැන්නා විය. එතුමා කොළඹ රාජකීය විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා 1949 දී කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුළත් වී නීතිවේදී උපාධි පාඨමාලාව හදාරන ලද අතර ඉන් අනතුරුව එතුමාගේ පවුලේ ව්‍යාපාරයක් වූ දොන් කරෝලිස් සහ පුත්‍ර සමාගමේ විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් කලක් සේවය කළ අයෙකි. සුසිල් මුණසිංහ මැතිතුමා 1976 වර්ෂයේදී ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ක්‍රියාකාරී දේශපාලනයට එක් වූ මහත්මයෙක් වන අතර එතුමා 1970 වසරේ සමගි පෙරමුණ රජය බලයට පත්වීමෙන් පසු ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයා හැටියට වසර කීපයක් කටයුතු කිරීමට එතුමාට අවස්ථාව ලැබුණා. ඒ වාගේම එතුමා බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලාව ගොඩනහපු අවස්ථාවේ එහි

පරිපාලන ලේකම්වරයා හැටියට කලක් කටයුතු කරපු හොඳ මහත්මයෙක් කියන එකත් මම මේ වේලාවේ ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම ශ්‍රී ලංකාවේ පවත්වපු නොබැඳි ජාතීන්ගේ සම්මේලනය අවස්ථාවේදී එතුමා නොබැඳි ජාතීන්ගේ සම්මේලනයේ සම්බන්ධීකරණ කටයුතු භාර ලේකම්වරයා වශයෙන් මේ රටට මහත් කීර්තියක් අත් කර දීමට කටයුතු කළ දේශපාලන නායකයෙක් කියන එකත් මේ සභාවේදී මතක් කරන්නට ඕනෑ.

ඉන් පසුව එතුමා 1979 වර්ෂයේදී හිටපු ජනාධිපති ගරු ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආරාධනයෙන් එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙනවා, එක්සත් ජාතික පක්ෂයේ පූර්ණකාලීන ක්‍රියාකාරිකයෙක් හැටියට. ඒ එක්කම එතුමා එක්සත් ජාතික පක්ෂයේ විවිධ තනතුරු දරමින් ඒ පක්ෂයේ කටයුතු කරමින් සිටින අතරතුර තමයි 1988 වර්ෂයේදී හෝමාගම පාර්ලිමේන්තු අතුරු මැතිවරණය සඳහා නාමයෝජනා ලබා ගන්නේ. ඒ වේලාවේ හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා හැටියට සුසිල් මුණසිංහ මැතිතුමා ඉදිරිපත් වෙනවා. ඒ ඉදිරිපත් වුණත් එවකට රටේ පැවැතුණු අයහපත් තත්ත්වය තුළත්, මම හරියටම කියන්න දන්නේ නැහැ. නමුත් නීතිමය තත්ත්වයක් තුළත් ඒ මැතිවරණය පැවැත්වෙන්නේ නැහැ. ඉන් පසුව ඒ මැතිවරණය අහෝසිවීමත් එක්ක ගරු සභාපතිතුමනි, සුසිල් මුණසිංහ මැතිතුමා 1989 දී බස්නාහිර පළාත් සභාවට තරග කරන්නට තීන්දු කරනවා. ඒ 1988 මැතිවරණයෙන් පස්සේ බස්නාහිර පළාත් සභාවේ - පෞද්ගලිකව මම දන්න දෙයක් තමයි. එතුමාට එවකට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ආරාධනා කළේ බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරකම භාර ගන්න කියලා. මොකද, පළාත් සභා ක්‍රමය ගැන එපමණ අවබෝධයක්, දැනීමක් රටේ නායකයින්ටත්, රටේ ජනතාවටත් තිබුණේ නැහැ. නමුත් සුසිල් මුණසිංහ මැතිතුමා එවලේ තීන්දු කළේ, ඒ ආරාධනය කළාම, මම භාර ගන්නවා නම් භාර ගන්නේ, මහ ඇමැතිකම කියලා. ඒ අනුව තමයි එතුමා ප්‍රධාන අපේක්ෂකයා හැටියට එක්සත් ජාතික පක්ෂයෙන් 1989 දී බස්නාහිර පළාත් සභාවට තරග කරන්න ඉදිරිපත් වෙන්නේ. 1989 පවත්වපු පළාත් සභා මැතිවරණයේදී එතුමා මනාප ඡන්ද 52,232 ක් ලබා ගනිමින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රථම පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හැටියට තේරී පත් වෙනවා. ඉන් පසුව එතුමාට විශාල වැඩ කොටසක් පැවරෙනවා.

ගරු සභාපතිතුමනි, අද අපි කථා කරන මේ පළාත් සභාව නිර්මාණය කරන්න මුල් වුණු ප්‍රධාන කෙනා හැටියට මම දකින්නේ සුසිල් මුණසිංහ ඇමැතිතුමා. ඒක එක්සත් ජාතික පක්ෂ රජය නිර්මාණය කළත්, එහි අඩුපාඩුකම් රාශියක් තිබුණා. ඒ නිසා සුසිල් මුණසිංහ මැතිතුමා තමයි මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට සියල්ල ටික ටික හදාගෙන, එක පැත්තකින් දැඩි භීෂණයක් තිබුණා. පළාත් සභාවේ මන්ත්‍රීවරු ඝාතනය කරනවා. අනික් පැත්තෙන් පළාත් සභාව පවත්වන්න ස්ථානයක් තිබුණේ නැහැ. අනික් පැත්තෙන් පළාත් සභාවේ අණපනත් සම්මත වෙලා තිබුණේ නැහැ. එහෙම තිබුණු වේලාවක සුසිල් මුණසිංහ මහ ඇමැතිතුමා මේ පළාත් සභාවේ අඛණ්ඩව වසර පහක් මහ ඇමැති හැටියට විශාල සේවයක් කළා. අපි දන්නවා, සමහර අවස්ථාවල එතුමා අපිත් එක්කත් වසර කිහිපයක් කටයුතු කළා. ඒ කාලසීමාව තුළ එතුමා කියලා තිබුණා, අද ඉන්න අයට ඒක ආදර්ශයක්. එතුමා සමහරවිට පනතක් සම්මත කරන්න දවසයි ගන්නේ. මම හිතන්නේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා එකඟ වෙයි. එතුමාත් එක්ක හිටපු එකම මන්ත්‍රීවරයා මේ සභාවේ ඉන්න. අද පනත කෙටුම්පත් කරලා හෙට සභාවට දාලා පනත සම්මත කරලා ඊට පහුවෙනිදා ඒක ක්‍රියාත්මක කරන්න එතුමා කටයුතු කරනවා. ඒ නිසා දවසකින් දෙකකින් පනතක් සම්මත කරලා - අත්‍යවශ්‍ය පනත්. විශේෂයෙන් ප්‍රවාහන අධිකාරියේ වාගේ පනත්වලදී එතුමා දැඩි කැප කිරීමක් කරලා දවසින් දෙකෙන් ඒ පනත සම්මත කරලා - පනත් කිහිපයක් එහෙම කළා. මොකද, පළාත් සභාවේ පැවැත්ම සඳහා තමයි එතුමා ඒක කළේ. ඒක විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. පොඩි පොඩි අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. නමුත් ඒ පනත් සම්මත වුණේ ඒ ආකාරයෙන් කියන එක මතක් කරන්න ඕනෑ.

ඉන් පසුව 1993 පවත්වපු පළාත් සභා මැතිවරණයේදී සුසිල් මුණසිංහ මහ ඇමැතිතුමා එක්සත් ජාතික පක්ෂයෙන් මහ ඇමැති අපේක්ෂකයා හැටියට තරග කළා. ඒ මැතිවරණය එක්සත් ජාතික පක්ෂය පරාජය වීමත් සමඟ සුසිල් මුණසිංහ මහ ඇමැතිතුමා පළාත් සභා විපක්ෂ නායකවරයා හැටියට පත් වුණා. එතුමා විපක්ෂ නායකවරයා හැටියට පළාත් සභාවේ අවුරුද්දක පමණ කාලයක් කටයුතු කරලා 1994 දෙසැම්බර් මාසයේ පවත්වපු පාර්ලිමේන්තු මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයට තරග කරලා, එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතුමා 1993 ඉඳලා 1999 දක්වා අවුරුදු 06 ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කටයුතු කළයි කියන එකත් මේ සභාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම එතුමා 1999 පාර්ලිමේන්තුවෙන් ඉවත් වීමත් එක්ක යළිත් එතුමා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට ආධාර උපකාර කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකතු වෙනවා. එසේ එකතු වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කටයුතුවලට එතුමා සැබෑ නායකයෙක් හැටියට සම්බන්ධ වෙමින් එතුමා යළිත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගන්නවා. ඉන් පසුව 2000 වර්ෂයේදී එතුමාව ඉරානයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් පත් කරනවා. ඉන් පසුව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක සම්බන්ධ වෙලා මේ රටේ දේශපාලන ව්‍යාපාරයට එතුමා සම්බන්ධ වෙනවා. ඉන් පසුව 2008 වර්ෂයේදී අපි ආරම්භ කරපු රාජ්‍ය වාණිජ සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ ගරු සභාපති හැටියට සුසිල් මුණසිංහ මැතිතුමා පත් වෙනවා. 2008 ඉඳලා 2010 දක්වා එතුමා සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සභාපති හැටියට කටයුතු කරනවා. ඉන් පසුව එතුමා

කලක් රෝගීව ඉන්නවා. රෝගීව ඉඳලා තමයි එතුමා කටයුතු කරන්නේ.

මම විශේෂයෙන් මේ වේලාවේ මතක් කරන්න ඕනෑ. හෙක්ටර් බෙත්මගේ හිටපු ගරු ඇමැතිතුමා. ගාමිණී තිලකසිරි හිටපු ගරු ඇමැතිතුමා. ඒ වාගේම මේ සභාවේ පළාත් පාලන ආයතන නියෝජනය කරපු විශාල පිරිසක් ඉන්නවා. අපට මතකයි එවකට එක්සත් ජාතික පක්ෂයේ මහ ඇමැතිතුමා හැටියට සුසිල් මුණසිංහ මැතිතුමා කටයුතු කරන කාලයේ එතුමා නිරන්තරයෙන්ම පළාත්

[ ගරු සුනිල් ජයමිණී - සභානායකතුමා ]

පාලන ආයතනවල සභාපතිවරු, උප සභාපතිවරු කැඳවලා රැස්වීම් පවත්වලා ඒ අඩුපාඩු ගැන සාකච්ඡා කරනවා. ඉතාම පිරිසිදු සුදු ඇඳලා, Clean man කෙනෙක් හැටියට තමයි අපි නිතරම එතුමාව දකින්නේ. මොකද, කිසි කෙනෙක් රස්තියාදු කරන්නේ නැති, වැඩියෙන් කථා නොකරන, හැබැයි කථා කරපු දේ ක්‍රියාත්මක කරන ඉතාමත්ම දක්ෂ නායකයෙක් හැටියට සුසිල් මුණසිංහ මැතිතුමා කටයුතු කළයි කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම පළාත් පාලන ආයතන ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියන තර්කය එතුමා තුළ තිබුණේ නැහැ. එතුමා තුළ තිබුණු තර්කය තමයි පත්වෙන අය වැඩ කරන්න ඕනෑය කියන එක. ඒ නිසා බස්නාහිර පළාත් සභාව නිදහස් චතුරශ්‍රයේ කාර්යාලය තිබෙන කාලයේ එතුමා ඒ කාර්යාලයට කැඳවලා, අපට මතකයි ඉතාම හොඳින් සියලු දෙනාත් එක්ක කටයුතු කළයි කියන එකත් මම මේ සභාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම විපක්ෂ නායකවරයෙක් හැටියට ඉන්න කාලයේත්, වසරක පමණ කාලයක් අපත් එක්ක එතුමා මේ පළාත් සභාවේ කටයුතු කළා. ඒ කාලයේත් එතුමා බොහොම නිරහංකාර මනුස්සයෙක් හැටියට කටයුතු කළයි කියන එකත් මතක් කරන්න ඕනෑ. එතුමා මේ පළාත් සභාවට අතිවිශාල සේවයක් කරපු හිටපු මහ ඇමැතිවරයෙක්.

මම විශේෂයෙන් මේ වේලාවේ එක කාරණයක් සිහිපත් කරනවා. පළාත් සභා ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා අපි පළාත් සභාවේ 2010 ජූනි මාසයේ යම් උත්සවයක් පැවැත් වූවා. ඒ වේලාවේ එතුමාගෙන් අපේ පළාත් සභාවේ ලේකම්තුමා ප්‍රකාශයක් ලබා ගත්තා, ඒ පළාත් සභා පොතට ඇතුළත් කරන්න. මම මේ වේලාවේ ඒක සඳහන් කරනවා. පළාත් සභා ක්‍රමය පිළිබඳව ඉතා වැදගත් ප්‍රකාශයක් නිසා. එතුමා පළාත් සභාවෙන් ඉවත් වෙලා, නිදහසේ ඉන්න වේලාවේ මෙන්න මේ වාගේ අදහසක් ඉදිරිපත් කරනවා.

*"මෙම ක්‍රමය ස්ථාපිත කර ආරම්භයේදී මතුවූ බාධක ජය ගෙන ඉදිරියට ගෙන යෑම සඳහා මා තරම් කාලය, ශ්‍රමය පමණක් නොව, විශේෂයෙන්ම පෞද්ගලික ධනය කැප කළ කිසිවෙකුත් මේ රටේ ඇතැයි මා විශ්වාස නොකරමි. ඒ කිසිදු පෞද්ගලික ලාභ ප්‍රයෝජනයක් සඳහා නොවන බව ඉඳුරාම කිව යුතුය. පළාත් සභා ක්‍රමය ස්ථාපිත කර ඒ හරහා මේ රටේ ජනතාවට, යම් සේවාවක් කිරීමට මගේ සිතේ, මටත් නොදැනීම ඒ තරමම උනන්දුවක් හා කැපවීමක් ඇති වී තිබුණි. ඒ පන්නරය තුළින් මා හට කළ හැකි උපරිම දේ, උපරිම අයුරින් මනා කැප වීමකින් හා අවංකවම ඉටු කළෙමි. විසි දෙවසරක් ගෙවුනු තැන අද වන විට පළාත් සභා යම් ප්‍රගතියක් ලබා තිබේද, ඒ හරහා මේ රටට, ජනතාවට සේවාවක් සිදු වන්නේද, එසේ නම් එයින් වඩාත්ම තෘප්තියට පත්වන පුද්ගලයින් අතර ඉදිරියෙන් සිටින්නා මා බව පෞද්ගලිකවම මා දනිමි. "*

බස්නාහිර පළාත් සභාවට වසර විසි දෙකක් සපිරුණු අවස්ථාවේ ලියපු පොතට එතුමා දීපු ලිපියෙන් කොටසක්. ඒ නිසා පළාත් සභා ක්‍රමයට අති දැවැන්ත සේවයක් කරපු සුසිල් මුණසිංහ මැතිතුමා නොබෝදා අප අතරින් වියෝ වුණා. එතුමා පිළිබඳව මෙම අවස්ථාවේ යළිත් වරක් බස්නාහිර පළාත් සභාවේ සංවේගය, කනගාටුව ප්‍රකාශ කරමින් අපි බෞද්ධයන් හැටියට එතුමාට ශාන්ත අමා මහ නිර්වාණ සම්පත්තිය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ සභා නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද ශෝක යෝජනාව පිළිබඳව දීර්ඝ කථාවක් නොකළත් මනුස්සයෙක් හැටියට එතුමාගේ ජීවිත කාලය තුළ අපි එතුමාව දැන හැඳිනගෙන සිටියේ දේශපාලන කාලය තුළ දී පමණයි. එතුමාගේ පෞද්ගලික ජීවිත, ඒ වාගේම එතුමාගේ බාහිර ලෝකය පිළිබඳව අපි එතුමා ගැන කිසි දෙයක් නොදන්නා වුණත් 1993 දී බස්නාහිර පළාත් සභාවේ දේශපාලනයට සම්බන්ධ වුණු වේලාවේ එතුමාව දැන හැඳිනගෙන කටයුතු කරන්න අපට පුළුවන්කම ලැබුණා. පළාත් සභා ඉතිහාසයේ පළමුවැනි ප්‍රධාන අමාත්‍යවරයා හැටියට ඒ කාලය තුළ ඒ පළාත් සභාවට විශාල සේවයක් කළා. යම් යම් ප්‍රශ්න ගැටලු, පක්ෂ අතර පැන නැඟුණු සෑම අවස්ථාවකම එතුමා බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට විශාල කැපවීමකින් සියලුම පක්ෂවල නියෝජිතයින්ගේ සහයෝගය ලබාගෙන බොහොම හිතවත්කමින්, පක්ෂ පාට භේදයකින් තොරව එතුමා විශාල සේවාවක් කරපු බව දේශපාලනය කරන කෙනෙක් හැටියට අපි හොඳින් දැනගෙන සිටියා. 1991 මට මතක් වෙනවා. මම කැස්බෑව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට එදා පත් වෙනකොට මේ රටේ ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා. එක්සත් ජාතික පක්ෂ රජයක්. පළාත් සභාව එක්සත් ජාතික පක්ෂයේ සුසිල් මුණසිංහගේ පාලන කාලයයි. අපි 1991 දී කැස්බෑව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කරද්දී මට මතකයි, මම එදා සභාපතිවරයා හැටියට ඉන්න කාලයේ අපේ සුනිල් ජයමිණී ගරු සභා නායකතුමා උප සභාපති හැටියට එදා කැස්බෑව ප්‍රාදේශීය සභාවේ අපි වැඩ කටයුතු කළා. එතුමා පළාත් පාලන ආයතනවලට බොහොම හොඳ ගෞරවයක් දක්වපු කෙනෙක්. පළාත් පාලන ආයතන නඟා සිටුවන්නට

එතුමා විශාල වැඩ කොටසක් කරපු කෙනෙක්. මට මතකයි එදා එක වර්ෂයකට එක සැරයක් සෑම පළාත් පාලන ආයතනයකටම ගිහිල්ලා ඒ පළාත් පාලන ආයතනවල තිබෙන අඩුපාඩු සොයා බලලා ඒවාට කඩිනම් විසඳුම් ලබා දීමට එතුමා කටයුතු කරපු පුද්ගලයෙක්. මට අද වාගේ මතකයි. එදා කැස්බෑව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට මම එතුමා සභාවට ආවාම මම මූලාසනයෙන් නැගිටලා එතුමාට කිව්වා, මේ පුටුවේ වාඩි වෙන්න කියලා. එතුමා ඒක ප්‍රතික්ෂේප කළා. නැහැ. සභාපතිතුමා ඔහොම ඉන්න. මම මෙහෙත් ඉන්නම්. එතුමා සෑම අවුරුද්දකම පළාත් පාලන ආයතනවලට ගිහිල්ලා මහජන නියෝජිතයන් මුණ ගැහිලා පළාත් පාලන ආයතනවල තිබුණු අඩුපාඩුකම්වලට එතුමා විශාල දායකත්වයක් ලබා දුන්නා. මට මතකයි. අපට එදා පළාත් පාලන ආයතනවලට වාහනයක් ලබා දුන්නේ එතුමාගේ කාලයේ. අපේ ප්‍රධාන අමාත්‍යතුමා බස්නාහිර පළාතේ සෑම පළාත් පාලන ආයතනයකටමත්, කලාප කාර්යාලවලටත් වාහන ලබා දෙන උත්සවය වෙලාවේ පැත්තක ඉඳගෙන මම ඕක මතක් කළා. ඒක මුල් ආරම්භය. එදා ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ මේ වාහන ලබා දුන්නේ අපේ සුසිල් මුණසිංහ ඇමතිතුමා කියලා. ඒ නිසා පළාත් පාලන ආයතනවලට විශාල ගෞරවයක්, ආදරයක් දක්වපු නායකයෙක්. පළාත් සභා කාලය තුළ, එතුමාගේ ප්‍රධාන අමාත්‍ය ධූර කාලය තුළ එතුමා විශාල වැඩ කොටසක් පළාත් සභාවට ඉෂ්ට කළා කියන එක සඳහන් කරන්න ඕනෑ.

ඉන් අනතුරුව, 1993 තමයි පළාත් සභාවට අපි ප්‍රථම වතාවට පැමිණියේ. අපේ පක්ෂය ඉදිරිපත් නොවුණු නිසා. 1993 පළාත් සභා මැතිවරණයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය මේ රටේ ප්‍රධාන අමාත්‍ය ධූරයට පත් වෙලා එදා පළාත් සභාවට ආපු ප්‍රථම දවසේ සුසිල් මුණසිංහ මැතිතුමා ඉතාමත්ම ආදරයෙන් ගෞරවයෙන් එතුමිය පිළි අරගෙන එතුමියත් සමග දීර්ඝ කාලයක් පළාත් සභාවේ විපක්ෂ නායකයෙක් හැටියට වැඩ කටයුතු කළා. එතුමා යම් යම් පක්ෂ වෙනස්වීම් කළත්, දේශපාලනඥයෙක් හැටියට හොඳ මනුස්ස හදවතක් තිබුණු පුද්ගලයෙක් කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඊර්ෂ්‍යාවක්, කුහකකමක්, මිනිහෙකුට ගැහිල්ලක්, මඩ ගැහිලි ඒවා කිසිම දෙයක් එතුමා තුළ තිබුණේ නැහැ. එතුමා අවංක නිහතමානී හොඳ ගෞරවණීය දේශපාලනඥයෙක් හැටියට එතුමාගේ කාලසීමාව තුළ එතුමා වැඩ කළයි කියන එක මම වෙනත් පක්ෂයක හිටියත් මම ඒ ප්‍රකාශය කළ යුතුයි. ඒ නිසා මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. ගරු සභානායකතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ ජීවිත කාලය තුළ ඉතා විශාල විස්තරයක් එතුමා විසින් සඳහන් කළා. අපි විශ්වාස කරනවා අපිත් සමග දීර්ඝ කාලයක් දේශපාලන කටයුතුවල නිරත වුණු පුද්ගලයෙක් හැටියට එතුමා අප අතරින් වෙන් වෙලා කාලයක් වෙනවා. අපේ ආගමානුකූලව එතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේ රත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බස්නාහිර පළාතේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍ය සහ හිටපු ගරු විපක්ෂ නායක, සුසිල් මුණසිංහ මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාවේදී මටත් කරුණු කිහිපයක් සැළ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා.

දිවංගත සුසිල් මුණසිංහ මැතිතුමා පිළිබඳව ගරු සභානායක සුනිල් ජයමිණි මැතිතුමා ඉදිරිපත් කළ කරුණු පිළිබඳව සළකා බලන කොට ඒවා සියල්ලම සම්පිණ්ඩනය කළාම අවසානයට එන උත්තරය තමයි, සුසිල් මුණසිංහ මැතිතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සැබෑ දේශපාලනඥයෙක් කියන කාරණාව. සුසිල් මුණසිංහ මැතිතුමාගේ පරිණත දේශපාලනය තුළ මේ කථා කරන මමත්, ඒ වාගේම මේ සභාවේ සිටින තවත් විශාල පිරිසක් දේශපාලන වශයෙන් පරිණත වුණයි කියන කාරණාව ප්‍රකාශ කරන්නේ, එතුමාට කරන ගෞරවයක් හැටියට. ඊට නිදර්ශන ගෙන හැර පානවා නම්, එදා 1991 කඩුවෙල ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සභාපතිවරයා වුණු මට, ප්‍රධාන අමාත්‍ය සුසිල් මුණසිංහ මැතිතුමාව ආශ්‍රය නිශ්‍රය කරන්න ලැබුණා. සාමාන්‍යයෙන් එවකට අපේ මනසේ ඇඳිලා තිබුණේ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ මහ අමාත්‍යවරයෙක් නිසා, ඉතාමත්ම බලපරාක්‍රමයෙන් යුක්ත, අයෝමය දේශපාලන ශක්තියක් ඇගේ තියාගෙන අනුන්ගේ දේශපාලන ධර්මයන්ට ගරු නොකරන මහාමාත්‍යවරයෙක් හැටියටයි. එහෙම තමයි අපේ සිතේ චිත්‍රය ඇඳිලා තිබුණේ. මොකද, ඒ අවධිය එක්සත් ජාතික පක්ෂයේ බලවත් ආණ්ඩුවක් නිසා. නමුත් කඩුවෙල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට, ප්‍රධාන අමාත්‍ය සුසිල් මුණසිංහ මැතිතුමාත් එක්ක යම් යම් සාකච්ඡාවලට ගියාම එතුමාගේ තියෙන පරිණත භාවය. ඒ වාගේම එතුමාගේ පරිචය. එතුමාගේ තියෙන කරුණාව. ලෙන්ගතුකම යන මේවා තුළ සැබවින්ම එතුමාට ඉතාමත්ම සමීප වුණා. අපි මත දෙකක, ප්‍රතිපත්ති දෙකක හිටියත් පක්ෂ දේශපාලනය තුළ අප එතුමාගේ ආදරයට, ගෞරවයට පාත්‍ර වුණා විතරක් නොවෙයි. අපි ඒක එතුමාගෙන් ලැබුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි එදා එතුමා ළඟට ගියාම එතුමා කවදාවත් අපේ පක්ෂය දිහා බැලුවේ නැහැ. අපි විපක්ෂයේ පළාත් පාලන සභාපතිවරුන් නේද කියලා බැලුවේ නැහැ. අපට හැම වේලේම රැකවරණය දුන්නා. නිදර්ශනයක් හැටියට කියනවා නම්, එදා කඩුවෙල බල ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයකු යටතේ තමයි කඩුවෙල ප්‍රාදේශීය සභාව අපට පාලනය කරන්න පුළුවන් වුණේ. සාමාන්‍යයෙන් මේ පක්ෂ දේශපාලනය තුළ ඔබතුමියත් දන්නවා ඇති. සාමාන්‍යයෙන් අනෙක් පාර්ශවයට දැනෙන්න හෝ නොදැනෙන්න කෙනෙහිළිකම් කෙරෙනවා. එදා මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ඉන්න කොට තලංගම පොලීසියෙන් ඇවිල්ලා, අපේ ප්‍රාදේශීය සභාවේ තිබුණු ලිපිගොනු

[ ගරු හෙක්ටර් බෙත්මගේ ]

සියල්ලම තලංගම පොලීසියට අරගෙන ගියා. ඒ කරුණු සියල්ලම නීතිවිරෝධී, සදාචාර සම්පන්න විරෝධී ක්‍රියාවලියක්. නමුත් එදා දේශපාලනය එහෙමයි වුණේ. මම ඇවිල්ලා සුසිල් මුණසිංහ මැතිතුමා හමු වෙලා මේ පිළිබඳව කිව්වා. මහ ඇමතිතුමනි, මෙන්න මේ වාගේ දෙයක් වුණා. මේක වුණේ ඔබතුමා නියෝජනය කරන දේශපාලන පක්ෂයේ දේශපාලන අධිකාරිය තුළින් කියලා කිව්වාම එතුමා විශාල කම්පනයට පත් වුණා. ඒ වාගේම එතුමා පශ්චාත්තාප වුණා. එතුමා මහාමාත්‍යවරයා හැටියට එතුමාගේ බලය පාවිච්චි කරලා ඒ ලිපිගොනු සියල්ලම යළිත් වරක් අපට ලබා දුන්නා විතරක් නොවෙයි. පියෙකු හැටියට මට අවවාද අනුශාසනා දුන්නා ඉවසීමෙන් කටයුතු කරන්නයි කියලා. එදා මම ඉවසීමෙන් කටයුතු නොකළා නම්, ඉක්මන් වුණා නම් එදා තමයි මම දේශපාලන ජීවිතයෙන් අයින් වෙන්නේ. මොකද, ඉක්මන් තීරණ අරගෙන. අන්න ඒ වාගේ ඉතාමත්ම කරුණාවන්ත මනුස්සයෙක් කියන කාරණාව මේ අවස්ථාවේදී මතක් කරන්නේ එතුමාට ගරු කිරීමක් හැටියට.

ඒ වාගේම එතුමාට අපි යම් දෙයක් අභියෝගාත්මකව කිව්වොත් එතුමා ඒක සිනාමුසු මුහුණින් තමයි පිළිගන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒකට නිදර්ශනයක් කියනවා නම්. 1991 අපි සභාපතිවරුන් හැටියට පත් වෙලා අවුරුදු දෙකයි අපේ කාලය තිබුණේ. 1993 දී පළාත් සභා මැතිවරණය ආවා. ඒ පළාත් සභා මැතිවරණයේදී සුසිල් මුණසිංහ මහාමාත්‍යතුමා දන්නවා, එතුමාට දැන් ඉල්ලා අස්වෙන්න වෙනවයි කියලා. එතුමා සියල්ලෝම කැඳෙව්වා. මම හිතනවා. මෙතැන ඉන්නවා සිරිකමල් මැතිතුමා. එතුමාත් වත්තල සභාපති. අපිව සියල්ලම කැඳවලා එතුමාගේ අස්වීම පිළිබඳව ඒ කියන්නේ, විසුරුවා හරිනවා. මට අස්වෙන්න වෙනවයි කියන කාරණාව පිළිබඳව අපි සියල්ලම දැනුවත් කරන අවස්ථාවේදී එතුමාගේ අස්වීම පිළිබඳව හැම කෙනෙක්ම දුක් වෙමින් කථා කළේ. එතුමා පිළිබඳව ඉතාම ගෞරවයෙන් කථා කළේ. එවකට හිටපු පළාත් පාලනයේ ජ්‍යෙෂ්ඨයෙක් හැටියට මටත් ආරාධනාවක් කළා. මම ඒ අවස්ථාවේදී එතුමා ගැන ගුණ කථනයක් කරලා, මම එතුමාට කිව්වා. හැබැයි, ඔබතුමා තරහ වෙන්න එපා. ඔබතුමා දේශපාලනයේ ඉන්න ඕනෑ. හැබැයි, කවදාවත් ඔබතුමා බස්නාහිර පළාතේ මහ ඇමති වෙනවාට මම කැමති නැහැයි කියලා. මොකද, එහෙම කියන්න වුණේ? අපි පළාත් සභාව හැටියට බලය අල්ලන්න ප්‍රවිෂ්ට වෙන අවස්ථාව ඒ අවස්ථාවේදි එතුමාට අනෙක් සියලුම ගුණකථන කරලා ඔබතුමා යළිත් වරක් මහ ඇමති වෙන්න කියලා ප්‍රාර්ථනා කරන්න බැහැ. ඒ නිසා මම ඒක නිර්භයවම කිව්වාම, එතුමා මට ප්‍රශංසා මුඛයෙන් කථා කරලා කිව්වා. ඒක ඔබේ බලාපොරොත්තුව. ඒක තමයි සැබෑ දේශපාලනඥයෙකුගේ බලාපොරොත්තුව. ඔබ ප්‍රාර්ථනා කළා වාගේම, මමත් ප්‍රාර්ථනා කරනවා ඔබටත් හොඳ දේශපාලනඥයෙක් වෙන්න කියලා. මම මේ කාරණා කිව්වේ, අන්න එවැනි ඉතාමත්ම මහත්මා ගුණ තියෙන ඉතාමත්ම ශ්‍රේෂ්ට පද්ගලයෙක් කියන කාරණාව මතයි.

ඒ වාගේම අපි පළාත් සභාවේ බලය අල්ලලා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මහ ඇමති වුණු අවස්ථාවේදී එතුමා හිටියේ විපක්ෂ නායක හැටියට. දේශපාලන වශයෙන් ඒ කාලපරාසය ඉතාමත්ම අවබෝධාත්මක කාල පරාසයක්. අපි ආණ්ඩු පක්ෂය හැටියට පළාත් සභාවේ ක්‍රියාදාමය පිළිබඳව කොයි තීන්දුවද ගත්තේ. ඊට පක්ෂව කථා කළා. මම මේ දේ කිව්වේ, දැන් සාමාන්‍ය සම්ප්‍රදායක් තියෙනවා. ආණ්ඩු පක්ෂයෙන් කොයි දේ ද ගේන්නේ, විපක්ෂය විරුද්ධ වෙන සම්ප්‍රදායක් තමයි තියෙන්නේ. නමුත් එදා සුසිල් මුණසිංහ විපක්ෂ නායකතුමා ආණ්ඩු පක්ෂයෙන් කොයි දේද සර්ව සාධාරණව ගේන්නේ, ඒ පිළිබඳව එතුමා කථා කළා. ඒ වාගේම විපක්ෂයේම ඇතැම් මන්ත්‍රීවරු සදාචාර විරෝධී යම් යෝජනා ගේනවා නම්, යම් කිසි කරුණු කථා කළා නම්, එතුමා විපක්ෂයේ නායකවරයා හැටියට එතුමා නැගිටලා ඒ පිළිබඳව අනුමැතිය දුන්නේ නැහැ. ඒක ප්‍රතික්ෂේප කළා. මේ වාගේ අපේ සභාවට ඉතාමත් ආදර්ශවත් දේශපාලන දිවි පෙවෙතක් ගෙන ගිය දේශපාලන වශයෙන් ඉතාමත්ම උතුම් මිනිසකු බව මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මෙතැන එක්තරා සංකේතයක් තියෙනවා, අපේ යුසුෆ් මැතිතුමා. සුසිල් මුණසිංහ මැතිතුමා ප්‍රධාන අමාත්‍යවෙලා ඉන්න කාලෙදි එතුමාගේ අමාත්‍ය මණ්ඩලය නියෝජනය කරපු දැනට බස්නාහිර පළාත් සභාවේ සිටින එකම එක පුද්ගලයා නැත්නම් මන්ත්‍රීවරයා තමයි යුසුෆ් මන්ත්‍රීතුමා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ දවස්වලදී අපට මතකයි, තමාගේ අමාත්‍ය මණ්ඩලයට හොඳ රැකවරණයක් දුන්නා. ඊළඟට මම දැකපු දේ තමයි එතුමා ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන අමාත්‍යවරයා පමණයි. එහෙම නේද? වැරදිද දන්නේ නැහැ. අනෙක් විෂයයන් සියල්ලම බෙදිලා ගිහිල්ලා තිබුණේ. මෙතුමා සමුපකාර ඇමැති. සුරනිමල රාජපක්ෂ මැතිතුමා අධ්‍යාපන ඇමැති. කෘෂිකර්ම ඇමැති අපේ දිවංගත ඇල්මන් පීරිස් මැතිතුමා. ප්‍රවාහන අමාත්‍ය ලෝරන්ස් මාදිවල මැතිතුමා. මේ සියලුම කාරණා මතක් කළේ, ඉතා හොඳ සෑජු නායක්වයක් දීලා, ඒ වාගේම ඇමැති මණ්ඩලයක් හදා ගෙන අපට හොඳ සේවයක් දුන්නයි කියන කාරණාව මතක් කරන්නේ එතුමාට ගෞරවයක් හැටියටයි. මගේ කථාව මම තවත් දීර්ඝ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සුසිල් මුණසිංහ වැනි විශිෂ්ට

දේශපාලනඥයෙකුගේ අභාවය රටට පාඩුවක් බව ප්‍රකාශ කරමින්, අපි සිංහල බෞද්ධයින් හැටියට එතුමාට අමා මහ නිර්වාණ සම්පත්තිය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉතා කනගාටුවෙන් හරි මතක් කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාව බිහි වෙලා මුල්ම මහ ඇමතිවරයා හැටියට හිටපු මගේ මහ ඇමතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශයට සම්බන්ධ වීමට ලැබීම ගැන එක පැත්තකින් මා සංතෝෂ වෙනවා. ඒ වාගේම මේ පළාත් සභා ක්‍රමය සාකච්ඡා කරමින් ඉන්න අවස්ථාවේදී මේ රටට ඉන්දියාවෙන් මෙය බලෙන් දෙනවාය කියන අදහස සමාජය තුළ බිහි කර ගෙන ඒ කටයුත්තට පළාත් සභා ක්‍රමය ලොකු ආන්දෝලනයක් වුණු අවස්ථාවක මේ රටේ වගකීමක් දරන්න පුළුවන් අනගාරික ධර්මපාල පරම්පරාවේ මුණුපුරෙක් හැටියට හිටපු සුසිල් මුණසිංහ මහත්මයාට එවකට තමාට හිතවත්ව සිටි ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විසින් මේ කටයුත්ත පැවරුවා. නමුත් පළාත් සභා ක්‍රමය පාර්ලිමේන්තු පනතකට ඇතුළත් කරන්න පෙර එක්තරා අවස්ථාවක සුසිල් මුණසිංහ මැතිතුමාගේ ප්‍රකාශයක සඳහන් වෙනවා, ඒ හිටපු ජනාධිපතිතුමා එතුමාව ගෙන්වලා කියලා තිබුණේ, ඔයා සූදානම් වෙන්න බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා වෙන්න කියලා. එතුමා ඒකට කිසි පිළිතුරක් දුන්නේ නැති වුණත් 13 සංශෝධනය සම්මත වුණාට පසුව, මේ මැතිවරණ ක්‍රමය ආරම්භ වුණු අවස්ථාවේ එතුමාට ඒ අවසථාව ලබා දුන්නා. මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. එදා ඉතාමත් භීෂණකාරී තත්ත්වයක් මත මුහුණ දීපු පළාත් සභා ඡන්ද ක්‍රමයක්. 1988 මාර්තු 02 වැනිදා ඉඳලා මාස 09 වෙන කල් මුලින්ම නාම යෝජනා කැඳවලා තිබුණත්, නාම යෝජනා කල් දාන්න සිදු වුණා. ඉන් අනතුරුව, දෙවන වරට කාලය දීර්ඝ කරලා 1988 අප්‍රේල් මාසයේ 14 වෙනිදා ඉඳලා 21 වනදා වෙන කල් ඒ මැතිවරණයට මුහුණ දෙන්න මටත් අපේක්ෂකයෙක් හැටියට, නියෝජිතයෙක් හැටියට ඉදිරිපත් වෙන්න පුළුවන් වුණා.

විශේෂයෙන්ම මම සුසිල් මුණසිංහ මැතිතුමාව හඳුනා ගත්තේ, නාම යෝජනා සියල්ලක්ම සකස් කරලා ඉවර වෙලා මට මතකයි සිරිකොත රැස්වීමක් පවත්වා ගෙන ගිය අවස්ථාවේ, සුසිල් මුණසිංහ මහත්මයා පැත්තකට වෙලා හිටියා. ඔහුගේ සෆාරි කිට් එකත් - ඔහුගේ ජනප්‍රිය ලා රෝස පාට වාගේ ඇඳුමක් තිබුණා. ඒක ඇඳගෙන පැත්තකට වෙලා හිටපු අවස්ථාවේ සියලු දෙනාම නාම යෝජනා අත්සන් කළාට පස්සේ එතුමාට සුසිල් කියලා කථා කළා. සුසිල් මුණසිංහ මහත්තයාට කථා කරලා, ඉදිරිපත් කරලා කිව්වා, මෙයා තමයි බස්නාහිර පළාතේ මහ ඇමති ධූර අපේක්ෂකයා. විශාල වගකීමක් භාර දුන්නා. මේ රටේ ජනතාවගේ ප්‍රශ්නය වෙනුවෙන් ඉදිරිපත් වුණු ඒ විසඳුම සක්‍රිය කරන්න එතුමාට පුළුවන් වුණා. ඒ වගකීම නිසි ලෙස අරගෙන හොඳ නායකයෙක් හැටියට කටයුතු කරන්න පුළුවන් වුණා. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සඳහන් කළා වාගේම, ඉතා නිහතමානීව ඒ මැතිවරණ කටයුතු මෙහෙයවලා මැතිවරණය ජයග්‍රහණය කරලා 1988 ජූනි මාසයේ එතුමාට පුළුවන් වුණා, මහ ඇමතිවරයා හැටියට පත් වෙන්න. ඔහු පත් වෙන වෙලාවේදිත් මේ රටේ තිබුණ අර්බුදකාරී තත්ත්වය මත ආණ්ඩුකාරවරයෙක් හිටියේ නැහැ. ඡන්දෙන් ජූනි 02 වැනිදා පත් වෙන කොට ආණ්ඩුකාරවරයෙක් හිටියේ නැහැ. ආණ්ඩුකාරවරයෙක් හැටියට 09 වැනිදා ජනාධිපතිතුමා විසින් ෂර්වානන්ද හිටපු අග්‍රවිනිශ්චයකාරතුමා පත් කරලා, එතුමා යටතේ මෙතුමා දිවුරුම් දුන්නා. දිවුරුම් දීලා 20 වනදා වෙන කොට එතුමාගේ අමාත්‍ය මණ්ඩලය පිහිටුවන්න අවශ්‍යතාවයක් තිබුණා. අමාත්‍ය මණ්ඩලය තෝරා ගැනීමේදී එතුමාටත් ගැටළු තිබුණා. කොළඹ දිස්ත්‍රික්කයෙන් තරග කළ මැති ඇමතිවරුන්ගේ දූ දරුවෝ හිටියා. ඒ වාගේ ප්‍රබලයෝ හිටියා. ඒ සියලු දෙනා අතරින්ම මම වාගේ පුංචි මිනිහෙකුත් එතුමාට තෝරා ගන්න පුළුවන් වුණා. ඒ ජාති, ආගම් භේද ගැන එතුමා හිතපු නැති නිසා. මේ මොහොත වන විට තිබුණු අනගාරික ධර්මපාල පරම්පරාවේ හිටපු නායකයෙක්, බස්නාහිර පළාත් නායකයෙක් වෙලා කටයුතු කිරීමේදී පළාතෙන්ම ලොකු ආදර්ශයක් දුන්නා, එතුමාත් එක්ක එදා සිට සම්බන්ධ වෙලා. එතුමාගේ අමාත්‍ය මණ්ඩලයේ අපි ඉන්න කොට දැඩි විනයක් තිබුණා. දැඩි පාලනයක් තිබුණා. මේ පළාත් සභාව මේ මොහොත ක්‍රියාත්මක වෙනවා නම්, සියලුම මන්ත්‍රීවරු අනිවාර්යෙන් තමන්ගේ ආසනයේ ඉන්නවා. හදිසියට එක්කෙනෙක් දෙන්නෙක් හැර. අනෙක් සියලු දෙනාම නවයහමාර වෙන කොට මේ පුටුවල වාඩි වෙලා ඉන්නවා. එතුමාට යම් යම් අවස්ථාවලදී පොඩි අර්බුදකාරී තත්ත්වයක් ඇති වුණා. ඔසී අබේගුණසේකර එදා විපක්ෂ නායකයා හැටියට තේරී පත් වුණා. ඔසී ගේ පුටුවට අභියෝගයක් වුණා. ලොකු අර්බුදයක් ඇති වෙලා එතුමා පන්නන්න විපක්ෂය සූදානම් වන කොට යම් යම් තීන්දු ගන්න සිද්ධ වුණා. එතුමා ඒ පුටුව ආරක්ෂා කරන්න කටයුතු කළේ, කවුරු හරි එක්කෙනක්ව ඔසී ගේ පුටුවේ වාඩි කරලා තියලා කාටත් ඉඩ නොදී. එවැනි තත්ත්වයක් තිබුණේ. ඒ අතරතුර මේ සභාවට එන මන්ත්‍රීවරු සංඛ්‍යාව දවසින් දවස අඩු වෙනවා. 20% ක් විතර මන්ත්‍රීවරු ජීවිතක්ෂයට පත් වුණා. නාම යෝජනා දුන්නාට පස්සේ ඉල්ලා අස්වෙන්න කිව්වා. එවැනි මොහොතක තමයි මේ බස්නාහිර පළාත් සභා ක්‍රමය තුළ එතුමා මහ ඇමතිවරයා හැටියට කටයුතු කර ගෙන ඉතා නිහතමානීව මේ ගමන් මාර්ගයේ ආවේ.

මම එතුමාගේ විනය ගැන මතක් කරන්න ඕනෑ. මට මතකයි එක් අවස්ථාවකදී මමයි සුරනිමල රාජපක්ෂයි අමාත්‍ය මණ්ඩලයේ කටයුතු කරන කොට රැස්වීමකට එන කොට විනාඩි 10 ක් 15 ක් පරක්කු වුණා. එදා අපි දෙන්නා ආවේ අත් කොට කමිස දෙකක් ඇඳගෙන. කොහේ හරි අපි දෙන්නා ගිහිල්ලා. අපට ඒ පුටුවල වාඩි වෙන්න පෙර ඇහුවේ, තමුන්නාන්සේලා දෙන්නා විනෝද ගමනක් ගිහිල්ලාද ආවේ කියලා. හරවලා යැව්වේ නැහැ.

අවවාදයක් කළා. මින් ඉදිරියට අමාත්‍ය මණ්ඩල රැස්වීමට එනවා නම් වාඩි වෙන්න ඕනෑ, නිසි ඇඳුම ඇඳ ගෙන කියලා. අද ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි දකිනවා. ජනාධිපතිතුමා ඉදිරියේත් ඇමතිවරු ඉන්නේ අත් කොට කමිසයක් ඇඳ ගෙන. මේ රටේ පාලකයෝ හැටියට, රටේ ජනතාවට ආදර්ශයක් දෙන්න ඉන්න උදවිය හැටියට ඒ ඒ තැන්වලදී ඒ විධියට හැසිරෙන්න ඕනෑ. එතුමාගේ කාලයේ තමයි Protocol එක නැත්නම් මැති ඇමතිවරුන්ගේ ක්‍රමයක් හැදුවේ. ජනාධිපති ප්‍රේමදාස මහත්මයා සම්බන්ධ කර ගෙන එසේ නිසි ලෙස සකස් කරලා ජනාධිපතිතුමා, කථානායකතුමා, අගමැති, අමාත්‍යවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඊළඟට අමාත්‍යවරයා ඉන්න තැනට මහ ඇමතිවරයා, මහ ඇමතිවරයා ලඟට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා ඇමතිවරු සහ මන්ත්‍රීවරුන්ට එදා ඒ ක්‍රමය සකස් කරලා තිබුණා.
[ ගරු ඒ.එම්. යූසුෆ් ]

මම හිතන්නේ පළාත් සභා මන්ත්‍රීවරු තමන්ගේ පුටුව වත් තමන් දන්නේ නැති සයිස් එකට තත්ත්වයක් උදා වෙලා. මේ තත්ත්වය උඩ එය මතක් කරන්න වෙනවා. දැන් එවැනි මොහොතක මේ පළාත් සභා ක්‍රමය තුළ මේ පළාත් පාලන ආයතනවල සභාපතිවරු බෙත්මගේ මැතිතුමා, අපේ ගාමිණී තිලකසිරි මැතිතුමා කථා කරපු ඒවා ඇත්ත.

පළාත් පාලන ආයතන ව්‍යුහය පළාත් සභා විෂයයක් හැටියට 13 වැනි සංශෝධනයේ අන්තර්ගත වෙලා තිබුණා. එතුමා ඒක නිසි ලෙස ක්‍රියාත්මක කරන්න, පරිපාලනය නිසි ලෙස ක්‍රියාත්මක කරන්න සෑහෙන උනන්දුවක් දැක්වූවා. නමුත් එදා අපට නිලධාරීන් හිටියේ නැහැ. මගේ අමාත්‍යාංශයේ හිටියේ වයසක නිලධාරියෙක්. එයත් එක්ක තාවකාලිකව තුන් දෙනෙක් අරගෙන තමයි මගේ අමාත්‍යාංශය පවත්වා ගෙන යන්න පුළුවන් වුණේ. ඉන්න ගොඩනැගිල්ලක් අපට තිබුණේ නැහැ. අවශ්‍ය නිලධාරින් කවුරුත් නැහැ. ප්‍රධාන ලේකම් විතරයි හිටියේ. අමාත්‍යාංශවල ලේකම්වරුන්ට කථා කළාම ලේකම්වරු බයයි. වරප්‍රසාදය නැති වෙයි කියලා. එදා ප්‍රචාරයක් තිබුණා මේ රටට පළාත් සභා ක්‍රමය වැඩක් වන්නේ නැහැ, තමුන්නාන්සේලා යන්න එපා, අයිතිවාසිකම් නැති වෙලා යනවයි කියලා. ඒ මතය තිබුණා. නිලධාරීන් එන්නේම නැති තත්ත්වයක් තිබුණා. එවැනි දුෂ්කර අවස්ථාවක එතුමාට පුළුවන් වුණා, මේ ක්‍රමය තුළ සභාව මෙහෙයවන්න, සභාව රැස් කරන්න. අමාත්‍යවරුන්ව දැඩි ලෙස මෙහෙයවූවා. එදා භීෂණ යුගයේදී මොනතරම් ප්‍රශ්න තිබුණත් හැම ඇමතිවරයෙක්ම උදේ අට නවය වෙනකොට තමන්ගේ අමාත්‍යාංශයට යන්න ඕනෑ. අඩු තරමේ සවස දෙක වෙන කල් ඉන්න ඕනෑය කියන නියෝගය එතුමා තුළ තිබුණා. මේ ක්‍රමය ස්ථාපිත කිරීමේ ලොකු කර්තව්‍යයක් තිබුණේ. යුද්ධයත් එක්ක. බෝම්බයත් එක්ක. තුවක්කුවත් එක්ක තිබුණේ. විශේෂයෙන්ම දක්ෂ පුද්ගලයෙක්. එතුමා එක්ක සමීපව මට ආශ්‍රය කරන්න පුළුවන් වුණා. මට එතුමාගේ විශ්වාසය දිනා ගන්න පුළුවන් වුණා. එතුමාගේ විශ්වාස කොතරම්ද කිව්වොත්, එතුමා පක්ෂය විසින් යම් දේශපාලන කටයුත්තක් භාර දෙනවා නම්, මැතිවරණයක් මෙහෙයවන්න හෝ ගමනක් යන්න එතුමා මාව එක්ක ගෙන ගිහිල්ලා මට ඒ වගකීම් භාර දීලා යනවා.

එතුමා සුළු ජාතිකයෙක් හැටියට මේ රටේ මහ ඇමතිකම දරන්න පුළුවන් ක්‍රමයක් අපට හදලා දුන්නා. එතුමා මහ ඇමතිවරයා හැටියට වැඩ බැලීමේ අවස්ථා ගණනාවක් මට හදලා දුන්නා. එතුමා නිතරම සිංගප්පූරු යනවා. එතුමාගේ දරුවන් සහ භාර්යාව බලන්න. හොඳ ව්‍යාපාරිකයෙක්. හොඳ කළමනාකරුවෙක්. එතුමා පෞද්ගලික සම්බන්ධකම් තිබුණ කෙනෙක්. එහෙම යන අවස්ථාවල කියනවා මම දවස් තුනටයි යන්නේ. Turn එක මාරුවෙන් මාරුවට අපි හතර දෙනාට බෙදා දුන්නා. ඔයාට මේ Turn එක තියෙන්නේ. නමුත් ඔයාට මම මේක දෙන්නේ නැහැ. අහවල් මාසයේ දින ගණනාවක් යනවා විදේශ සංචාරය සඳහා. එදාට මේ කටයුත්ත කරන්න ඕනෑ. එතරම් දුරට විශ්වාසය තබා ගත්තා. අපි ඒ විශ්වාසය තුළ ඒ විනය ගරුකව සිටිය නිසා තමයි අදත් මේ සභාවේ අපට කෙලින් ඉඳ ගෙන කථා කරන්න පුළුවන් වෙලා තියෙන්නේ. හැසිරෙන්න පුළුවන් වෙලා තියෙන්නේ. එවැනි නායකයෙක්. එතුමා ආහාර ගන්න වෙලාවට අපි ගියොත් එතුමාගේ කෑම මේසයට අපව ගෙන්නා ගන්නවා. කාර්යාලයක් නැති නිසා කිහිප වතාවක්ම අමාත්‍ය මණ්ඩල රැස්වීම එතුමාගේ ගෙදර තිබුණ අවස්ථා තියෙනවා. එතුමාගේ ජනප්‍රිය කෑමක් තමයි පොල් සම්බෝලය. මොනව තිබුණත් කමක් නැහැ. එතුමාට කෑමට පොල් සම්බෝලය තියෙන්න ඕනෑ. එවැනි පුද්ගලයෙක්. ඉතාම නිහතමානී තමන්ගේ සේවකයන්ට කථා කළේ බොහොම හිතවත්ව. තමන්ගේ සේවකයන්ට ඉතා හොඳින් සැලකුවා වාගේම, පරිපාලනය තුළ එතුමා ඒ නිලධාරීන් ගැන විශ්වාසයක් තියා ගෙන තමයි තටයතු කළේ.

එතුමා මුල්ම ප්‍රඥප්තිය සම්මත කළා. සේවක වැටුප් හා දීමනා මුල්ම ප්‍රඥප්තිය සභාවට ගෙනාවා. ප්‍රඥප්ති 28 ක් සම්මත කර ගන්න පුළුවන් වුණා. එතුමාගේ වගකීම් අනුව. මෙවැනි ගමන් මාර්ගය තුළ ආපු මේ ගමන අද පළාත් සභා ලෙස ස්ථාපනය වෙලා තිබෙන්නේ, ඒ මුල් අදියරේ නැත්නම් මුල් අත්තිවාරම ශක්තිමත් නිසා. ඒ අත්තිවාරම රැක ගෙන යන්න අපට ඕනෑ වෙලා තිබුණා. ඒක රැක ගනීද කියන ප්‍රශ්නය අද සමාජය තුළ තියෙනවා.

ඒ වාගේම ගරු මූලාසනයට මතක් කරන්න ඕනෑ. ගරු අමාත්‍යවරුන්ටත් මතක් කරන්න ඕනෑ. එදා මාසයකට වරක් අපි නිසි ලෙස කටයුතු කරන්න ඕනෑ කියලා එතුමා ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම ඇමතිවරුන්ගේ සමාලෝචන සාකච්ඡාවක් කළා. ඒකට ප්‍රධාන ලේකම් සහ අමාත්‍යාංශ ලේකම්වරු හතර දෙනා කැඳවා ගන්න. පළමු මාසය තුළ නැත්නම් දෙවැනි මාසය තුළ කරපු ඒ කටයුතු මූල්‍ය වියදම් පවා ඉදිරිපත් කරලා සාකච්ඡාවට භාජනය කරන්න සිද්ධ වුණා. මම දන්නේ නැහැ අද ඒක තියෙනවාද කියලා. අපි වාර්ෂිකව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 1990 ඉඳලා වාර්ෂිකව පළාත් සභා ක්‍රමය

තුළ ඒ කටයුත්ත කර ගෙන ආවා. ඒක අද අහෝසි වෙලා තියෙනවා. ඒ නිසා විනයක්, පරිපාලනයක්, කළමනාකරණයක් කොතැන හරි තියෙනවා නම්, ඒ ව්‍යූහය ශක්තිමක් කරනවා.

අද අපි මූල්‍ය ප්‍රශ්නයකට මුහුණ දීලා තියෙනවා. එදා සුසිල් මුණසිංහ මහත්තයාට ඕනෑ වෙලා තිබුණා, මධ්‍යම රජයෙන් ලැබෙන ආදායම නැතුව පළාත් සභා ආදායම වැඩි කර ගන්න. එහෙම හිතලා යෝජනා ඉදිරිපත් කරලා කටයුතු කරන කොට මට මතකයි විරුද්ධ පක්ෂයේ සිටි යම් යම් උදවිය එදා අපට කථා කළා, බුලත් විට කාරයාටත් අද File එකක් ලිපි ගොනුවක් තමුන්නාන්සේලා ආරම්භ කරලා සල්ලි ගන්න හදනවයි කියලා. අපි ලිපි ගොනු දහස් ගණනක් එදා ආරම්භ කළා. මේ පළාත් සභාවට ආදායම එන විධියේ. ඒක මම මතක් කරන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙවැනි දක්ෂ පුද්ගලයෙක් අද අපට නැති වීම ගැන විශේෂයෙන්ම කනගාටු වෙන්න ඕනෑ. මෙවැනි තත්ත්වයක ඉඳලයි අපි ආවේ. එතුමාගේ වියෝවය තුළ අපට විතරක් නොවෙයි. මුළු රටටම විශේෂයෙන්ම පාඩුවක් වුණා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එක්සත් ජාතික පක්ෂයට ඇවිල්ලා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාත් එක්ක ඉතාම විශ්වාසනීය පුද්ගලයෙක් හැටියට කටයුතු කළා. එතුමා පළාත් සභාවේ මහ ඇමතිවරයෙක්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම විපක්ෂ නායකවරයෙක් වැනි ඒ සියලුම තනතුරු දැරුවා. එතුමා එදා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් සිටින කාලයේ ඉතාම සමබරව ආයතනය පාඩුවක් නැතුව පවත්වා ගෙන ගියා. අද ගුවන් විදුලි සංස්ථාවට මොකද වෙලා තියෙන්නේ? දේශපාලනීයකරණය. එතුමා එදා දේශපාලන පාක්ෂිකයෙක් හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ විශ්වාසය දිනාගත්ත පුද්ගලයෙක් හැටියට එදා ඒ කටයුත්ත කළත්, එතුමා දැඩි විනයක් ඇතිව ඒ ආයතනය පවත්වා ගෙන ගිය නිසා තමයි, එතුමාට පුළුවන් වුණේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ලාභදායී තත්ත්වයකට පත් කරන්න. විශේෂයෙන්ම අපි මෙනෙහි කළ යුතු කටයුත්තක්. එදා මම පළාත් සභාවේ හිටියා. ආදර්ශවත් වෙන්න පුළුවන් පුද්ගලයෙක් මුලින්ම තේරී පත් වුණා.

විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. බර්නාඩ් සොයිසා, චන්ද්‍රා ගුණසේකර, ඒ වාගේම විමලසිරි ද මෙල්, චම්පි ගුණවර්ධන වාගේ දේශපාලනයෙන් පරිණත වුණු පුද්ගලයන්ගෙන් සමන්විත සභාවක් හැටියට ගෙනියන්න පුළුවන් වුණා. එතුමාට ලොකු සහායක් වුණා. ඒ අයත් එක්ක විපක්ෂයක් හැටියට සැලකුවේ නැහැ. විපක්ෂයක් සමග සාකච්ඡා කළා. එතුමා තමයි මුලින්ම විමධ්‍යගත මුදල් - පළාත් සභා ක්‍රමය තුළ එදා මුලින්ම අවුරුද්දට ලක්ෂ එකහමාරක් දුන්නා. එදා ලක්ෂය අද රුපියල් ලක්ෂ සියයක් විතර වටිනවා. දෙවැනි වතාවට ඊට වඩා වැඩි කරලා දුන්නා. එතුමා කිව්වේ මොනවාද? ආණ්ඩු පක්ෂයට වාගේම විපක්ෂයටත් සලකනවා. විපක්ෂයටත් දෙන්නේ ඇයි? මහජන නියෝජිතවරු ගමට යන කොට මේ අය හිස් සාක්කු දිගේ අත් දෙක දා ගෙන ගිහිල්ලා වැඩක් වෙන්නේ නැහැ. ජනතාවගේ යම්කිසි අවශ්‍යතාවක් තියෙනවා නම්, ඒ අවශ්‍යතාවය දැන ගෙන යමක් කරන්න මාර්ගය පෙන්වන්න කියන එකයි එතුමා මාර්ගෝපදේශකයා වශයෙන් කටයුතු කළේ. එතුමා මාර්ගෝපදේශකවරයෙක්. දක්ෂ කළමනාකරුවෙක් හා පාලකයෙක්. නිලධාරීන්ගේ සුව දුක් හොයා බලනවා. නිලධාරීන්ට ගිහිල්ලා කථා කරන්න ශක්තියක් තිබුණා. නමුත් දැඩි විනයක් තිබුණා. පළාත් පාලන ආයතනයේ පමණක් නොවෙයි. මේ ව්‍යූහය තුළත් දැඩි පාලනයක් ඇති කරන්න එතුමාට ඕනෑකමක් තිබුණා. විශේෂයෙන්ම මම මූලාසනයට මතක් කරන්න ඕනෑ. එතුමා පෞද්ගලික අංශය සම්බන්ධ කරගත්තා පළාත් සභාවේ යම් යම් අංශවලට. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මහරාජා වැනි ආයතනවලින් උදව් උපකාර ගත්තා. ඒ වාගේම අද අපි විශාල වශයෙන් වියදම් කරනවා බස් නැවතුම්පොල හදන්න. මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන දෙනවා. එහෙම නැත්නම් වෙනත් අයගේ. එදා එතුමාට පුළුවන් වුණා පෞද්ගලික අංශය සම්බන්ධ කර ගෙන මෙන්න මේ වැඩය කරන්නය කියලා ඒ අයට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙන්න. පළාත් සභාවේ මුදල් ඉතුරු වුණා. විශේෂයෙන් ඒ වැඩ පිළිවෙළ මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේ සෑම ක්ෂේත්‍රයක්ම, විශේෂයෙන්ම සමුපකාර අංශයේ දියුණුවට කටයුතු කළා. ඒ වාගේම ඇල්මන් පීරිස් ඇමතිතුමාගේ කෘෂිකර්මයට මුල් තැන දීමක් එතුමා පටන් ගත්තා. සුරනිමල රාජපක්ෂ අධ්‍යාපන ඇමතිවරයා හැටියට. ගමින් ගමට යැව්වා යන්න කියලා. මටත් පුළුවන් වුණා එහෙම කරන්න. දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයේ කොට්ඨාශ තුනට වැඩ පිළිවෙළක් සකස් කරන්න ගියේ. ඒ අතරතුරදිත් තිබුණා බාධාවන්. අපේ ආණ්ඩුව තුළ. වර්තමානයේ වාගේම තමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අදත් ඇමතිවරුන්ගේ බලපෑම් තියෙනවා. නැතුව නොවෙයි. එදත් අපේ ඇමතිවරුන්ගේ බලපෑම් තිබුණා. එද උසස් මට්ටමේ නිලධාරීන්ගේ බලපෑම් පළාත් සභාවට තිබුණා. අදත් ඒක තියෙනවා. අන්න ඒකයි. ඒ බලපෑම් මැද කර ගෙන යන්න හැකියාව තිබුණු බව මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන්ම අද ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් අවශ්‍ය වෙලා තියෙනවා. අපි හැම පැත්තෙන්ම හිර වෙලයි තියෙන්නේ. අපට හැම පැත්තෙන්ම ප්‍රශ්න තියෙනවා. ඇමතිවරුන්ට තියෙනවා. නිලධාරීන්ට තියෙනවා. අපට පහසුකම් අඩුයි. මේවා කථා කරන්න විධියක් නැහැ. පසුගිය සුමානේ මහ ඇමතිතුමාත් සමග සාකච්ඡා කරපු අවස්ථාවේ කිව්වා. මේ බස්නාහිර පළාත් සභාව තුළ විශේෂයෙන්ම අනධ්‍යාන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිළිබඳව ගැටලු තියෙනවා. අපට නොලැබුණත් ඒ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවා අවශ්‍යතාවන් තියෙනවා. රෝහල් කම්කරුවන් අවශ්‍ය වෙලා තියෙනවා. රෝහල් සේවකයෝ අවශ්‍ය වෙලා තියෙනවා. අධ්‍යාපනයට මුරකරුවෝ අවශ්‍ය වෙලා තියෙනවා. සුළු සේවකයන් අවශ්‍ය වෙලා තියෙනවා. දහස් ගණන් ඒ ඇබෑර්තු

පුරවා ගන්න අපට අද බාධාවන් තියෙන බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අද මූල්‍ය වශයෙන් ගත්තාම, ඒ මූල්‍ය අපහසුතාවයන්ට අද අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම සුසිල් මුණසිංහ මහතාගේ චරිතය අපි හැමෝම අගය කළ යුතුයි. ඔහු පළාත් සභා ක්‍රමයට විතරක් නොවෙයි. ලංකාවේ බෞද්ධයින්ගේ - අනගාරික ධර්මපාල මැතිතුමාගේ මුණුපුරෙක් හැටියට එතුමා ඒ වචනය ඒ විධියටම ක්‍රියාත්මක කළ චරිතයක් බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එතුමාව මම ආශ්‍රය කරපු නිසා, එතුමා හොඳ බෞද්ධයෙක් හැටියට මම දැක්කා, එතුමාගේ හැසිරීම, එතුමාගේ පැවැත්ම, එතුමාගේ ජීවිත චරිතය තුළ ඒ සියළුම ගුණාංග තිබුණා. එතුමාගේ ජීවිතයේ අවසාන භාගයේ ඉතාමත් අසනීප තත්ත්වයෙන් සිටියත්, එතුමා ජනතාව අමතක කළේ නැහැ. ඒ කාර්ය මණ්ඩලය අමතක කළේ නැහැ. එතුමාගේ

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

විශ්වාසය තවමත් මේ සමාජය තුළ, මේ ශාලාව තුළ එතුමාගේ පැවැත්ම අප අතර තියෙන බව මම ඉතා සතුටින් මතක් කරන්න ඕනෑ. ආදර්ශවත් ජීවිතයක් ගත කරපු නිසා. ආදර්ශයක් සමාජයට ලබා දීපු නිසා. මහ ඇමතිවරයෙක් හැටියට එතුමා මේ පළාත් සභා ක්‍රමය ස්ථාපනය කරලා නිවැරදි කළමනාකරණයෙන්, පරිපාලනයෙන් අනාගත සැලැස්මක් සකස් කරපු නිසා තමයි එතුමාගේ ප්‍රකාශනයත් සභානායකතුමා ප්‍රකාශ කරන ලද්දේ. එතුමාට තිබුණේ, පළාත් සභා ක්‍රමය නිසි ලෙස ජනතාවගේ හදවතට සමීප වන විධියේ පුළුල් විධියට, ග්‍රාමීය මට්ටමේ සේවාවක් ලබා දීමටයි. අපි අද පළාත් සභා ක්‍රමය ගැන විවේචනය කළත්, පළාත් සභා ක්‍රමය තුළ - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක් දෙන්න. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ පළාත් සභා ක්‍රමය ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලෙස බිහි වුණත් අපේ වගකීමක් තියෙනවා පළාත් සභා ක්‍රමය හරියට නිසි ලෙස අර්ථ නිරූපනය කර ගෙන යන්න. මේ සියලුම ජන කොටස් ඒකරාශී කර ගෙන, අනවශ්‍ය ප්‍රශ්න මතු නොවී විතරක් නොවෙයි. අද රටේ රැකියා ක්ෂේත්‍රය තුළදී මුල් තැනක් දීලා කටයුතු කරන්න පුළුවන් වෙනවා.

ඒ වාගේම කෘෂිකර්ම කෂේත්‍රය තුළ මුල් තැන දීලා පුළුල් විධියේ වැඩ පිළිවෙළක් අපට කර ගෙන යන්න පුළුවන් වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අපට හොඳ අධ්‍යාපනයක් ලබා දීමේ හැකියාව නිර්මාණය කිරීමේ ශක්තිය තියෙනවා. එහෙමනම් මේ ශක්තිය ගැන එදා සුසිල් මුණසිංහ මැතිතුමා හිතුවා. බැලුවා. කල්පනා කළා. ඔහුට තිබුණේ සුළු කාලයක් පමණයි. එතුමා විපක්ෂ නායකවරයා හැටියට වුණත් එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට සම්පූර්ණ සහයෝගය දුන්නා. එතුමා 13 වැනි සංශෝධනයෙන් පොලිස් බලතල පළාත් සභාවට ලබා ගත යුතුයි කියන යෝජනාව ගෙනාපු අවස්ථාවේදී සුසිල් මුණසිංහ මහ ඇමතිතුමා සම්පූර්ණයෙන්ම සහයෝගය දුන්නා. පොලිස් කොමිෂන් සභාවක් පිහිටුවන්න ඕනෑ, පොලිස් බලතල මේ පළාත් සභාවට ලබා ගන්න ඕනෑය කියන මේ යෝජනාව සම්මත කළේ, එදා විපක්ෂයේ සහයෝගයක් ඇතිව. අපේ අනන්‍යතාවය, ආයතනයේ අනන්‍යතාවය පළාත් සභා ක්‍රමය ස්ථාපනය කර ගෙන ඒ මුළු ජන කොටස්වලටම දෙන්න ඕනෑය කිව්වාම - පසුකාලීනව යම් යම් උදවිය ඉඩම් ප්‍රශ්නය මතු කර ගෙන, යම් යම් උදවිය පොලිස් බලතල පිළිබඳව රටේ නැති ප්‍රශ්න ඇති කර ගෙන මේ රට ගිනි ගොඩක් කරන්න උත්සාහ කළා. ඒ තත්ත්වයට අපි පත් වුණා . අද සමාජයේ වෛරය දවසින් දවස වැඩි වන මොහොතකයි අපි ඉන්නේ. එහෙනම් මේ යුද්ධය අවසන් කරලා තියෙනවා. මේ පළාත් සභා ක්‍රමය එදා යුද්ධය මැද පටන් ගත්තේ. එවැනි පළාත් සභා ක්‍රමය තුළ සියලුම ජන කොටස් ඒකරාශී කර ගෙන එක අම්මාගේ දරුවෝ හැටියට එක ලාංකික ජනතාවක් හැටියට අපට ජීවත් වෙන්න පුළුවන් ක්‍රමය මේ පළාත් සභා ක්‍රමය තුළ තියෙන බව මතක් කරමින්, නැවත වරක් මම මතක් කරන්න ඕනෑ. මගේ මහ ඇමතිතුමා කියලා කිව්වාට ඒකේ වරදක් නැහැ. සුසිල් මුණසිංහ මහ ඇමතිතුමා, එතුමා කරපු සේවාවට පමණක් නොවෙයි. ඔහු බෞද්ධයෙක් හැටියට එතුමා විශ්වාස කළ ආගමේ හැටියට ඔහුට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි මේ සභාවේ සාකච්ඡා කරන්නේ මේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රථම මහ අමාත්‍යවරයා ලෙස ඉතා විශිෂ්ට සේවාවක් ඉෂ්ට කරපු අභාවප්‍රාප්ත සුසිල් මුණසිංහ මැතිතුමා පිළිබඳව. එතුමා පිළිබඳව ආණ්ඩු පක්ෂයෙන් සහ විපක්ෂයෙන් එතුමාව ඇසුරු කළ, එතුමාගෙන් සේවාව ලබපු මන්ත්‍රීවරු විශාල වශයෙන් සාකච්ඡා කළා. මේ වේලාවේ මම එතුමාව දකින්නේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ඇමතිවරයා හැටියට 1988 මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කළ වෙලාවේ ඒ සියලු අභියෝග ජය අරගෙන නිර්භයව මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්නට මූලිකත්වය, දායකත්වය ලබා දීපු පුද්ගලයා හැටියට. ඒ අවස්ථාවේදී මම පළාත් පාලන මන්ත්‍රීවරයෙක් හැටියට වත්තල ප්‍රාදේශීය සභාවට නිතරගයෙන් පත් වෙලා එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු ප්‍රධාන ඇමතිවරයා නිසා කිට්ටු සම්බන්ධතාවයක් ඇති කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ සම්බන්ධතාවය නිසාම, එතුමාගේ යම් යම් වැඩ පිළිවෙළවල්වලට ප්‍රාදේශීය සභා මට්ටමෙන් දායකත්වය ලබා දෙන්න මට පුළුවන්කම ලැබුණා. 1991 වර්ෂයේදී මේ රටේ පවත්වපු පළමුවැනි ප්‍රාදේශීය සභා මැතිවරණයේදී, ඔබතුමියත් නියෝජනය කරපු ඒ ප්‍රාදේශීය සභා මැතිවරණයේදී මට වාසනාව ලැබුණා වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ගරු සුසිල් මුණසිංහ මැතිතුමා යටතේ මගේ රාජකාරි කටයුතු ආරම්භ කරන්න. මම හිතන්නේ, මේ සභාවේ ඉන්න සෞඛ්‍ය අමාත්‍ය ගරු ජගත් අංගගේ මැතිතුමා, ඒ වාගේම මීට පෙර කථා කරපු හෙක්ටර් බෙත්මගේ මැතිතුමා, ගාමිණී තිලකසිරි මැතිතුමා ඒ වාගේ විශාල පිරිසක් අද

මේ සභාව නියෝජනය කරන එදා 1991 ප්‍රාදේශීය සභා සභාපතිවරු හැටියට එතුමාගේ කාර්ය භාරයට දායකත්වය ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. මෙතැන්දී මම එකක් කියන්න ඕනෑ. අපට නියමිත වැඩ පිළිවෙළක් මේ පළාත් සභාව තුළින් ප්‍රාදේශීය සභා ක්‍රමය ශක්තිමත් කරන්නට ලබා දීලා තිබුණා. නමුත් ආරම්භයක් හැටියට ලංකාවේ ඇති වුණු ආයතන දෙකක් තමයි ඒ වන කොට පළාත් සභාවත්. ප්‍රාදේශීය සභාවත්. බොහොම ළදරු අවධියේ තිබුණේ. සම්පත් තිබුණේ නැහැ. මානව සම්පත තිබුණේ නැහැ. අනෙකුත් භෞතික සම්පත් තිබුණෙත් නැහැ. මේවා හැම එකක්ම හදා ගෙන තමයි ඉදිරියට යන්න පුළුවන්කම ලැබුණේ. ඒකට විශාල දායකත්වයක් ලබා දෙන්නට අවංකවම කටයුතු කරපු පුද්ගලයෙක් විධියට සුසිල් මුණසිංහ මැතිතුමාව ඉතිහාසගත වෙනවා. එතුමා යුග පුරුෂයෙක් හැටියට මේ ක්‍රමය මේ රටට හඳුන්වලා දීලා, ඒ ක්‍රමය ශක්තිමත් කරන්නට රාජ්‍ය අනුග්‍රහයත්, පෞද්ගලික අනුග්‍රහයත් දෙකම ලබා දුන් ශක්තිමත් නායකත්වයක් ලබා දීපු පුද්ගලයෙක් හැටියට එතුමාව අපි සඳහන් කරන්න ඕනෑ. අද එතුමා පිළිබඳව මෙතැන අපි නොදන්න දේවල්, අපි දන්න දේවල් පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. එතුමා එතුමාගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් මම හිතන්නේ මේවා රූපවාහිනී කැමරා ඉස්සරහට ගිහිල්ලා පත්තරවලට ගිහිල්ලා නැත්නම් වෙනත් ජනමාධ්‍ය ඉස්සරහට ගිහිල්ලා කරපු දේවල් නොවෙයි. කවුරුවත්ම දන්නේ නැති දේවල් එතුමා මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න එතුමාගේ පෞද්ගලික මට්ටමෙන් එතුමා ඉෂ්ට කරලා තියෙනවා. විශේෂයෙන්ම මේ රාජ්‍ය නිලධාරීන්ව පුහුණු කරන්න අද වාගේ මුදලක් පළාත් සභාවෙන් ඒ කාලයේ වෙන් වුණේ නැහැ. නමුත් එතුමා පෞද්ගලික මට්ටමින් පළාත් සභා මන්ත්‍රීවරුන්ව ඇමතිවරුන්ව ඒ නිලධාරීන්ව මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව යම් යම් හැදෑරීම් කරන්න, යම් යම් පුහුණුවීම්වලට විදේශගත වෙන්න පවා එතුමාගේ පෞද්ගලික ධනය එතුමා පරිත්‍යාග කළා. ඒ විතරක් නොවෙයි. මේ පළාත් සභාව විනයක් ඇතිව පවත්වා ගෙන යන්න, පිරිසිදුව පවත්වා ගෙන යන්න, යුසුෆ් මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි අඳින ඇඳුම පවා කොයි විධියට සකස් වෙන්න ඕනෑද කියලා – මට මතකයි එක සැරයක් ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ රැස්වීමක් තියනකොට එතුමා ඒ රැස්වීම තියෙන ශාලාවට එන කොට බිත්තිය අත ගා ගෙන තමයි ආවේ. බිත්තිය අත ගා ගෙන එන කොට බිත්තියේ තිබුණා දූවිලි. කථා කරලා සේවකයන්ට කිව්වා, මීට පස්සේ මේ වැරැද්ද වෙන්න බැහැ කියලා. එවැනි යම් යම් සුළු දේවල් පවා. මේ සභාවටත් වටිනා අපේ ජීවිතවලටත් ආදර්ශයට ගන්න පුළුවන් දේවල් එතුමාගේ කාල පරිච්ඡේදයේ අපි අත්දැකලා තියෙනවා.

ඒ වාගේම තමයි, පළාත් පාලන ආයතනවල සභාපතිවරු හැටියට අපට නියමිත කාලයක් තිබුණා එතුමා වෙත ගිහිල්ලා අපේ ප්‍රශ්න කථා කරන්න. හැබැයි, ඒ වෙලාවෙන් පිට වෙලාවක අපි කොයි වෙලාවේ හරි ගියොත් එතුමා ඉන්න තැනට එතුමා අප දැක්කොත් කථා කරනවා. කරුණාකරල සභාපතිතුමාට එන්න කියන්න. ඒ මොකද, මෙතැන කාලය කන්න බැහැ. එතුමාට තියෙනවා සභාවේ ගිහිල්ලා රාජකාරි කටයුතු කරන්න. ඒ නිසා එතුමාගේ ප්‍රශ්නය විසඳලා ඉක්මණින්ම එතුමා අරින්න කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. එක එක්කෙනා පෞද්ගලිකව කථා කරන කොට කථිකයාට බාධාවක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියටත් වාසනාව ලැබුණා එතුමා යටතේ උප සභාපතිනියක් හැටියට මුල්ලේරියාව කොටිකාවත්ත ප්‍රාදේශීය සභාවේ කටයුතු කරන්න. ඒ නිසා අපි දැක්කා. අපේ කාලය කළමනාකරණය කර ගන්නා එතුමා අපට ලබා දීපු යම් යම් මිණුම් දඬු, උපකාර අපේ ජීවිතවලටත් අපි ආදර්ශයට අර ගෙන තියෙනවා. ඒ වාගේම තමයි මෙතුමා කිව්වා වාගේ පළමුවැනි පළාත් සභාවේ විපක්ෂය කියලා කියන්නේ, මේ රටේ අංකුර බැහැපු දේශපාලනඥයෝ හිටියේ. බර්නාඩ් සොයිසා මැතිතුමා. චම්පි ගුණවර්ධන මැතිතුමා. චන්ද්‍රා ගුණසේකර මැතිතුමා. විශේෂයෙන්ම විපක්ෂ නායක ඔසී අබේගුණසේකර මැතිතුමා වැනි කෘතහස්ත දේශපාලනඥයෝ මේ විපක්ෂය නියෝජනය කළා. (බාධා කිරීමක්) අංකුර බැහැපු දේශපාලනඥයෝ තමයි ඇත්ත වශයෙන්ම වචනයෙන් සඳහන් කළොත්. ඒ තරම් ප්‍රවීණ දේශපාලනඥයෝ. හැබැයි මේ සියලු දෙනාටම වටිනාකමක් දීලා, හැම මන්ත්‍රීවරයෙක්ම ආණ්ඩු පක්ෂයේද විපක්ෂයේද කියලා බලන්නේ නැතිව හැමෝටම යම් යම් ආකාරයට වැඩක් නියම කරලා දීලා ඉවර වෙලා එතුමාගේ පාලන කාලයේ කටයුතු කර ගෙන ගියා. ඒක මම කියන්න ඕනෑ. මම දන්නවා පෞද්ගලිකවම. ඔසී අබේගුණසේකර මැතිතුමා මේ සභාවේ විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කළා. එතුමාට එක අවස්ථාවක මීරිගම පැත්තේ වාරිමාර්ග කටයුත්තක් පිළිබඳව වැඩය පවරලාම තිබුණා. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළේ ඔසී අබේගුණසේකර මැතිතුමා. හැබැයි එතැන්දී බැලුවේ නැහැ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක්ද? එතුමාට විතරයි මේ වැඩ සටහන දෙන්න ඕනෑ කියල. අපි කනගාටු වෙනවා යම් යම් අවස්ථාවලදී. මම මේක අවස්ථාවක් කර ගන්නවා. ඊයේ අපේ ප්‍රධාන ඇමතිතුමා වත්තල මැතිවරණ කොට්ඨාශයේ විශාල විවෘත කිරීමේ සංචාරයකට ගියා. හැබැයි, මම විතරයි පළාත් සභාවේ එක්සත් ජාතික පක්ෂයේ ඉන්න එකම මන්ත්‍රීවරයා. මටවත් ආරාධනාවක් තිබුණේ නැහැ. මම හිතන්නේ රන්දීර් රුදිගු මැතිතුමා ඇවිල්ල නැද්ද කොහේද කියලා ආරංචියි. ඒ කොහොම වුණත් හැමෝම සම්බන්ධ කර ගත්තා. මේවා එන්න එන්න වර්ධනය වෙන්න ඕනෑ මිසක්,

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාව ගන්නවාට කැමැති නැහැ නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මෙතැන එහෙම එකක් නොවෙයි. අපි පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපි යම් යම් දේවල් ඉල්ලා ගෙන පිටිපස්සෙන් ගිහිල්ලා මේ මේ දේ කර දෙන්න කියනවා. හැබැයි, සුසිල් මුණසිංහ මැතිතුමා එහෙම නොවෙයි. එතුමා ප්‍රධාන ඇමතිවරයා හැටියට පක්ෂ විපක්ෂ භේදයක් නැතුව, හැම මන්ත්‍රීවරයෙකුටම යම් කිසි වැඩ කොටසක්, මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න, මූර්තිමත් කරන්න එතුමා පවරලා තිබුණා. ඒ නිසා තමයි අද ළදරු අවධියේ එතුමා නායකත්වය දැරූ පළාත් සභාව, මේ තරම් දුරට ව්‍යාප්ත වෙලා අර යුසුප් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අමාත්‍යාංශවල ලේකම්වරු එන්නේ නැහැ. ස්ථානයක් තිබුණේ නැහැ. නමුත් අද වෙන කොට මේ පළාත් සභා ක්‍රමයේදී බස්නාහිර පළාත් සභාව ඇත්ත වශයෙන්ම මූල්‍ය වශයෙන් සහ යම් යම් සම්පත් වශයෙන් පෝෂණය වෙලා තියෙනවා. හැබැයි මේවා එක සැරේ වුණු දේවල් නොවෙයි. මේ සඳහා යම්කිසි

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

නායකත්වයක් දීලා, ප්‍රඥප්ති සකස් කරලා, අවංකවම මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න ඕනෑය කියලා කටයුතු කරපු පුද්ගලයෙක් හැටියට මම මේ වෙලාවේ සඳහන් කරනවා. එතුමා පක්ෂ භේදයකින් තොරව තමන්ගේ නායකත්වය දුන්නා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන ඇමතිතුමා විධියට හිටියා වාගේම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියටත් අවසාන කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙන්න එක්සත් ජාතික පක්ෂයෙන් අපෙන් වෙන් වෙලා ගියා. හැබැයි අද වෙන කොට දේශපාලනඥයෝ පක්ෂ මාරුකරන්නේ තමන්ට හම්බ වෙන වරදාන මොනවාද?, සල්ලි කොච්චරද?, වාහන මොනවාද? තනතුරු මොනවාද? මෙන්න මෙවැනි මිණුම්දඬු උපයෝගී කර ගෙන තමයි දේශපාලනඥයෝ පක්ෂ මාරු කරන්නේ. මම දන්නා සුසිල් මුණසිංහ මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය බැහැ දකින්න ගියේ එතුමාගේ පෞද්ගලික ධනය - මම මේක වගකීමෙන් කියන්නේ. එතුමාගේ පෞද්ගලික ධනය මලු ගණන් අරගෙන තමයි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය බැහැ දකින්න ගිහිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වුණේ. අන්න දේශපාලන පක්ෂ මාරු කිරීමේ ප්‍රතිපත්තිය. ප්‍රතිපත්තියක් මත තමන්ගේ දේශපාලනය සකස් කරගත්ත පුද්ගලයෙක් හැටියට අපි එතුමාව දකින්නේ.

එතුමාගේ අවසාන කාලයේ එතුමා වත්තල ප්‍රදේශයේ පෞද්ගලික ආරෝග්‍ය ශාලාවකට ආවා. එතුමා එහි ඉන්න අවස්ථාවේදී මේ සභාවේ ඉන්න නිලධාරියෙක් වන ප්‍රවෘත්ති නිලධාරී දීප්ති විජේතුංග මහත්තයා මට කථා කරලා කිව්වා ඔබතුමාගේ කොට්ඨාශයේ සුසිල් මුණසිංහ මැතිතුමා මේ රෝහලේ ඉන්නවා බොහොම අසාධ්‍යව. මට පොඩි උදව්වක් කරන්න පුළුවන්ද කියලා ඇහුවා. පස්සෙ මම ඇහුවා මොකක්ද කරන්න ඕනෑ කියලා. එතුමා හරි ආසයි පිරිත් ටිකක් අහන්න. කරුණාකරලා මට ස්වාමීන් වහන්සේ නමක් සම්බන්ධ කරලා දෙන්න කියලා. මම ඒ වෙලාවේම හැඳල පුරාණ විහාරයේ නායක ස්වාමීන් වහන්සේට කථා කරලා ස්වාමීන් වහන්සේ නමක් සම්බන්ධ කරලා දුන්නා. එතුමා බොහොම කැමැත්තෙන් ඒ පිරිත් ශ්‍රවනය කළේ. මට දැනගන්න ලැබුණේ අත පය තරමක් අප්‍රාණිකව සිටි එතුමා ස්වාමීන් වහන්සේ පිරිත් දේශනා කරලා අවසාන වෙනවාත් සමගම දැඩි ශ්‍රද්ධාවකින් යුක්තව එතුමාගේ දකුණු අත ඉහළට ඔසවා තනි අතින් වැඳ ඒ ආශිර්වාදය ලබා ගත්ත බවයි. ඒ අවසාන දවස් කිහිපයේදී මට පුළුවන්කම ලැබුණා, මේ සභාව නියෝජනය කරපු ලෝරන්ස් මාදිවල, ඩග්ලස් එම්. ප්‍රනාන්දු, ටයිටස් විමලසිරි වැනි මන්ත්‍රීවරුන්ට කථා කරලා ඔබතුමන්ලාගේ මහ ඇමතිතුමා රෝගී වෙලා ඉන්නවා. ඉතාමත් අසාධ්‍ය තත්ත්වයේ ඉන්නේ. කරුණාකරලා ගිහිල්ලා එතුමාව බලන්න කියලා කියන්න. මම හිතන්නේ, ඒ නම් සඳහන් කළ අපේ මන්ත්‍රීවරු ගිහිල්ලා එතුමාට ඒ අවසාන දවස් කිහිපයේ එතුමාගේ හිත සන්තෝෂ වන විධියට - එතුමා එක්ක ලොකු සාකච්ඡාවක් කරන්න පුළුවන් ශක්තියක් තිබුණේ නැහැ. නමුත් එතුමාගේ ඇස් දෙකින්, එතුමාගේ අනෙක් ක්‍රියා කලාපයෙන් පිළිබිඹු වුවා මොනතරම් සන්තෝෂයට පත් වුණාද කියලා.

ඒ අවසාන කාලයේ එතුමා බොහොම අල්පේශාක්‍ය ජීවිතයක් ගත කළේ. මේ රටේ වංශවත් පරම්පරාවක ඉපදිලා, විශාල ධනස්කන්දයකට උරුමකම් කියලා, ඒ සියලු දේවල් අතහැරලා අවසාන කාලයේ බොහොම නිවුණු ජීවිතයක්, බොහොම අල්පේශාක්‍ය ජීවිතයක් ගත කරලා, අපිස් ජීවිතයක් ගත කරලා අවසානයේදී එතුමා කීර්තිමත් පුද්ගලයෙක් හැටියට අප අතරින් වෙන් වෙලා ගියා.

අද අපි එතුමා පිළිබඳව මේ කථා කරන වෙලාවේ මම කැමතියි ඉල්ලීමක් කරන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මාර්ගයෙන්. එතුමා තමයි මේ පළාත් සභාවේ ප්‍රධාන ඇමති හැටියට පළමුවැනි වරට පත් වුණේ. එහෙම නම් එතුමා පිළිබඳව යම් කිසි සළකුණක්, සටහනක්, ස්මාරකයක් අපේ වපසරිය තුළ කොහේ හෝ තැනක තියෙන්න ඕනෑ. අද එවැනි පිළි රූ, එවැනි නම් යොදපු ස්ථාන ඕනෑ තරම් තියෙනවා. මෙවැනි තත්ත්වයක් නොතිබී ඉන්න සමහර පුද්ගලයින්ට විවිධ දේශපාලන හේතුන් ඇති. නමුත් සැබවින්ම තමන්ගේ පෞද්ගලික ධනය මේ රටේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න වියදම් කරපු වැය කරපු පුද්ගලයෙක් හැටියට යම් යම් තනතුරු දරලා මේ රටේ ඉතිහාසගත වුණු පුද්ගලයෙක් හැටියට බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ඇමති හැටියට ඉතිහාසයේ ලියැවෙන පුද්ගලයා හැටියට මේ පළාත් සභාවේ යුතුකමක් තියෙනවා එතුමා පිළිබඳව යම් සටහනක් සමරුවක් කොහේ හරි තබන්න. ඒ නිසා ඒ පිළිබඳවත් මේ වෙලාවේ ඔබතුමියගෙන් කාරුණික ඉල්ලීමක් කරමින්, ඉතාමත්ම ශක්තිමත් සාර්ථක ඒ වාගේම හැමෝටම සමානව සළකපු ප්‍රධාන ඇමතිවරයෙක් හැටියට ඉතාමත් හොඳ කාර්ය භාරයක් කරපු ගරු සුසිල් මුණසිංහ මැතිතුමා අප අතරින් වෙන් වෙලා ගියා. එතුමා කරපු කාර්ය භාරය පිළිබඳව අපි අද මේ සභාවේ කථා කරනවා වාගේම, එතුමා අපට උරුම කරපු දේවල් මේ සභාවේ ඉන්න පාලක පක්ෂයටත්, විපක්ෂයේ සිටින

දේශපාලනඥයන්ටත් ආදර්ශයක් හැටියට ගුරු කොට අරගෙන කටයුතු කරන්න වාසනා මහිමය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් එතුමාට නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ සුසිල් මුණසිංහ මැතිතුමන් මම පුද්ගලිකව දන්නා හඳුනන ඒ වාගේම මගේ පෞද්ගලික ජීවිතයටත් විශාල ශක්තියක් සපයපු කෙනෙක් හැටියට මේ අවස්ථාවේ එතුමන් වෙනුවෙන් වචන කිහිපයක් කථා කරන්නට අදහස් කරනවා.

අපි දන්නා පරිදි එතුමන් ධර්මපාලතුමන්ගේ මුණුපුරෙකු හැටියට, ඒ වාගේම විශාල වෙළඳ ව්‍යාපාරිකයෙක්, කළමනාකරණයේ නියුතු වූ කෙනෙක් හැටියට එතුමාගේ ජීවිතය ගත කළාය කියන එක අපි සඳහන් කරන්න අවශ්‍ය වෙනවා. එතුමා එක කාලයකදී වැතෙම් හවුස් නැමති සමාගමේත්, තවත් කලෙක මහාරාජා ආයතනයේත් මෙවැනි පෞද්ගලික අංශයේ ප්‍රධාන ආයතනවල ප්‍රධාන විධායකයකු හැටියට එතුමා තමන්ගේ ජීවිත කාලය තුළ කටයුතු කරලා තියෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා හැටියටත් 1970 වසරේ සමගි පෙරමුණ ආණ්ඩුව තුළ එතුමා කටයුතු කරපු අවස්ථා අපි මේ අවස්ථාවේ සිහිපත් කරන්න වෙනවා. 1960 මාර්තු මැතිවරණයේදී මහජන එක්සත් පෙරමුණෙන් පොල්ගහවෙල ආසනයට තරග කිරීමෙන් තමයි එතුමා තමන්ගේ දේශපාලන ජීවිතය ආරම්භ කළේ. මෙරට නියෝජ්‍ය කථානායකවරයා, ඒ වාගේම ජනසතු සේවා ඇමතිවරයා හැටියට කටයුතු කළ තමන්ගේ සහෝදරයා වූ අනිල් මුණසිංහ මැතිතුමා ලංකා සම සමාජ පක්ෂයේ සාමාජිකයකු, නායකයකු හැටියට හිටියත්, එතුමන් ඒ දේශපාලනයට ඇතුල් වෙන්න කවදාක්වත් ඉදිරිපත් වුණේ නැහැ. එතුමා මහජන එක්සත් පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය වාගේ පක්ෂ සමග එතුමාගේ ජීවිතයේ කටයුතු කරන්න යෙදුනු බව අපි ඉතිහාසයේ දැනගෙන හිටියා. විශේෂයෙන්ම 1970 මහ මැතිවරණයේදී සමගි පෙරමුණු රජය බලයට පත් කිරීමට ඒ ප්‍රචාරක කටයුතු භාරව කටයුතු කරපු ප්‍රධානියා හැටියට තමයි එතුමා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ කටයුතු කළේ කියන එක විශේෂයෙන් ම සඳහන් කරන්න වෙනවා. එතුමන් 1975 වසරේදී මෙරට නොබැඳි සමුළුව පවත්වන අවස්ථාවේදී නොබැඳි සමුළුව ශක්තිමත් කරන්න, සාර්ථක කරන්න අති විශාල කාර්ය භාරයක් කරපු කෙනෙක් හැටියට අපට සඳහන් කරන්න වෙනවා. නොබැඳි සමුළු ලේකම්වරයා හැටියට එම නොබැඳි සමුළුව ඉතාමත්ම සාර්ථක ආකාරයෙන් පවත්වන්න විශාල වැඩ කොටසක් කරපු කෙනෙක් හැටියට තමයි එතුමා අපට සඳහන් කරන්න පුළුවන් වෙන්නේ.

එතුමන්ගේ පළාත් සභා ජීවිතය තුළ, මෙම පළාත් සභාව තුළ කරපු කාර්යයන් ගැන අපට පෞද්ගලික දැන හැඳින ගැනීමක්, ආශ්‍රයක් නොතිබුණත් අපි දන්නා පරිදි එතුමන් 1989 වැනි කාලපරිච්ඡේදයේ 13 වැනි සංශෝධනය ශක්තිමත් කරන්න ඒ සඳහා විශාල විරෝධයක් පවතින කාලයේ 13 වැනි සංශෝධනය ශක්තිමත් කරමින් මෙරට බලය බෙදීම තුළ රටට විසඳීමක් ඇති කිරීමේ කාර්ය භාරයේදී ප්‍රමුඛත්වයක් ගෙන කටයුතු කරපු මහ ඇමතිවරයෙකු හැටියට අපට විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනැ. මම දන්නා පරිදි එතුමන් තමන්ගේ මහ ඇමති කාල පරිච්ඡේදය තුළ හෝ මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයකු විපක්ෂ නායකවරයකු හැටියට කටයුතු කිරීමේදී කිසිම දීමනාවක් ලබා නොගෙන කටයුතු කරපු කෙනෙක් හැටියට මම හිතනවා විශේෂයෙන්ම අපේ ගෞරවයට ලක් කරන්න ඕනැ වෙනවයි කියන කාරණය විශේෂයෙන්ම සඳහන් කරන්න වෙනවා.

එතුමන් මේ අකාරයට පළාත් සභාව තුළත්, ඒ වාගේම පාර්ලිමේන්තුව තුළත්, ඒ වාගේම පොදු මහජනතාව අතරේත් විශාල සේවාවක් කරමින් රටට විශාල වැඩ කොටසක් කරන්න ඉදිරිපත් වූ නායකයෙක් හැටියට සඳහන් කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා සුසිල් මුණසිංහ මැතිතුමාගේ ශෝක යෝජනාව සාකච්ඡා කරන මේ වෙලාවේ, එතුමා පිළිබඳව වචන කිහිපයක් සඳහන් කිරීමට අවස්ථාව සලසා දීම පිළිබඳව. මා විශ්වාස කරන විධියට ලාංකීය දේශපාලනය තුළ, අධ්‍යයනය කළ යුතු, පර්යේෂණය කළ යුතු සහ තම අත්දැකීම ඉදිරි දේශපාලන ප්‍රගතිය සඳහා ලියා තැබීමට වටිනා තරම් දේශපාලන චරිතයක් තිබුණු නායකයෙක් විධියට තමයි සුසිල් මුණසිංහ මැතිතුමා අපි පිළිගන්නේ. අවාසනාවට එතුමා ජීවත් වෙලා සිටි කාලය තුළ එතුමා මේ රටේ ලාංකීය දේශපාලනය තුළ බලය බෙදීමේ ක්‍රියාවලිය ස්ථාපිත කරන්න වෙහෙස මහන්සි වුණු ආකාරය සහ ඒ තුළ ක්‍රියාත්මකවීම පිළිබඳව නිවැරදි අධ්‍යයනයක් කර ගන්න බැරි වුණු නිසා අපට බොහෝ තොරතුරු, මේ රටේ අනාගත සුභසිද්ධිය සඳහා සොයා ගත යුතු බොහෝ තොරතුරු සොයා ගන්නට බැරි වුණාය කියන විශ්වාසය තමයි මට තියෙන්නේ.

මම ඉතාම සතුටු වුණා බස්නාහිර පළාත් සභාව පිහිටුවලා වසර 22 ක් පිරුනාට පස්සේ ඒ පළාත් සභා ක්‍රමය පිළිබඳ යම් ඇගයීමක් කරන්න සංවිධානය කරපු උත්සවයේදී අපේ පළාත් සභාවේ ප්‍රවෘත්ති අංශය මැදිහත්වෙලා තියෙනවා පළාත් සභා ඉතිහාසය පිළිබඳ පොතක් නිර්මාණය කරන්න. වාසනාවට එදා ඒ පොත නිර්මාණය කරද්දි සුසිල් මුණසිංහ මැතිතුමාගේ දේශපාලන අත්දැකීම ඒ පොත තුළ සටහන් කරන්න එතුමාගෙන් ලිපියක් ඉල්ලා ගන්න බස්නාහිර පළාත් සභාව කටයුතු කරලා

තියෙනවා. මේ නිසාම යම් ප්‍රමාණයක එතුමා පළාත් සභා ක්‍රමය පිළිබඳ දරාපු මතය සටහන් කර තබන්න අවස්ථාව අපට ඉඩකඩ ලැබුණාය කියන විශ්වාසය අප තුළ තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කැමතියි සුසිල් මුණසිංහ මැතිතුමා එදා පළාත් සභා ක්‍රමයට අවුරුදු 22 ක් පිරිච්ච වෙලාවේ එතුමා ලියපු ලිපියේ, ශ්‍රී ලංකා පළාත් සභාව ස්ථාපිත කිරීමේදී ලද සක්‍රීය අත්දැකීම් කියලා එතුමා ලියපු ලිපියේ එතුමා ලිපිය අවසන් කරන ආකාරය පිළිබඳ මේ සභාව දැනුවත් කරන්න. එතුමා ලිපිය අවසන් කරන්නේ මෙවැනි ඡේදයකින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,

*"මෙම ක්‍රමය ස්ථාපිත කර ආරම්භයේදී මතුවූ බාධක ජය ගෙන ඉදිරියට ගෙන යෑම සඳහා මා තරම් කාලය, ශ්‍රමය පමණක් නොව, විශේෂයෙන්ම පෞද්ගලික ධනය කැප කළ කිසිවෙකුත් මේ රටේ ඇතැයි මා විශ්වාස නොකරමි. ඒ කිසිදු පෞද්ගලික ලාභ ප්‍රයෝජනයක් සඳහා නොවන බව ඉඳුරාම කිව යුතුය. පළාත් සභා ක්‍රමය ස්ථාපිත කර ඒ හරහා මේ රටේ ජනතාවට, යම් සේවාවක් කිරීමට මගේ සිතේ, මටත් නොදැනීම ඒ තරමම*

[ ගරු මහේෂ් අල්මේදා ]

*උනන්දුවක් හා කැපවීමක් ඇති වී තිබුණි. ඒ පන්නරය තුළින් මා හට කළ හැකි උපරිම දේ, උපරිම අයුරින් මනා කැප වීමකින් හා අවංකවම ඉටු කළෙමි. විසි දෙවසරක් ගෙවුනු තැන අද වන විට පළාත් සභා යම් ප්‍රගතියක් ලබා තිබේද, ඒ හරහා මේ රටට, ජනතාවට සේවාවක් සිදු වන්නේද, එසේ නම් එයින් චඩාත්ම තෘප්තියට පත්වන පුද්ගලයින් අතර ඉදිරියෙන් සිටින්නා මා බව පෞද්ගලිකවම මා දනිමි. "*

ඔහු පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරලා, ඒක අවුරුදු විසි ගණනක් ඉස්සරහට ගියාට පස්සේ ඒ ක්‍රමයෙන් යම් සහනයක් ජනතාවට ලැබෙනවා නම්, එයින් තමන් තෘප්තිමත් වන බව තමයි මේ පළාත් සභා ක්‍රමය සක්‍රීය කිරීම පිළිබඳ අත්දැකීම් කියන ලිපියෙන් සඳහන් කරලා තියෙන්නේ. අපි සියලු දෙනාම දන්නවා. අපේ රටට නිදහස ලැබුණාට පස්සේ මේ රටේ තිබුණු ජනවාර්ගික ප්‍රශ්නයට රට ඇතුළෙන් අභ්‍යන්තරික විසඳුම් හොයා ගත යුතුයි කියන විශ්වාසය තමයි අසල්වැසි ඉන්දියාව දරපු ස්ථාවරය. ඒ නිසා 1978 එවකට ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා හැටියට හිටපු මොරාජි දේශායි මැතිතුමා ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ ජනකොටස් ශ්‍රී ලංකාවේ රජය සමග සියලු ප්‍රශ්න විසඳාගත යුතුයි කියන ප්‍රකාශය කරනවා. ඉතින් ඒ නිසා ඉන්දියාව විශ්වාස කරන්නේ, හැමදාම මේ රටේ අභ්‍යන්තරයේ තියෙන ප්‍රශ්නය මේ රටේ අභ්‍යන්තරය විසින් විසඳා ගත යුතුයි කියලා. නමුත් අපි දන්නවා. අපේ රටේ බලයේ හිටපු කිසිදු ආණ්ඩුවක් මේ අභ්‍යන්තරික ප්‍රශ්නය නිසි ආකාරව තේරුම් අරගෙන ඊට විසඳුම් සෙවීමේ සක්‍රීය ක්‍රියාවලියක නිරත වුණේ නැහැ. ඒ නිසාම 1983 වන විට මේ රටේ තිබුණු ජනවාර්ගික අසමගිය ලොකු ප්‍රචණ්ඩත්වයක් බවට පත් වෙලා රට පුරා අභ්‍යන්තරික ගැටළු, ප්‍රශ්න රාශියක් මතු වෙලා බුර බුරා නැගෙන ගිනි දළු බවට පත් වෙමින් තිබුණා. ඒ නිසාම රටේ හිටපු ද්‍රවිඩ ප්‍රජාව විශේෂයෙන් බුද්ධිමතුන්, ව්‍යාපාරික ප්‍රජාව මේ රටෙන් අයින් වෙලා යන්නේ බටහිර රටවල්වලට. ඒ අය පදිංචිය සඳහා තෝරා ගන්නේ බටහිර රටවල්. ඒ නිසාම ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විශ්වාස කරනවා, බටහිර රටවල් එක්ක තියෙන දේශපාලන සම්බන්ධකම්, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් වැඩි කර ගන්න ඕනෑ කියලා. ඒ නිසා ඉන්දියානු රජය අප දිහා සැකයෙන්, බයෙන් බලන්නේ. මේ බටහිර රටවල් සමග කරන සම්බන්ධකම් නිසාම ඔවුන්ගේ මැදිහත්වීම වැඩි වෙනවා. ඒ නිසා ඔවුන් මේ රටට පරිප්පු ගේනවා ගුවනින්. ගෙනැල්ලා පරිප්පු දානවා. මේ කාලවකවානුව වන විට සුසිල් මුණසිංහ මැතිතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ඉතාම සමීපතම මිත්‍රයෙක්. හැමදාම හැන්දෑවට සුසිල් මුණසිංහ මැතිතුමා තමන්ගේ පුරුද්දක් බවට පත් කර ගන්නවා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මුණ ගැහිලා සාකච්ඡා කරන එක.

සුසිල් මුණසිංහ මැතිතුමා නීතිවේදියෙක්. ඒ වාගේම ලෝකයේ විවිධ රටවල්වල ව්‍යවස්ථා පිළිබඳ අධ්‍යයනය කරපු කෙනෙක්. ඒ නිසා මේ ව්‍යවස්ථාවන් පිළිබඳව අධ්‍යයනය කරපු සුසිල් මුණසිංහ මැතිතුමාට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා යෝජනාවක් කරනවා. ඉන්දියානු ව්‍යවස්ථාව පිළිබඳ අධ්‍යයනය කරන්න කියලා. ඉන්දියානු බලය බෙදීම පිළිබඳව අධ්‍යයනය කරන්න කියලා. ඒ හරහා ඉහියක් පළ වෙනවා. මේ රටේ බලය බෙදීම පිළිබඳව යම් ක්‍රියා මාර්ගයකට යන්න, බලය බෙදීම පිළිබඳව ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා උත්සාහ ගන්නවා කියලා. ඒ අනුව තමයි, අපේ රටේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත වන්නේ. 1987 නොවැම්බර් මාසේ 14 වැනිදා හවස්වරුවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලංකාවේ පාර්ලිමේන්තුවේ සම්මත වෙනවා. මේ සම්මත වුණු පළමුවැනි වතාවේම එවකට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ඉතාම සමීප සම්බන්ධකම් පවත්වා ගෙන හිටපු හෝමාගම ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරයා, ඒ වාගේම එවකට ආණ්ඩුවේ හිටපු ප්‍රබල අමාත්‍යවරයෙක් වන ගාමිණී ජයසූරිය මැතිතුමා තමන්ගේ අමාත්‍ය ධුරයෙනුයි, තමන්ගේ හෝමාගම ආසනයේ සංවිධායක ධුරයෙන් ඉල්ලා අස්වෙනවා. ඒ නිසා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා යෝජනාවක් කරනවා, සුසිල් මුණසිංහ මැතිතුමාට හෝමාගම ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායක ධුරය භාර ගන්න කියලා. එතුමා දැඩි මානසික පීඩනයකට පත් වෙනවා. අපි කලින් සඳහන් කළා වාගේම, එතුමා පැවතෙන්නේ අනගාරික ධර්මපාල පරම්පරාවෙන්. ඒ නිසා තමන්ගේ දේශපාලන හැසිරීම, තමන්ගේ පරම්පරාවේ ගෞරවයට හානියක් වෙනවාද කියන මානසික වේදනාවට පත් වෙනවා. අවසානයේ ඔහු තීරණය කරනවා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ඉල්ලීම පරිදි හෝමාගම ආසනයේ සංවිධායක ධුරය ලබා ගන්න. ඒ කාලවකවානුව තුළ තමයි ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා හැන්දෑවේ කථා බහ කරන කොට එතුමාට යෝජනා කරන්නේ, බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ධුරය භාර

ගන්න ලැහැස්ති වෙන්න කියලා. එතුමා ලැහැස්ති වෙන්නේ ඒකට. නමුත් දවසක් හැන්දෑවේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා දුරකථන ඇමතුමක් දීලා ඔහුට මුණ ගැහෙන්න කියලා ඔහුට කියනවා බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය ධූරයට තරග කිරීම සඳහා සූදානම් වෙන්න කියලා. ගාමිණී දිසානායක මැතිතුමාගේ උණුසුම් සුභපැතුම් ඒ අවස්ථාවේ සුසිල් මුණසිංහ මැතිතුමාට ලැබෙනවා. නමුත් බරපතළ ප්‍රශ්නයක් මතු වෙනවා. 1988 පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරද්දී රටේ තියෙන දේශපාලන තත්ත්වයන් නිසා එතුමාට බැරි වෙනවා නියම දේශපාලන ක්‍රියාවලියක නිරත වෙන්න. කෙසේ නමුත් පළාත් සභා ක්‍රමය ස්ථාපිත කළා මැතිවරණයෙන් පස්සේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත වුණාට පසුව තමයි එතුමා බරපතළම ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දෙන්නේ. පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමේ නීති සියල්ල සම්පාදනය වුණේ සති ගණනාවක් තුළදී. අපි දන්නවා. අද ප්‍රඥප්තියක් සම්මත කරන්න කොපමණ කාල වකවානුවක් යනවාද කියලා. ප්‍රඥප්තිය සම්මත කරන්න. නමුත් මේ කටයුත්ත ඉතාම වේගයෙන් සිද්ධ වෙනවා. ඒ නිසාම පළාත් සභාවේ මහ ඇමති තේරී පත් වන කොට මේ පළාත් සභාවට ආණ්ඩුකාරවරයෙක් තෝරා පත් කරලා නැහැ. ඒ නිසා මහ ඇමති දිවුරුම් දෙන්නේ කොහේද කියන ප්‍රශ්නය මතු වෙනවා. අවසානයේදී තමයි, ෂර්වානන්ද මැතිතුමා ඉතාම දක්ෂ නඩුකාරවරයෙක්. මේ පළාත් සභාවේ ප්‍රථම ආණ්ඩුකාරවරයා බවට පත් වෙන්නේ. එතුමා ඔහු ඉස්සරහ දිවුරුම් දෙන කොට බස්නාහිර පළාත් සභාවට ප්‍රධාන ලේකම්වරයෙක්, ආණ්ඩුකාර ලේකම්වරයෙක් ප්‍රධාන අමාත්‍ය ලේකම්වරයෙක් කිසි කෙනෙක් නැහැ. මේ තනතුරු කිසිවක් නැතුව තමයි, එතුමා ප්‍රධාන අමාත්‍ය ධූරයේ දිවුරුම් දෙන්නේ. ඒ නිසා එතුමාට සිදු වෙනවා මේ තනතුරු සඳහා නිලධාරීන් පත් කර ගන්න. සුසිල් මුණසිංහ මැතිතුමා මේ ක්‍රමයට කොතරම් ආදරය කරනවාද, රටේ දේශපාලන ප්‍රශ්න විසඳ ගන්න මේ ක්‍රමය කොතරම් පාවිච්චි කරන්න පුළුවන්ද කියන කාරණා පිළිබඳ හොඳ අවබෝධකින් ඉන්න නිසාම එතුමාගේ පෞද්ගලික ව්‍යාපාරවල සිටින නිලධාරීන් ගෙනැල්ලා පළාත් සභා ක්‍රමයේ නිලධාරීන් බවට පත් කරනවා. ඔහුගේ වාහන ගෙනැල්ලා පළාත් සභාවේ වාහන බවට පත් කරනවා. ෂර්වානන්ද මැතිතුමා ආණ්ඩුකාර ධූරය භාර ගත්තාට පස්සේ එතුමාට හම්බ වෙන පළමුවැනි නිල වාහනය සුසිල් මුණසිංහ මැතිතුමගේ පෞද්ගලික වාහනයක්. පෞද්ගලික වාහනයෙන් තමයි ෂර්වානන්ද මැතිතුමාට සේවාවන් සපයා ගන්න අවශ්‍යතාවන් සම්පූර්ණ කරලා දෙන්නේ. එතරම් මේ බල ව්‍යුහය මේ රට තුළ ස්ථාපිත කරන්න උනන්දු වෙනවා. ඒ නිසා තමයි පළාත් සභා ක්‍රමය අද පල්ලෙහාට ගලා ගෙන ඇවිත් තියෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා ඒ පළාත් සභා ක්‍රමය පිහිටුවලා අවුරුද්දක් විතර යන කොට ජේ.ආර්. ජයවර්ධන



මැතිතුමා ලාංකීය දේශපාලනයෙන් ඉවත් වෙලා යනවා. එතකොට මේ පළාත් සභා ක්‍රමය ගෙන යන්න මූල්‍ය සම්පත්, පහසුකම්, නිලධාරීන් කිසිවක් නැතිව යන කොට එවකට සිටි ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මුණ ගැහෙනවා. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා කියනවා මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරපු මිනිස්සුත් එක්ක ගිහිල්ලා මේවා බේරා ගන්න. එක සම්පතක්වත් පහසුකමක්වත් දෙන්නේ නැහැයි කියලා. සුසිල් මුණසිංහ මැතිතුමා තවත් අසීරුතාවට පත් වෙනවා. නමුත් ඒ අභියෝග සියල්ල භාර අර ගෙන පළාත් සභා ක්‍රමයේ නීතිමය රාමුව ස්ථාපිත කරන්න එතුමා කටයුතු කරනවා. ඒ හරහා තමයි විශාල බල ව්‍යුහයක් අපි සම්පාදනය කර ගන්නේ. විශේෂයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, එවකට පළාත් සභාවේ හිටපු කෘතහස්ත දේශපාලනඥයෙක් වූ බර්නාඩ් සොයිසා මැතිතුමා හරහා නිර්මාණය කරනවා. ඒ වාගේම පළාත් සභා ප්‍රවාහන අධිකාරිය එතුමා නිර්මාණය කරනවා. ලංකාවේ පෞද්ගලික ප්‍රවාහන සේවය ඉතාම අවිධිමත්ව තියෙන කාලයේ ඒක විධිමත් කරන්න තමයි පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිහිටුවන්නේ. ඒ අවස්ථාවේදී එතුමා ඉතාමත් වැදගත් පියවරක් ගන්නවා. ඒ තමයි පළාත් සභාව ඇතුළේ පෞද්ගලික ප්‍රවාහන සමාගමක් පිහිටුවන්න කටයුතු කරනවා. එතුමා චීන සමාගමකින් බස් තුනක් ඇණවුම් කරනවා, ලංකාවට ගේන්න. පළාත් සභා ක්‍රමයට කොයිතරම්, එවකට හිටපු නායකත්වය විරුද්ධ වෙනවාද කිව්වොත් මේ බස් තුන නිදහස් කර ගෙන සේවයේ යොදවා ගන්න අවස්ථාව, ඉඩ කඩ දෙන්නේ නැහැ දේශපාලන අධිකාරිය. ඒ නිසා සුසිල් මුණසිංහ මැතිතුමා එතුමාගේ පෞද්ගලික ධනය යොදවලා මේ බස් තුන රේගුවෙන් නිදහස් කර ගෙන මේ සමාගම ස්ථාපිත කරන්න උත්සාහ කරත් ඒක ඉස්සරහට ගෙන යන්න බැරිව යනවා. දේශපාලන අධිකාරියේ සහයෝගය නැති නිසා. සුසිල් මුණසිංහ මැතිතුමාට අවස්ථාවක් තිබුණා, තමා මහ ඇමති වුණාට පස්සේ තමාගේ අමාත්‍ය මණ්ඩලය තමා විසින් තෝරා පත් කර ගෙන ඉදිරියට ගෙන යන්න. එතුමා ලියපු ලිපියේ ඉතාම පැහැදිලිව කියනවා, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා අමාත්‍ය මණ්ඩලයට පත් කරන්න කියලා යෝජනා කරපු එකම නම යුසුෆ් මන්ත්‍රීතුමාගේ නම විතරයි කියලා. අනෙක් කිසිම කෙනෙක් රටේ නායකයා හැටියට යෝජනා කරපුවා නොවෙයි. තොණ්ඩමන් ඇමතිතුමා ද්‍රවිඩ ජාතීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඇමතිකමක් ඉල්ලනවා විවිධ ලිපිගොනු ගෙනැල්ලා. ඒ අනුව ද්‍රවිඩ ජාතික සෙල්ලසාමි ඇමතිවරයා පත් කරනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා එතුමාගේ ලේකම්වරයෙක් පත් කරන්න කියලා කියනවා. ඒ අනුව සුරනිමල රාජපක්ෂ මැතිතුමාව අමාත්‍ය මණ්ඩලයට පත් කරනවා. ඒ වාගේම කෘෂිකර්මය පිළිබඳව හසල දැනුමක් තිබුණු එවකට තිබුණු සංවර්ධන සභාවේ සභාපති ඇල්මන් පීරිස් මැතිතුමාව පත් කරන්න එතුමා ස්වාධීනව තීන්දු ගන්නවා. ඒ හරහා තමයි පළමුවැනි අමාත්‍ය මණ්ඩලය බස්නාහිර පළාත් සභාවේ පිහිටුවන්නේ. එවකට පළාත් සභාවලට ස්වාධීනත්වය කොතරම්ද කියන කාරණය අපට පැහැදිලි වෙනවා. කිසිම දේශපාලන බලපෑමක් නැතුව අමාත්‍ය මණ්ඩලය තෝරා පත් කර ගන්න අවස්ථාව ලැබෙනවා. ඒ ඔස්සේ

තමයි සුසිල් මුණසිංහ මැතිතුමා අවුරුදු ගණනාවක් පළාත් සභාව ස්ථාපිත කරලා ඉදිරියට ගෙන යන්නේ. ඒක ඉතාම හොඳ පියවරක්. මේ රටේ පළාත් සභා ක්‍රමය ඉස්සරහට යන්න. කෙසේ නමුත් එතුමාට පළාත් සභා ක්‍රමයේ බොහොම ටික කාලයයි කටයුතු කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඊට පස්සේ ඔහු පළාත් සභා දේශපාලනයෙන් අයින් වෙනවා. හැබැයි අපි කියන්න ඕනෑ තීරණාත්මක කාරණාවක් තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගාමිණී දිසානායක මැතිතුමා ලංකාවේ ජනාධිපති මැතිවරණ අපේක්ෂකයා වුණාට පස්සේ ඔහුගේ ප්‍රබලම අනුගාමිකයා වෙන්නේ සුසිල් මුණසිංහ මැතිතුමා. සුසිල් මුණසිංහ මැතිතුමාට ගාමිණී දිසානායක මැතිතුමා පොරොන්දුවක් දෙනවා, ඔහු ජනාධිපති වුණාට පස්සේ ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරය ඔහුට දෙනවා කියලා. මේක ලංකාවේ දේශපාලනයේ අප්‍රකට කාරණයක්. මේ කාරණයම තමයි ඔහුට දේශපාලනයෙන් ඉවත් වෙලා යන්න බලපාන්නේ. ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ නායකයා වන අදත් එක්සත් ජාතික පක්ෂයට බලපාලා තියෙන ප්‍රශ්නය ඒ පක්ෂයේ ඉන්න ඉතාම හොඳ දේශපාලන නායකයෝ, ක්‍රියාකාරී දේශපාලන නායකයෝ ජනතාවට ආදරය කරන දේශපාලන නායකයෝ දේශපාලනයෙන් ඉවත් වෙලා යන පරිසරය අද නිර්මාණය වෙලා තියෙනවා. ඒක

[ ගරු මහේෂ් අල්මේදා ]

ඇති වෙන්න බලපාපු මූලිකම කාරණය තමයි සුසිල් මුණසිංහ මැතිතුමා. එදා ගාමිණී දිසානායක මැතිතුමාට උදව් කරන්න තීන්දු කරපු නිසාම රනිල් වික්‍රමසිංහ මැතිතුමා දේශපාලනයේදී ඔහුට කරන්න තියෙන සියලු කෙනෙහිලිකම් කරනවා. ඒ හරහා තමයි සුසිල් මුණසිංහ වාගේ වටිනා දේශපාලන නායකයෙක් ලාංකීය දේශපාලනයට නැති වෙලා යන්නේ. අදත් ලංකාවේ දේශපාලන නායකයෝ රාශියක් තමන්ගේ පක්ෂය හැර දා යන්නේ මේ දේශපාලන කෙනෙහිලිකම් නිසා. මේක අද එක්සත් ජාතික පක්ෂයේ බහුලව වෙනවා. ඒ නිසා රටට හොඳ විපක්ෂයක්, රටේ දේශපාලනයේ මතු කරන්න තිබෙන කාරණා මතු කරන්න පුළුවන් දේශපාලන නායකයෝ අහිමි වෙගෙන යනවා. ඒ හරහා තමයි සුසිල් මුණසිංහ මැතිතුමාගේත් ලාංකීය දේශපාලනයේ ක්‍රියාත්මක වීම හමාර වෙන්නේ කියන කාරණ අපට තිබෙනවා. ඒක ඇත්තටම දේශපාලන වශයෙන් ඛේදවාචකයක්. රටේ ප්‍රගමනයට වැඩ කරන, රටේ සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක වන දේශපාලනය තේරෙන ප්‍රායෝගික දේශපාලඥයෝ දේශපාලනයෙන් අයින් වෙලා යන එක, දේශපාලනයේ ක්‍රියාත්මක නොවී ඉන්න එක සමස්තයක් විදියට කල්පනා කරනකොට මේ රටට පාඩුවක්, වේදනාවක්, දුකක්. ඒ අවස්ථාව මේ රටට උදා වුණා සුසිල් මුණසිංහ මැතිතුමා දේශපාලනයෙන් ඉවත් වීම තුළ. කෙසේ නමුත් අපට කියන්න තිබෙන්නේ සුසිල් මුණසිංහ මැතිතුමා ලාංකීය දේශපාලනය තුළ ඉතාම වැදගත් දේශපාලන භූමිකාවක් රඟ දක්වපු දේශපාලන චරිතයක්. විශේෂයෙන් පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරද්දී ඔහු කරපු කැප කිරීම මෙරට දේශපාලන ඉතිහාසය තුළ මකා දමන්න බැරි ඓතිහාසික අවස්ථාවක් බව සඳහන් කරමින් අපේ ආගමේ විදියට සුසිල් මුණසිංහ මැතිතුමාට අමාමහ නිවන් සුව අත් වේවා කියා ප්‍රාර්ථනය කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)

Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බස්නාහිර පළාත් සභාවේ ප්‍රථම ප්‍රධාන අමාත්‍යවරයා හැටියටත්, පසු කාලීනව පළාත් සභාවේ විපක්ෂ නායකවරයා හැටියටත් ඉතාමත් කීර්තිමත් සේවයක් මේ පළාත් සභාව වෙනුවෙන් ඉටු කළ අභාවප්‍රාප්ත ගරු සුසිල් මුණසිංහ මැතිතුමා පිළිබඳව ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව ඉදිරිපත්ව ඇති මේ මොහොතේ කළුතර දිස්ත්‍රික්කයත් සමග යාවජීව සම්බන්ධකමක් තිබුණු, ඒ වාගේම සමස්ත පළාත් සභාවට ඉතාමත් වටිනා ආදර්ශයක් ලබා දුන්නු ප්‍රජා නායකයෙක් පිළිබඳව වචනයක් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමව ඔබතුමියට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න කැමැතියි. පළාත් පාලන ආයතන නියෝජනය කරපු ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා වාගේම එතුමා සමග මට ඇසුරට පත් වෙන්න ලැබෙන්නේ, 1991 පානදුර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට. ඒ කාල පරිච්ඡේදයේ මගේ ජීවිතයේ කවදාවත් අමතක නොවන කාරණා දෙකක් සිහියේ තිබෙනවා. මම ඒ දෙක පමණක් මේ අවස්ථාවේදී ප්‍රකාශයට පත් කරන්න කැමැතියි. මට මතකයි මම පානදුර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ඉන්නකොට මුල් අවදියේ ආර්ථික වශයෙන් සභාවට එපමණ ශක්තියක් තිබුණේ නැහැ. සභාව භාර ගන්නකොට රුපියල් 23,464 ක් තමයි ප්‍රධාන ගිණුමේ ශේෂය හැටියට තැන්පත්ව තිබුණේ. නමුත් මට ඒ දවස්වල අවශ්‍යව තිබුණා, වේලා සටහන් යන්ත්‍රයක් මෙම සභාවේ සවි කරන්න. මම ආයතනයකින් යන්ත්‍රයක් ගෙනැල්ලා පෙර දැක්මක් සඳහා සවි කළා. පසුව මේ යන්ත්‍රය ගන්න කියලා සභාවට යෝජනාවක් ඉදිරිපත් කරපු වෙලාවේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ යන්ත්‍රය සවි කරන්න සභාව අනුමැතිය දුන්නේ නැහැ. එය සවි කරන්න එදා අනුමැතිය නොදුන්නේ, සභාවේ මූල්‍ය ප්‍රශ්නයම නිසා නොවෙයි. මේ වේලා සටහන් යන්ත්‍රය සවි කරනවාට සභාවේ සේවකයෝ විශාල ප්‍රමාණයක් අකැමැති වුණා. ඒ නිසා ඔවුන් මගේ මන්ත්‍රීවරුන් සමඟ කථා බහ කරලා, සභාවේ මේ යෝජනාව ඉදිරිපත් කරපු වෙලාවේ මන්ත්‍රීවරුන් ඒකට විරෝධය ප්‍රකාශ කළා. මා පසු දින කොළඹට ඇවිල්ලා, පසුගිය දවස්වල සභා ලේකම් කාර්යාලය තිබුණු ගොඩනැගිල්ලේ තමයි එතුමා ප්‍රධාන අමාත්‍යවරයා හැටියට ඒ දවස්වල රාජකාරී කටයුතු කළේ. එතුමාට ප්‍රකාශ කළාම එතුමා කිව්වා, සභාපතිතුමා මේක ඔතැන විතරක් නොවෙයි සවි කරන්න ඕනෑ. සෑම තැනකම සවි කරන්න ඕනෑ යන්ත්‍රයක්. ඒක ක්‍රියාත්මක කරනවාට මන්ත්‍රීවරුන්ට වැඩිය සේවකයෝ අකැමැති ඇත්තේ. තමුන්නාන්සේ දැන් යන්න. මම ඒකට අවශ්‍ය කරන මුදල්

ප්‍රමාණය පළාත් සභාවෙන් ගෙවනවා කියලා එතුමා කිව්වා. ඒ වාගේ මහ පුදුම විධියට පළාත් සභා ක්‍රමය සහ මේ රටේ පරිපාලන රටාව විධිමත් කිරීමේ දැවැන්ත අවශ්‍යතාවයක් තිබුණු, ඒ වෙනුවෙන් සැබවින්ම කැප වුණු නායකයෙක්.

ඒ වාගේම මට මතක් වෙනවා, හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ එවකට කළුතර තිබුණු ජංගම සේවය අවස්ථාවේදී එක ප්‍රාදේශීය සභාවකට මිලියනයක්, ලක්ෂ 10 ක මුදල් ප්‍රමාණයක්. එවකට ඒ ජංගම සේවකයින් සඳහා අවශ්‍ය කරන කටයුතු කරන්න ලබා දෙන්න තීන්දු කරලා, අපෙන් යෝජනා ඉල්ලුවා. මාර්ග සංවර්ධන කටයුතුවලට, විවිධ ප්‍රජා අවශ්‍යතාවයන් සැපිරීම සඳහා අවශ්‍ය කරන යෝජනා. මට මතකයි මම මිලියන 3.6 ක යෝජනා හදාගෙන ගියා. අපට කථා කළේ මිලියනයක යෝජනා දෙන්න. ගිහිල්ලා එතුමාට ඉදිරිපත් කළාම එතුමා කිව්වා, ඉල්ලුවේ මෙච්චරයි. මෙපමණ ප්‍රමාණයක් දෙන්න විධියක් නැහැයි කියලා. මම කිව්වා ගරු ප්‍රධාන ඇමැතිතුමනි, මගේ ප්‍රදේශයේ මෙපමණ අඩුපාඩුකම් යෙදිලා තිබෙනවා. ඒ නිසා මට පුළුවන් උපරිම ප්‍රමාණය දෙන්න කිව්වාම මට රුපියල් දහනව ලක්ෂ හැට පන්දාහක් දුන්නා. එදා ඒ රුපියල් දහනව ලක්ෂ හැට පන්දාහක මුදලින් පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා තමයි මම පළාත් සභාවට ආවේ. මේක මම ඉතාමත් නිහතමානීව ගෞරවයෙන් සිහිපත් කරනවා. මගේ සමස්ත මන්ත්‍රී මණ්ඩලයට ඒ දවස්වල ලක්ෂ 20 කට අදාළ මුදල් ප්‍රමාණයක් කිව්වාම මහ දැවැන්ත මුදල් ප්‍රමාණයක්. මේ මුදල් ප්‍රමාණයෙන් සමස්ත ප්‍රාදේශීය සභාව තුළ විශාල සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කරලා, ජනතාවට දැනෙන සේවයක් කරන්න අපට එදා පුළුවන්කම ලැබුණා. මේ වාගේ වැඩ කරන තැනට, වැඩ කරන මිනිස්සුන්ට උදව් කරලා, ආශිර්වාද කරලා, මඟ පෙන්වලා, ආධුනිකයින් හැටියට අපි එදා පළාත් පාලන ආයතන භාර ගත්තු වෙලාවේ තාත්තා කෙනෙක් වාගේ අවශ්‍ය වෙලාවට ආණ්ඩු පක්ෂයේද විපක්ෂයේද කියලා බලන්නේ නැතුව නිවැරැදිව කථා කරලා පැහැදිලිව ගමන් මාර්ගය පෙන්නුම් කරපු නායකයෙක් හැටියට තමයි එතුමා ක්‍රියා කළේ. ඒ නිසා හදවතේ ඉතාම ගැඹුරුම තැන සදාකාලයෙන් සදාකාලයට එතුමාගේ රූපය තැන්පත් වෙලා තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේ සභාවේ සියලු දෙනා ඉතාමත් ප්‍රසාදයෙන්, ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියලා එතුමා ගැන කථා කළේ නැහැ. අපි ඩඩ්ලි සේනානායක මැතිතුමාට, ඩී.එස්. සේනානායක මැතිතුමාට ආදරය කරනවා වාගේම විපක්ෂයේ හිටියත් එදා සුසිල් මුණසිංහ මැතිතුමාට ආදරය කරන්න හුරු පුරුදු වෙලා හිටියා. එතුමාගේ ගුණ ධර්ම සහ චර්යාත්මක සිද්ධීන් නිසා. මෙතුමා කිව්වා වාගේ ධර්මපාල පරපුරෙන් පැවතගෙන ආපු එතුමා මදුවිත, දුම්වැටිය කවදාවක්වත් මුව තිබ්බේ නැති ඉතාමත් ආදර්ශවත් ශ්‍රේෂ්ට නායකයෙක් හැටියට අප සමාජය තුළ ජීවත් වුණේ. ඒ නිසා ඒ සුවිශේෂී චරිතයකට සදාකාලයෙන් සදාකාලයට අපේ ගෞරවය, ප්‍රණාමය හිමි වන අතර, පළාත් සභා ක්‍රමය තුළ මූලාරම්භය ඇති කරපු ඒ ශ්‍රේෂ්ට නායකයාට අපේ උපහාරය පුද කරමින් දයාබර සුසිල් මුණසිංහ මැතිතුමනි, සසර ගමන බොහොම දුරයි. අපි බෞද්ධයින් හැටියට මේ ගමන බොහෝ දුර යන්න තිබෙනවා. ඒ නිසා උපදින ආත්මයක් තුළ නැවත ඔබ මුණ ගැසීමේ අපේක්ෂාවත් අපේ හදවත් තුළ තිබෙනවා. අවසානයේ උතුම් වූ නිවනින් ඔබට සැනසීම අත්පත් වේවා කියලා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගෙන් අවසරයි. මේ පළාත් සභාවේ පළමුවැනි මහමාත්‍යවරයා විධියට කටයුතු කරපු ඒ වාගේම දෙවැනි පළාත් සභාව තුළ විපක්ෂ නායකවරයා ලෙස කටයුතු කරපු පසුව පාර්ලිමේන්තුවටත් තේරී පත් වුණු ඉතාම හොඳ ක්‍රියාශීලී දේශපාලන නායකයෙක් පිළිබඳව තමයි අද දවසේ සාකච්ඡා කරන්න සූදානම් වෙන්නේ. ඇත්තෙන්ම එතුමා පළමුවෙන්ම පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්න ඉස්සෙල්ලා හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ දිවංගත ගාමිණී ජයසූරිය මැතිතුමාගේ අමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් පස්සේ තමයි සුසිල් මුණසිංහ කියන මහත්මයා මට දැන හඳුනගන්න පුළුවන්කමක් ඇති වුණේ. අපේ එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩලය ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එවකට සිරිකොතට කැඳවලා තිබුණා. අපි විවිධ පුද්ගලයෝ හෝමාගම ආසනය සඳහා නම් කරන වෙලාවේදී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කිව්වා තමුන්නාන්සේලාට අහිමි වුණේ ධර්මපාල පරපුරේ එක් පුරුකක්. ඒ ධර්මපාල පරපුරෙන්ම මම මේ හිඩැස පුරවනවා කියලා තමයි සුසිල් මුණසිංහ මහත්මයා එදා දවසේ අපට හඳුන්වලා දුන්නේ. ඒ අනුව හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා හැටියට කටයුතු ආරම්භ කළා. හැබැයි, මම හිතන්නේ ඊත් එක්කම පළාත් සභා ඉන්දු - ලංකා ගිවිසුම හරහා ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තාම විශාල අභියෝග ගණනාවකට ඔහුට මුහුණ දෙන්න සිද්ධ වුණා. පළාත් සභා මැතිවරණය ඉල්ලන වෙලාවේදී මහ ඇමැති අපේක්ෂකයා හැටියට එතුමාගේ නාම යෝජනා පත්‍රය අත්සන් කළේ මමයි. ඊත් එක්කම එතුමා එක්ක දීර්ඝ කාලයක් තිස්සේ එකට වැඩ කරන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා මම මතක් කරන්න කැමැතියි එතුමා ඊට ඉස්සෙල්ලා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා හැටියට කටයුතු කළා. 1970 දී. හැබැයි එහේ කටයුතු කරද්දීත් එතුමා අසාධාරණයට ලක් වුණා. මට මතකයි ඒ පුවත්පතේ ලියවිල්ල තවම තිබෙනවා. ගුවන් සභාපති, ගුවනේදී අස් කරයි. එතුමා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා හැටියට තමයි කටයුතු කළේ. පිටරට ගිහිල්ලා ඉඳලා එතුමා ගුවන් යානයේ එනකොට ගුවන් විදුලි සංස්ථාවේ සභාපති පදවියෙන් එතුමා අස් කරලා තිබුණා.

ඉන් අනතුරුව තමයි මේ දේශපාලන භූමිකාව වෙත එතුමා කිට්ටු වුණේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එක්ක ඉතාම කිට්ටු,

ළඟ, පස මිතුරු ඇසුරක් තිබුණු නිසාම, එතුමා ධර්මපාල පරපුරේ පුරුකක් වූ නිසාම හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ ආන්දෝලනාත්මක චරිතයක් විධියට අද මේ ඇමැතිකම්වලට පෙරේතකමේ දහලන සමාජයක දේශපාලඥයන්ට ආදර්ශයක් දෙමින් ඇමැතිකම් වෙනුවෙන් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා වාගේ උදවිය ඇවිටිලි කරද්දී මේ තීන්දුවට මට එකඟ වෙන්න බැහැයි කියලා ඇමැතිකම දාලා ආපු, රටේ ගෞරවයට ලක් වුණු එකම මනුස්සයා ගාමිණී ජයසූරිය මැතිතුමාය කියන එක මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ. ඒ වෙලාවේ තමයි එතුමා ධර්මපාල පරපුරේ සාමාජිකයෙක් විධියට හෝමාගමට පත් කළේ. ඒ අනුව අපි පළාත් සභා මැතිවරණය වෙලාවේදී විශාල අභියෝගයකට මුහුණ දුන්නා. එතුමාගේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය තිබුණේ සභා ලේකම් කාර්යාලය තිබුණු ගොඩනැගිල්ලේ. හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ පමණක් 58 දෙනෙක් මැරුවා. ක්‍රියාකාරී එක්සත් ජාතික පාක්ෂිකයෝ 58 දෙනෙක් මැරුණා. ඒ පළාත් සභා මැතිවරණයට තරග කරනකොට මේ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් වන ධර්මසේන මැතිතුමාගේ ගෙදරට පැනලා දුවලා දෙන්නා, ඇඳේ හිටපු තාත්තා, ගෙදර හිටපු හය දෙනෙක් එකතැන වෙඩි තියලා මැරුවා. ඒ නිසා ඒ පළාත් සභා මැතිවරණ කාල පරිච්ඡේදය තුළ සුසිල් මුණසිංහ මැතිතුමා කොයි ආකාරයෙන් වැඩ කළාද කියලා කිව්වොත් හෝමාගම ක්‍රියාකාරී මිනිස්සුන්ව සමහර වෙලාවට එතුමාගේ ජාවත්තේ තිබුණු නිවසේ

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

නවත්වා ගත්තා. එහෙම නැත්නම් රාත්‍රී කාලයේ ඔය සභා ලේකම් කාර්යාලය තිබුණු ගොඩනැගිල්ලේ තමයි බොහෝ දෙනෙක් නැවතිලා හිටියේ. එක අවස්ථාවකදී ග්‍රාම නිලාධාරී කෙනෙකුට වෙඩි තිබ්බා. ඒ ග්‍රාම නිලධාරීවරයා ගෙන්නලා ගෙදර තියා ගත්තා. රාත්‍රී කාලයේ ඇවිල්ලා සභා ලේකම් කාර්යාලයේ නිදා ගන්නවා. හැබැයි පළමුවැනි වර වෙඩි තැබීමෙන් එතුමා පරිස්සම් වුණත්, දෙවැනි වර පරිස්සම් වෙන්න බැරි වුණා. වෙඩි තියලා මැරුවා. ඒ නිසා එවැනි ආකාරයට ක්‍රියාකාරීවම, මිනිස්සු ගැන හිතපු, තමන්ට උදව් උපකාර කරපු නායකයෙක් විධියට මනුස්සකම නිසාම හෝමාගම මැතිවරණ කොට්ඨාශය තුළ ඉතාම කීර්තියට පත් වුණු මනුස්සයෙක්. අපි දන්න විධියට එතුමා කොයි තරම්ද කියලා කියනවා නම්, හැම පැත්තෙන්ම, දැනුමෙන්, අවබෝධයෙන් ජනයා තේරුම් ගන්න පුළුවන්කමක් තිබුණු, අද සමාජයේ සාකච්ඡා වන බලමාළු කාපු දේශපාලඥයෙක්. දැන් උදාහරණයක් විධියට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා එතුමා ගැන මතක් කළා. මම නම් ඒක දැක්කේ එක්තරා රචනාවක් කියෙව්වා වාගේ. එතුමා කිව්වා මේ සභාවට බස් ගෙනාවා. මේ සභාවට බස් ගෙනාවාම මේ ඉන්න නිලධාරීන්ට ප්‍රශ්නයක් වුණා, ඒ බස්වලට රේගුවේදී බදු ගෙවන්න. එතුමාගේ පුද්ගලික මුදල්වලින් තමයි ඒ බස්වලට මුදල් ගෙව්වේ. එතුමාම කියනවා ශර්වානන්ද මැතිතුමාට වාහනය දුන්නා කියලා. අද අපේ ඉන්න සමහර පුද්ගලයන්ට වාහනයක් දෙනවා තියා දැන් වාහන අර්බුදය මේ සභාව තුළ කොයි තරම් ආන්දෝලනාත්මකද කියලා අපට තේරෙනවා. මෙවැනි කීර්තිමත් වැඩ කොටසක් කරපු පුද්ගලයෙක් විධියට සුසිල් මුණසිංහ මැතිතුමා මම හිතන්නේ, මේ පළාත් සභාව තුළ බොහොම ගෞරවාන්විතව මහමාත්‍ය ධුරය හෙබෙව්වාය කියන එක මතක් කරන්නට ඕනෑ. අපේ ගරු සෞඛ්‍ය ඇමැතිතුමා මතක් කළා එතුමා කොයි තරම් හොඳට පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව කටයුතු කළාද කියලා. එතුමා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ඉන්දැද්දිත් සල්ලි ලක්ෂ 10 යි, මිලියනයි දෙන්න ඉල්ලුවේ. 30 ට හදාගෙන ගියා. පස්සේ 19 ක් දුන්නා කියලා. එතුමා දේශපාලන භේදයෙන් තොරව වැඩ කරපු ආදර්ශ ගැන කිව්වා. මම හිතන්නේ මේ ඇමැතිවරුන්ටත් ඒ ආදර්ශය ගන්න හොඳම වෙලාව. දැන් වෙලා තියෙන්නේ තමන්ගේ එවුන්ට ඇරෙන්න ශත පහක් - විපක්ෂයේ නම්, ශත පහක් ලැබෙන්නේ නැහැ. ඒක තමයි -

[සභාවේ ඝෝෂා]

දැන් සමහර තැන්වල ඇමැතිවරුන්ගේ තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කරුණාකර එතුමාට කථා කරන්න දෙන්න. කාලය වේගයෙන් ගෙවීගෙන යනවා. තවත් ශෝක යෝජනාවක් සාකච්ඡා කරන්නත් තියෙනවා. ඒ පවුලේ අයත් ඇවිල්ලා ඉන්නවා. ඒ ශෝක යෝජනාවත් සාකච්ඡාවකට ගන්න ඕනෑ. කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සමහර අමාත්‍යවරුන්ට එහෙම උවමනාවක් තිබුණත්, සමහර අමාත්‍යවරු කියනවා, අනේ මන්ත්‍රීතුමා අපට දෙන්න විධියක් නැහැ. සමහර ඒවා දුන්නාම කණ්ඩායම් රැස්වීමේ අපට ලෙඩ ඇදෙනවා. කොයි තරම් හොඳ කණ්ඩායමක්ද බලන්න ඉන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමා ශෝක යෝජනාවට අදාළව කථා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉතින් මම කියන්නේ සුසිල් මුණසිංහ මැතිතුමාගේ චරිතය මේ තරම් හොඳ ගෞරවාන්විත චරිතයක් බවට පත් වුණේ අර අනුව ක්‍රියා කරලා. ඒක අද ආදර්ශයට අරගෙන මේ සභාව තුළ කථා කරනවා. මම හිතන්නේ කවුරුත් තේරුම් ගන්න ඕනෑ දෙයක් තමයි මොන ඇමැතිකම් දැරුවත් මැරෙනවා. මැරුණු වෙලාවකදී හරි මේ සභාව තුළ එහෙම කථා කරන්න පුළුවන් ගෞරවයක් හදාගෙන මැරෙන්න පුළුවන් නම් ඒක තමයි තිබෙන ලොකුම දේ. ඉතින් ඒ නිසා මම මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන්ම සුසිල් මුණසිංහ මැතිතුමා එක්ක මේ සභාව තුළ වැඩ කටයුතු නොකළත් හෝමාගම ආසනය භාරව හිටපු සංවිධායකවරයා හැටියට එතුමා ගත්තු ක්‍රියා මාර්ග මිනිස්සුන්ට - මැතිවරණ කාලයේදී වැඩ

කළ සමහර මිනිස්සුන්ගේ පවුල්වල අය මරලා දැම්මාම ඒ මිනිසුන්ගේ ගෙවල්වලට අවශ්‍ය මූලික සියලු දේ ගෙවල් දොරවල් හදලා දීලා, සියල්ලම කරපු පුද්ගලයෙක්, එතුමා. තමන්ගේ පුද්ගලික මුදල සමාජ වැඩවලට බොහෝ විධියට යෙදවුවා. හැම දෙයක්ම තමන්ගේ අතේ තිබෙන මුදල්වලින් තමයි කළේ. ඒ නිසා එවැනි ආදර්ශවත් චරිතයක් වර්තමානයේ දේශපාලඥයන්ට ආදර්ශයක්ම වේවා. අවසානයේ එතුමාට නිවන් සැප අත් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු සුසිල් මුණසිංහ හිටපු ප්‍රධාන අමාත්‍යතුමා ඒ වාගේම අපේ හිටපු විපක්ෂ නායකතුමා සම්බන්ධව මේ ශෝක යෝජනාවේ අදහස් පළ කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම කියන්න ඕනෑ, අපේම පක්ෂයෙන් බිහි වුණු ප්‍රධාන අමාත්‍යවරයෙක්. අපේම පක්ෂයෙන් බිහි වුණු පළාත් සභාවක අමාත්‍ය ධූරය දරලා විපක්ෂ නායක ධූරයත් දරන අවස්ථාවේ අපි විපක්ෂය වශයෙන් ඒ අවස්ථාව අපට ලැබීම පිළිබඳව අගය කරනවා. මම දකින කාලය තුළ ශෝක යෝජනාවලින් වැඩිම කාලයක් ගත්ත ශෝක යෝජනාව මෙය බවයි මට හැඟෙන්නේ. ඒකට හේතු ගණනාවක් තිබෙනවා. අපේ ගරු අමාත්‍යතුමා කියපු ආකාරයට පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මෙතුමා සම්බන්ධව කථා කිරීම අගය කළ යුතු වෙනවා. ඇත්තටම මෙතුමා කියන්නේ ගාම්භීරත්වය, විනය ගරුක, ඒ වාගේම කෘතහස්ත දේශපාලඥයෙක් වශයෙන් එඩිතරව කටයුතු කරපු නායකයෙක් බව අපි කවුරුත් දන්නවා. ඒ වාගේම එතුමා ඒ කාල පරිච්ඡේදය තුළ භීෂණයත් එක්ක කටයුතු කළේ. 13 වැනි සංශෝධනය තුළින් පළාත් සභා ඇති වනකොට මේ බස්නාහිර පළාත් සභාවේම මන්ත්‍රීවරු විශාල වශයෙන් ඝාතනය වනකොට යූසුෆ් ගරු මන්ත්‍රීතුමා වාගේ කෘතහස්ත පුද්ගලයෝ මේ අවස්ථාවේ සිටීම අපි අගය කරන්න ඕනෑ. ඒ අවස්ථාවේ මගේ පියා යූ.එස්. පෙරේරා මැතිතුමාත් මේ පළාත් සභාවේ හිටියා. ඇත්තටම මගේ පියා අපේ ගෙදර ආවාම අද මෙවැනි කථාවක් තිබෙනවා කියලා මම කියනකොට - මගේ පියා 83 වැනි වියේ පසු වන්නේ. කෙසේ වෙතත් මට පියා කිව්වේ සුසිල් මුණසිංහ මැතිතුමාගේ තිබෙන නායකත්වය. සුසිල් මුණසිංහ මැතිතුමාගේ තිබෙන දක්ෂතාවය තමයි පෙන්නුම් කළේ. මේ සම්බන්ධව කථා කරනවා නම් ගොඩක් දේවල් කථා කරන්න පුළුවන්.

ඇත්තටම ඒ භීෂණ සමයේ පළාත් සභා ක්‍රමය ඇති කරලා - පළාත් සභාවට ස්ථානයක් නැහැ. වාහනයක් නැහැ. කොහේද මේ රැස්වීම් තියන්නේ? එවැනි වාතාවරණයක් තුළ කටයුතු කරන විධිය තුළ හිතා ගන්න ඕනෑ කොහොමද මේ පළාත් සභා අද දක්වා ඇවිල්ලා තියෙන්නේ කියලා. එදා මම දන්න විධියට මන්ත්‍රීවරයෙකුට විමධ්‍යගත අරමුදල් දීලා තියෙන්නේ, ලක්ෂ තුනක වාගේ මුදලක්. ඊට පස්සේ ලක්ෂ පහ වුණා. අන්තිමට ලක්ෂ 10 ක් වුණා. ඒ කියන්නේ ඒ අවුරුදු පහ තුළ වැඩිවීම වුණා. ඒත අද ඒ දේ වෙනවාද කියලා අපේ විපක්ෂ නායකතුමාම කිව්වා. බලන්න පෙජරෝ රථයක් - මගේ පියාට පෙජරෝ රථයක් හම්බ වුණා. මම දන්නවා. එය ගැනීමේදී පවා සැපයුම් දෙපාර්තමේන්තුවට, යූසුෆ් ගරු මන්ත්‍රීතුමා දන්නවා ඇති. ප්‍රධාන අමාත්‍යතුමාත් මේ මන්ත්‍රීවරු එක්ක ගියා. ඇයි එතැනට යන්නත් බැහැ. පෙජරෝ එක අරගෙන එනකොට ජනතා විමුක්ති පෙරමුණේ අය වෙඩි තියයිද කියලා බයේ. එවැනි ආරක්ෂාවක් දුන්නා. ඒ ශක්තිය ලබා දුන්නේ දිවංගත අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා සමග සම්බන්ධ වෙලා. ඒක ගත්තා වාගේ එය රක්ෂණය කර ගන්න - මගේ පියාටත් රක්ෂණය කරන්න මුදල් නැහැ. ලොකු ගාණක්. ඒකට මොකද කළේ? ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග කථා කරලා වාරික වශයෙන් - මේ මම පෞද්ගලිකව දන්න දෙයක්. වාරික වශයෙන් ගෙවන ක්‍රමයකට රක්ෂණය කරන්න ඒ අවස්ථාව ලබා දුන්නේ ඇත්තට සුසිල් මුණසිංහ මැතිතුමා. ඒ විතරක් නොවෙයි. පුද්ගලික රක්ෂණ ක්‍රමයක් ඇති කරලා දුන්නා. භීෂණ සමයේ මන්ත්‍රීවරු මරණකොට පුද්ගලික රක්ෂණ ක්‍රමයක් ඇති කරලා දුන්නා. මම හිතන්නේ දැනුත් තියෙන්නේ ඒ මුදලමයි. මම ගණන කියන්න ඕනෑ නැහැ. එදා ඇති වුණු මුදලම තමයි අද මන්ත්‍රීවරුන්ට රක්ෂණ ක්‍රමයේ තිබෙන්නේ. එවැනි තත්ත්වයක් ඇති කරලා දුන්නා. පුද්ගලිකව අපි දකිනවා එතුමාගේ තිබෙන ගාම්භීරත්වය. එතුමාගේ තිබෙන දක්ෂතාවය අපි දන්නවා. මේ පළාත් සභාවේ හිටපු විපක්ෂ නායක දිවංගත ඔසී අබේගුණසේකර මැතිතුමා බිහි වුණේ කැලණිය ආසනයෙන්. එතකොට මගේ පියා කැලණිය ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායක. මෙතුමා විපක්ෂ නායක. අපේ පියයි මෙතුමයි හැමදාම ප්‍රශ්න. ඇයි මොකක්ද හේතුව? මගේ පියා යූ.එස්. පෙරේරා මැතිතුමා පළාත් සභා මන්ත්‍රී වුණත්, ඔසී අබේගුණසේකර මැතිතුමා විපක්ෂ නායක වුණත්, ගරු ප්‍රධාන අමාත්‍ය සුසිල් මුණසිංහ මැතිතුමා සැලකුවේ දෙදෙනාටම එක හා සමානව. ඒ කියන්නේ, කැලණියේ මෙතුමාත් ව්‍යාපෘති කරනවා. ඔසී අබේගුණසේකර මැතිතුමාත් කරනවා. ප්‍රශ්න ගොඩයි. මට මතකයි පැලියගොඩ එච්.කේ. ධර්මදාස විද්‍යාලයේ ජංගම අමාත්‍යාංශයක් කළා. පුදුම ජනතාවක් ආවා. ජනතාව ඇවිල්ලා ඔසී මැතිතුමාගේ වටේ ඉන්නවා. සුසිල් මුණසිංහ මැතිතුමා ඒ හා සමානව වැඩ කරලා දෙනවා. අපි දකිනවා ඒ අතරතුර ඇති වුණු ප්‍රශ්න. ඒ කෙසේ වෙතත් පියෙක් වාගේ එදා නායකත්වය දුන්නා. මන්ත්‍රීවරුන්ට සහයෝගයෙන් ඒ ගමන යන්න ශක්තියක් ලබා දුන්නු ආකාරය අපට මතක් වෙනවා.

ඒ වාගේම කියන්න ඕනෑ. මගේ විවාහ උත්සවය ඒ කාල පරිච්ඡේදයේ තිබුණේ. මම ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය දරන වෙලාවේ. මට මතක් වෙනවා සියලු මන්ත්‍රීවරු කණ්ඩායම මගේ නිවසට කැඳවාගෙන ඇවිල්ලා ඒ වෙලාවේ අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායක හිටියේ ලක්ෂ්මන් විජේමාන්න මැතිතුමා. පිත්තලවලින් විශාල ත්‍යාගයක් මට ගෙනැල්ලා දුන්නා. ලක්ෂ්මන් විජේමාන්න මැතිතුමා කිව්වා සර් දෙන්න කියලා. නැහැ ඔබතුමයි මේක ලැහැස්ති කළේ, ඔබතුමාගේ අතින් දෙන්න

කියලා කීම මට තාම දැනෙනවා. එවැනි නායකත්වයක් තිබෙන පුද්ගලයෙක් තමයි අපේ සුසිල් මුණසිංහ මැතිතුමා. ඒ වාගේම කියන්න ඕනෑ. මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. අවසාන වශයෙන් කියන්නේ සභා ලේකම් කාර්යාලයේ අපේ දීප්ති විජේතුංග මහත්මයා අපට දැන්වූවා, සුසිල් මුණසිංහ මැතිතුමා අසාධ්‍යව හේමාස් රෝහලේ ප්‍රතිකාර ගනිමින් සිටින බව. ඒ අන්තිම අවස්ථාවට හරි යන්න ලැබීම අපි අගය කරනවා. කෙසේ වෙතත් ඒ වෙලාවේ ආණ්ඩුවෙන් නම් කිසිම උදව් උපකාරයක් ලැබුණාද කියලා මම දන්නේ නැහැ. කෙසේ වෙතත් ඒ අවස්ථාව සභා ලේකම් කාර්යාලයේ, ප්‍රවෘත්ති නිලධාරී දීප්ති විජේතුංග මහතා ලබා දීම සම්බන්ධවත් අපේ හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර අපේ සුසිල් මුණසිංහ මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මම හිතන්නේ පක්ෂ විපක්ෂ සියලු දෙනාම මේ සඳහා අදහස් ප්‍රකාශ කරලා අවසන් කර තිබෙනවා. ඇත්තෙන්ම සුසිල් මුණසිංහ මැතිතුමා සමග ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරියක් හැටියට මම වැඩ කළා. එතුමාගේ නායකත්වයෙන් යුත් රැස්වීම්වලට සහභාගී වුණා. මම එතුමා ඉතාම සෘජු නායකයෙක් හැටියට දකිනවා. වෙලාවට වැඩ කරන්න කැමැති. ඒ වාගේම කාලය පිළිබඳව ලොකු අගයක් තිබෙන අමාත්‍යවරයෙක් කියන එක අපට ඒ අවස්ථාවලදී වැටහුනා. අපි එක රැස්වීමකදී එක එක

[ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය ]

වෙලාවට සභාපතිවරු ආවා කියලා, දොර වහන්න, මීට පස්සේ කියන වෙලාවට ආවේ නැත්නම් ආයිත් හැරිලා යන්න පුළුවන් කියලා තද නීති දැම්මා. මොකද, කාලයේ අගය සියලු දෙනාටම වැටහෙන්න එතුමා කිව්වා. ඒ අය කරන කාර්යයෙන් මෙපමණ වැඩ තියලා නියමිත වෙලාවට ආපු සභාපතිවරුන්ගේ කාලය නාස්ති කරන්න බැහැයි කියලා. ඒ වාගේ ක්‍රමානුකූල ක්‍රමයකට වැඩ කරන්න ඉතාම හොඳ නායකත්වයක් දුන්නු ප්‍රධාන අමාත්‍යවරයෙක් සුසිල් මුණසිංහ මැතිතුමා. ඒ වාගේම අපි සමහර වෙලාවට පළාත් සභාවට ගිහිල්ලා එතුමා තවත් සාකච්ඡා නිසා එළියේ නැවතිලා හිටපු වෙලාවක, මට මතකයි එතකොට ඇරෙන වැහෙන දොරක් තිබුණේ. ඒ තුළින් අපි ඉන්නවා දැකලා අපව ගෙන්නලා තමුන්නාන්සේලාගේ කාලය හරි වටිනවා. ඒක නිසා ආපුවාම එළියට වෙලා ඉන්න එපා. ඇවිල්ලා මාත් එක්ක කථා කරන්න කියලා බොහොම නිහතමානීව කිව්වා.

ඒ වාගේම තමයි කොලොන්නාව ආසනය කියන්නේ නිතර ගංවතුරෙන් පීඩා විඳින ආසනයක්. අපි ඇවිල්ලා ඒ තත්ත්වය කියලා අපේ පාරවල් අබලන් වෙලා තිබෙනවා කිව්වාම මට මතකයි එවකට අපේ සභාපති වෙලා හිටියේ බෙනට් කුරේ මැතිතුමා. එතුමාට ලක්ෂ 6 ක් දුන්නා ඒ ප්‍රදේශයේ අබලන් වූ පාරවල් හදා ගන්න. ඒක අපට ඒ කාලේ දැනුනේ ලක්ෂ 50 ක මුදලක් වාගේ. අපි ජලයෙන් යට වුණු විශාල මාර්ග ප්‍රමාණයක් අලුත්වැඩියා කර ගත්තා. ඒ වාගේ ප්‍රතිපත්තිමය දේශපාලනයක් කරපු, වැඩ කරන්න ඕනෑ කොතැනද, එතැනට සහන ලබා දුන්නු ඉතාම ගුණ ගරුක මහත්මයෙක් හැටියට සුසිල් මුණසිංහ මහත්මයාට අපි ගරු කරනවා. ඒ වාගේ පුද්ගලයෙක් සමාජයෙන් වෙන්ව යාම කනගාටුයි. නමුත් ඒක ස්වභාව ධර්මය. අපි ප්‍රාර්ථනා කරනවා එතුමාට නිවන් සුව ලැබේවා කියලා. මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරපු සියලු දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. ඒ එක්කම මම ඉල්ලා සිටිනවා මේ අවස්ථාවේදී සභාවේ දැක්වූ අදහස් ඇතුළත් නිල වාර්තාවේ පිටපතක් ඥාතීන්ගේ දැන ගැනීම සඳහා ඔවුන්ට ලැබෙන්න සලස්වන හැටියට.

මීළඟට හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව සභාවට ඉදිරිපත් කිරීමට සුනිල් ජයමිණි ගරු සභානායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

## ශෝක ප්‍රකාශ යෝජනාව : II
## ගරු ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා :
## MOTION EXPRESSING CONDOLENCES : II
## HON. W.D. KARUNARATHNE, MEMBER

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "*බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවන පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කළුතර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසර පහක පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳ ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි.*"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මතුගම, ඕවිටිගල ප්‍රදේශයේ පදිංචිව සිටි ඉඩම් හිමි වැවිලිකරුවෙකු වන ඩේවිඩ් අප්පුහාමි මැතිතුමාගේ සහ එම මැතිනියගේ පුතෙක් ලෙස 1948.11.20 වනදා ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා මෙලොව එළිය ලැබූ අතර, මෙතුමාට සහෝදරයන් දෙදෙනෙකුද, සහෝදරියන් තිදෙනෙකුද සිටී. ඒ මහතාගේ පවුලේ සියලු දෙනාම පොදු මහජන සේවය සඳහා කැප වී කටයුතු කරන පවුලක් බවත් මම මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරනවා. කරුණාරත්න මැතිතුමාගේ ආදරණීය සහෝදරයා වන ඩබ්ලිව්.ඩී. ගුණතිලක මහතා කලක් මතුගම ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් කටයුතු කළ බවත් මේ අවස්ථාවේදී මෙම සභාවට ගෞරවයෙන් දැනුම් දෙනවා. කරුණාරත්න මැතිතුමා කළුතර ඕවිටිගල මහ විද්‍යාලයෙන් සහ විශේෂයෙන්ම කළුතර ශාන්ත මරියා මහ

විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබුවා. එසේ ලැබීමෙන් පසු එතුමා ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ පරීක්ෂවරයෙක් වශයෙන් රැකියාවට එක් වෙනවා. වසර 10 ක් ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉතාමත් දක්ෂ සේවකයෙක් හැටියට ඒ වාගේම ගමනාගමන මණ්ඩලය තුළ තමන්ගේ හිතවතුන්ගේ සේවක ගැටළු විසඳන නායකයෙක් බවට පත් වෙමින්, තමන්ගේ කාර්ය භාරය නිසි ලෙස ඉටු කරන අතරතුර තමයි එතුමා 1976 වර්ෂයේදී කොළඹ කිරුළපන ප්‍රදේශයේ පදිංචිව සිටි ඩේසි පෙරේරා මෙනෙවිය සමග විවාහ වෙලා දියණියන් සිව් දෙනෙකුගේ පියෙක් බවට කාලයක් යනකොට පත් වෙන්නේ. මා මීට කලින් සඳහන් කළ ආකාරයටම 1982 හොරණ, මතුගම, අගලවත්ත ප්‍රදේශවල කෘතහස්ත දේශපාලන පවුලක් වන ගරු අනිල් මුණසිංහ මැතිතුමා සමග එක් වෙලා, එතුමාත් එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙලා පක්ෂයේ දේශපාලන කටයුතුවල ක්‍රියාකාරීව නිරත වන තරුණයෙක් බවට ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා පත් වෙනවා. 1983 ඉඳලා 1999 දක්වා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතුගම බල මණ්ඩලයේ ලේකම්වරයා හැටියට කටයුතු කරන අතර, 1991 වර්ෂයේදී එතුමා පළාත් පාලන මැතිවරණයේදී මතුගම ප්‍රාදේශීය සභාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයෙක් හැටියට තරග කරනවා. ඒ මැතිවරණයට ඉදිරිපත් වෙලා මතුගම ප්‍රාදේශීය සභාවේ වැඩිම මනාප ලබාගෙන 1991 දී මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට කරුණාරත්න මැතිතුමා පත් වෙනවා. ඉන් පස්සේ එතුමා අවුරුදු දෙකක් මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ප්‍රදේශයේ පොදු අඩුපාඩු පිළිබඳව, ප්‍රදේශයේ ජනතා අවශ්‍යතා පිළිබඳව තමන්ගෙන් ඒ ප්‍රදේශයට කෙරෙන යුතුකම් කොටස පිළිබඳව මනා අවබෝධයක් ලබා ගෙන එතුමා අති දැවැන්ත සේවයක් මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ඒ ප්‍රදේශයට කරලා, ඉන් පස්සේ එතුමා 1993 වර්ෂයේ බස්නාහිර පළාත් සභා මැතිවරණයට කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අපේක්ෂකයෙක් ලෙස තරග වදිනවා. ඒ මැතිවරණයේදී ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා ඉතා විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන කළුතර දිස්ත්‍රික්කයේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට දෙවන පළාත් සභාවට පත් වෙනවා. ඉන් පස්සේ එතුමා අපි දන්නවා ඉතා විශාල සේවයක් තමන්ගේ බල ප්‍රදේශයට, දිස්ත්‍රික්කයට, තමන් නියෝජනය කළ දේශපාලන පක්ෂයට, ජනතාවට ඉතා කැපවීමෙන් කටයුතු කරනවා. මට මතකයි එතුමා 1993 පළාත් සභාවට පත් වුණාම අපත් එක්ක වර්ෂ පහක් පමණ එකට කටයුතු කළා. අපි දැකපු ඉතාම නිරහංකාර මනුස්සයෙක්. ඒ වාගේම බොහොම නිහතමානී විධියට, චාම් විධියට තමන්ගේ ගති පැවතුම් පවත්වාගෙන, කා එක්කත් සුහදත්වයෙන් කටයුතු කළ මන්ත්‍රීවරයෙක් හැටියට තමයි කරුණාරත්න මැතිතුමා මේ සභාවේ අපි දැන හඳුන ගත්තේ. අපි දන්නවා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඉතාම ගරු කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය යම් වැඩක් පැවරුවාද ඒ පවරපු හැම වෙලාවකම එතුමා ඒ වැඩ කොටස ඉතාම ඉහළින් ඉටු කළා. ගරු අනුරුද්ධ රත්වත්ත මැතිතුමා සමග එක් වෙමින් ඒ රත්වත්ත මැතිතුමාගේ කාර්ය භාරයන් එතුමා ඉතාම ඉහළින් ඉටු කළා.

ඒ වාගේම මට මතකයි අතිගරු ජනාධිපතිතුමාගේ පාද යාත්‍රාවේදී එම පාද යාත්‍රාව ආරම්භයේ ඉඳලා කළුතර ගියාට පස්සේ කළුතර ඉඳලා අවසානය දක්වා පාද යාත්‍රාවේ ගමන් කරලා එදා එතුමා පක්ෂයට ශක්තියක් ලබා දෙන්න කටයුතු කළා. එතුමා 1993 පළාත් සභාවට තේරී පත් වෙලා ඉන් පස්සේ එතුමා 1999 දක්වා පළාත් සභාවේ කටයුතු කරලා ඊට පස්සේ එතුමා පළාත් සභාවට තරග නොකර සාමාන්‍ය කෙනෙක් බවට පත් වුණත් එතුමා තමන්ගේ කටයුතු අත් හරින්නේ නැහැ. ඊට පසු හිටපු ගරු අග්‍රාමාත්‍ය හොරණ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක රත්නසිරි වික්‍රමනායක මැතිතුමා සමග එක් වෙලා එතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා හැටියට එතුමා කටයුතු කරමින් ඉන්නවා. ඊට පස්සේ එතුමා අගමැතිතුමා එක්ක මුළු දිස්ත්‍රික්කය පුරා, පළාත පුරා තමන්ගේ කටයුතු ඉතාම හොඳින් ඉටු කරනවා. අපි දැක්කා එතුමා අවසාන භාගයේ මේ සභාවට යන එන අවස්ථාවල එතුමා මන්ත්‍රී කෙනෙක් නොවුණත් කෙනෙක් ඇවිල්ලා කිව්වොත් මතුගම ප්‍රදේශයේ මේ කටයුත්ත කරලා දෙන්න කියලා. හිටපු මන්ත්‍රීවරු, ඇමැතිවරු එතුමා හඳුනනවා. මේ සභාවට ඇවිල්ලා ප්‍රධාන ඇමැතිතුමා හමු වෙලා ඒ කටයුතු කර ගන්න කරුණාරත්න මැතිතුමා මේ මෑතක් වනතුරුම කටයුතු කළා. මම දන්නවා අවසාන කාලයේ එතුමා නිර්මල කොතලාවල ඇමැතිතුමාත් එක්ක සම්බන්ධ වෙලා එතුමාගේ මාර්ග වැඩ සටහන්වලට නායකත්වය ලබා දෙමින් එතුමාගේත් සම්බන්ධීකරණ ලේකම්වරයෙක් හැටියට කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවට තමන්ගේ දායකත්වය ලබා දෙනවා. ඒ නිසා කරුණාරත්න මැතිතුමා මේ සමාජයට මනුස්සයෙක් හැටියට විශාල සේවයක් කරපු කෙනෙක්. එතුමා රජයේ සේවකයෙක් හැටියට, ඉන් පස්සේ පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් හැටියට, පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට, ඒ තනතුරු ඇතත් නැතත් තමන්ගේ ප්‍රදේශයේ දේශපාලන නායකයෝත් එක්ක එකතු වෙලා දිස්ත්‍රික්කයේ ජනතාවටත්, මතුගම ජනතාවටත් ඉතා විශාල සේවයක් කරපු ඉතාම අවංක නිහතමානී මනුස්සයෙක්.

ඒ නිසා මේ අවස්ථාවේ අපි කාල වේලාව ගැන හිතලා දීර්ඝ කථාවක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි දන්නවා එතුමා ජීවත් වෙලා හිටපු කාල සීමාව තුළත් කාටවත් හිංසාවක්, කරදරයක් කළේ නැහැ. ඒ නිසා කරුණාරත්න මැතිතුමා තමන්ගේ ජීවන ගමනින් මේ රටට යමක් කරපු කෙනෙක් හැටියට හඳුන්වමින් අපි සිංහල බෞද්ධයෝ හැටියට අපි කවුරුත් බලාපොරොත්තු වන ශාන්ත අමා මහ නිර්වාණ සුවය එතුමාට අත් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දෙවන පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කරපු මතුගම ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනාව සාකච්ඡා කරන අවස්ථාවේ එතුමා පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න අපට අවසර ඉඩකඩ ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ සභානායකතුමන් ප්‍රකාශ කළ පරිදි එතුමා මතුගම ප්‍රදේශයේ දීර්ඝ කාලීන දේශපාලන කටයුතුවල, සමාජ කටයුතුවල යෙදුණු ප්‍රාදේශීය නායකයෙක් හැටියට අපට විශේෂයෙන්ම සඳහන් කරන්න පුළුවන් වෙනවා. 1983 දී අනිල් මුණසිංහ මැතිතුමා මතුගම පාර්ලිමේන්තු මන්ත්‍රී වුණාට පස්සේ එතුමාගේ පුද්ගලික ලේකම් හැටියට සම්බන්ධ වෙමින්, එතුමන් සමග ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ, විශේෂයෙන්ම මතුගම ආසනය තුළ දේශපාලන කටයුතුවලට නායකත්වයක් දීලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මධ්‍ය බල මණ්ඩලයේ ලේකම්වරයා හැටියටත් කටයුතු කරමින් එතුමා විශාල දේශපාලන සංවිධානාත්මක කටයුතු කිරීමේ ප්‍රමුඛයෙක් හැටියට කටයුතු කළ කෙනෙක් ලෙස විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. 1991 පළමුවැනි ප්‍රාදේශීය සභා මැතිවරණයේදී එතුමා වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබාගෙන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා බවට පත් වීමෙන් පස්සේ මතුගමට විශාල සංවර්ධන කාර්ය භාරයක් ගෙන එන්න නායකත්වය අරගෙන කටයුතු කළාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම පළාත් සභාවට එතුමා පත් වීමත් සමග එම කටයුතු වඩාත් තීව්‍ර කරමින්, වඩාත් ශක්තිමත් කරමින් කටයුතු කළාය කියන එක අපි මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන්ම එතුමා
[ ගරු කීර්ති කාරියවසම් ]

මතුගම නගරයට විශාල අඩුවක් තිබුණු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘති හඳුන්වා දුන්නා. ඒ වාගේම මතුගම නගරයට විශාල අඩුවක්ව තිබුණු ශ්‍රවණාගාරයක් ඉදි කිරීමේ කටයුත්තේ මූලික කටයුතු ආරම්භ කරලා කටයුතු කළා. ප්‍රදේශයේ තරුණ තරුණියන්ට රැකියා ලබා දීමේ මාර්ගයක් හැටියට මතුගම Aitken Spence ඇඟලුම් කර්මාන්ත ශාලාව ආරම්භ කරන්න ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ඉඩකඩ ලබා දීලා එවැනි ආයතන බිහි කරන්න එතුමා විශාල මූලිකත්වයක් අරගෙන කටයුතු කරපු කෙනෙක් හැටියට විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. සෑම අවස්ථාවකම ප්‍රදේශයේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල මහන්සියක් අරගෙන කටයුතු කරපු එතුමන් මතුගම අධිකාරි කණිෂ්ට විද්‍යාලය ආරම්භ කිරීමට මූලික කටයුතු කරපු කෙනෙකු හැටියට අපි ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමාව මේ අවස්ථාවේදී සිහිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම බෞද්ධ කටයුතු වෙනුවෙන් මූලිකත්වය අරගෙන කටයුතු කරපු එතුමන් මතුගම බටුමුල්ල කන්ද විහාරස්ථානය ඖෂධ උයනක් බවට පත් කරන්න මූලික වෙලා කටයුතු කරලා ඒ ප්‍රදේශයේ බෞද්ධ ගති සිරිත් ඇති කරන්න කටයුතු කරපු ප්‍රධානියෙක් හැටියට අපි සඳහන් කරන්න ඕනෑ. එතුමා තමන් මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරපු කාලය තුළදී දේශපාලනය තුළ හම්බ කර ගන්න කටයුතු කරන්නේ නැතුව තමන්ගේ මුළු ජීවිත කාලයම දේශපාලනය වෙනුවෙන් එසේම සමාජ සේවය වෙනුවෙන් කැප කරලා විශාල පහසුකම් නැතිව සාමාන්‍ය ජන ජීවිතයක් ගත කරපු කෙනෙක් හැටියට කරුණාරත්න මැතිතුමාව අපි මේ අවස්ථාවේ සිහිපත් කරනවා. එතුමා ඉතින් එවැනි කෙනෙක්. එතුමාට තවත් දීර්ඝ කාලයක් ජීවත් වෙන්න වාසනාව ඉඩකඩ තිබුණත් හදිසියේ අසනීප වෙලා එතුමා අප අතරින් වෙන් වී යාම මතුගම, ඒ වාගේම පස්යොදුන් කෝරළය ප්‍රදේශයට විශාල පාඩුවකට හේතු වෙනවාය කියන එක විශේෂයෙන්ම මේ අවස්ථාවේ සඳහන් කරනවා. ඒ වාගේම එතුමන් ආරම්භ කරපු වැඩ කොටස් ඉදිරියට ගෙනියන්න ප්‍රදේශයේ උදවිය හැටියට, ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතයින් හැටියට අපි එතුමන්ගේ ක්‍රියා මාර්ගයන්ට ගරු කිරීමක් හැටියට තමයි එවැනි කටයුතු තවදුරටත් ශක්තිමත් කරලා ඉදිරියට ගෙනියන්න අපි බලාපොරොත්තු වෙන්නේ කියන එකත් මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන්ම 1989 - 1990 කාල පරිච්ඡේදයේදී අප රට තුළ තිබුණු භීෂණකාරී තත්ත්වයන් තුළදී ඒ ප්‍රදේශවල ජනතාව ඉතාමත් අසරණ තත්ත්වයට පත් වෙලා සිටි කාලයේදී අනිල් මුණසිංහ මැතිතුමාත් සමග එකට එකතු වෙලා කරුණාරත්න මැතිතුමා ඒවාට මුහුණ දීලා ඒ භීෂණකාරී තත්ත්වයන්ගෙන් ජනතාව බේරාගෙන කටයුතු කරන්න ක්‍රියා කරපු කෙනෙක් හැටියටත් විශේෂයෙන්ම සිහිපත් කරන එක අපේ වගකීමක්, යුතුකමක් හැටියට අපි සලකනවා. ඉතින් එතුමා තවදුරටත් දේශපාලනයේ සිටිය යුතුව තිබුණු කෙනෙක්. අප අතරින් වෙන් වීම විශේෂයෙන්ම කනගාටුවට වාගේම පාඩුවට කාරණයක් වෙනවා. අපි මේ අවස්ථාවේ එතුමාගේ පවුලේ සියලු දෙනාට, එම මහත්මියට, දූ දරුවන් සියලු දෙනාට අපේ ශෝකය ප්‍රකාශ කරමින්, බෞද්ධයෝ වූ අපි එතුමන්ට නිවන් සුව අත්වේවායි කියන ප්‍රාර්ථනය ඇතිව මම මගේ වචන ස්වල්පය හමාර කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපති සුනිල් විජේරත්න මැතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය [අශෝකා ලංකාතිලක මෙනෙවිය] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Miss Asoka Lankathilaka] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ මගේ ප්‍රදේශය නියෝජනය කරමින් මාත් එක්ක දෙවැනි පළාත් සභාව නියෝජනය කරපු කරුණාරත්න මහත්මයා පිළිබඳව ගරු සභානායකතුමා ඉදිරිපත් කරපු කාරණාව අනුමත කරමින්, ඒ වාගේම කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ එතුමාගේ කථාවද අනුමත කරමින් කරුණාරත්න මහත්මයා පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමක් හැටියටත්, එතුමා සමඟ මේ පළාත් සභාව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් හැටියටත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. සාමාන්‍ය පවුලකින් ආපු කරුණාරත්න මහත්මයා ප්‍රදේශයේ ජනතාවත් එක්ක සමීපව ජීවත් වෙලා එතුමාගේ සේවාව පිළිබඳව ජනතාව තේරුම් ගත්තු නිසා එතුමාට පුළුවන් වුණා ප්‍රාදේශීය දේශපාලන නායකයෙක් වෙන්න. එතුමා ප්‍රාදේශීය දේශපාලනය තුළින් ඇවිල්ලා තමන්ගේ වෘත්තියත් එක්ක වෘත්තීය සමිති නියෝජිතයෙක් හැටියටත් කටයුතු කරපු නිසා එදා ප්‍රවාහන අමාත්‍යවරයා හැටියට හිටපු අනිල් මුණසිංහ පාර්ලිමේන්තු අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට සම්බන්ධ වෙලා එතුමාත් එක්ක දීර්ඝ කාලයක් ප්‍රදේශයේ ජනතාවට සේවය කරන්න එතුමාට පුළුවන් වුණා. ඒ තුළින් ප්‍රාදේශීය දේශපාලනය තුළ මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කරලා තමන්ගේ ප්‍රදේශයේ ජනතාවට තමන්ට කළ හැකි උපරිම මට්ටමේ ශක්ති ප්‍රමාණයෙන් සේවය කරමින එතුමා ඒ ප්‍රදේශයේ ජනතාවගේ සිත් දිනා ගත්තු නිසා තමයි 1993 අවුරුද්දේ බස්නාහිර පළාත් සභාවට තරග කරලා ප්‍රදේශයේ මහජන නියෝජිතයා හැටියට තේරී පත් වෙන්න පුළුවන් වුණේ. තමන් ඒ ලබාගත්තු වරම තුළත්, තමන් සභාපති ධුරයේ කරගෙන ආපු කටයුතු ඉදිරියට ගෙන යන්න මතුගම පමණක් නොව, දොඩන්ගොඩ, කළුතර, බේරුවල යන ප්‍රදේශවල ජනතාවත් එක්කත් සමීප වෙලා මිනිසුන්ගේ හිතවතෙක් හැටියට ඉඳගෙන තමන්ගේ ලැබුණු ප්‍රතිපාදන සහ තමන්ගෙන් ආණ්ඩු පක්ෂයට ලබා ගන්න පුළුවන් උපරිම සේවාව ලබා දීලා මිනිස්සුන්ට යම් සේවාවක් ඉටු කළේ. ඒ වාගේම අනිල් මුණසිංහ අමාත්‍යතුමාගෙන් ගන්න පුළුවන් උපරිම සේවාව ලබාගෙන මතුගම සංවර්ධන කටයුතුවල එක්තරා අංශයක ඔහු නියාමකවරයෙක් හැටියට කටයුතු කළ බව විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. තමන්ගේ පවුලේ දියුණුව පිළිබඳව එතුමා කිසිම මොහොතක හිතුවේ නැහැ. ඒ හිතපු නැති නිසා එතුමාට තමන්ගේ ජීවිතයේ අවසාන කාලය තුළදී කනගාටුවෙන් ගත කරන්න සිද්ධ වුණා. එතුමා පුංචි ව්‍යාපාරයක් ආරම්භ කරගෙන ඇවිල්ලා දේශපාලනයට පෙර යම් හැකියාවක් නිර්මාණය කර ගත්තත් දේශපාලනය නිසා තමන්ගේ ව්‍යාපාරය පවා අමතක කරලා ඉදිරි ගමන ආවේ යම් විශ්වාසයක් ඇතුව. නමුත් ඔහුගේ විශ්වාසය තුළ ඔහුට පුළුවන් වුණා ජනතා විශ්වාසය දිනා ගන්න වාගේම තමන්ගේ පැවැත්ම පිළිබඳව විශ්වාසය බිඳ වැටුණයි කියන එක කනගාටුවෙන් මතක් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් සමාවෙන්න. සභාවේ කාලය දීර්ඝ කිරීමට අවශ්‍යයි.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරු මෙම සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

එතුමා තමන්ගේ ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපනය, ආගමික අවස්ථාවන්, විහාරස්ථාන, වැවිලි ක්ෂේත්‍රය, විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධව උපරිම ශක්තියෙන් ජනතාවට කටයුතු කළ බව විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. එහෙම නම් එතුමා තමන්ගේ වගකීම හරියාකාරව ඉටු කළ අයෙක්. තමන් භාර ගත්තු කටයුත්ත, ඒ වාගේම මහජන නියෝජිතයෙක් හැටියට ප්‍රදේශයේ ජනතාවගේ විශ්වාසය දිනා ගන්න පුළුවන් වුණේ එතුමා තුළ තිබුණු අවංකකම, නිහතමානීකම නිසා බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එහෙම නම් ගරු සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාගෙන් ඉටු වූ සේවාව මම ඉතාමත් අගය කරමින්, එතුමා ජීවත් වුණු ආගමේ හැටියට එතුමාට නිවන් සුව පතමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මේ සභාවේ ගරු මන්ත්‍රීවරයෙකු හැටියට 1993 වර්ෂයේ සිට සුවිශේෂී සේවාවක් ඉටු කළ, අභාවප්‍රාප්ත ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මන්ත්‍රීතුමන් පිළිබඳව, එතුමාගේ වියෝව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මොහොතේ අපත් සමග එකට 1991 මතුගම ආසනයෙන් පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙලා ප්‍රාදේශීය සභා සභාපතිවරයෙක් හැටියට මතුගම ප්‍රාදේශීය සභාවටත් ඉන් අනතුරුව 1993 පළාත් සභාවටත් තේරී පත් වුණු ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා - අවාසනාවට එතුමාගේ අභාවය සිදු වන මොහොතේ මම විදේශගතව සිටියේ. කෙසේ වෙතත් අපි ඉතාමත් කුළුපග මිතුරන් හැටියට ඒ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල දේශපාලන කටයුතුවලට සම්බන්ධ වුණා. එවකට විපක්ෂයේ හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපට 1993 - 1994 වර්ෂය තමයි අපට තීරණාත්මක වර්ෂයක් බවට පත් වුණේ. මේ කාල පරිච්ඡේදය තුළ මම හිතන විදියට ගරු ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා එවකට හිටපු අපේ ප්‍රධාන අමාත්‍යවරිය සහ පසුකාලීනව ජනාධිපතිනිය හැටියට කටයුතු කරපු චන්ද්‍රිකා බණ්ඩාරනායක

කුමාරතුංග මැතිනියගේ දේශපාලන වැඩ සටහන යටතේ විවිධ ප්‍රදේශවල දේශපාලන කටයුතුවලට සහභාගී වුණා. තමන්ට පැවරූ සියලු වගකීම් සිය පක්ෂයේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉෂ්ට කරන්න දැඩි ලෙස කැපවීමෙන් කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් හැටියට තමයි අප ඔහුව හඳුනාගෙන හිටියේ.

ඒ වාගේම ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමා ඉතාමත් නිහතමානී දේශපාලන චරිතයක්. කවුරුත් සමගත් ඉතාම ලෙංගතුව, සිනහ මුසු මුහුණින් කටයුතු කරමින් ඒ කළ යුතු සේවාවන් නොපිරිහෙලා ඉෂ්ට කරන්න වෙහෙස මහන්සි වුණු ඉතාමත් ගෞරවනීය ප්‍රජා නායකයෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගෞරවනීය මන්ත්‍රීවරයෙක් හැටියට ඔහුගේ සේවා කාලයේ ඉතාමත් හොඳින් ඔහු කටයුතු කළේ. ඒ වාගේම මට මතක් වෙනවා. පෙර කිව්වා වාගේ ලංකා සමසමාජ පක්ෂයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් සියලු දේශපාලන වැඩ සටහන් පිළිබඳව අන්‍යෝන්‍ය වශයෙන් බොහෝ විට දැන හඳුනගෙන ප්‍රජාවගේ කටයුතුවලදී ඉතා නිවැරැදි නායකත්වයක් දෙන්න ඔහුට හොඳ පන්නරයක් තිබුණු කෙනෙක්. බොහෝ වාමාංශික දේශපාලන හැඟීම් ඔහුගේ හදවතේ ලියලා තිබුණා. ඒ තුළින්ම ඔහු බොහෝ විට ජනතාවට ඉතාමත් කිට්ටු වුණු, ජනතාවගේ හදවතේ වේදනාව දුක හඳුනන කෙනෙක් හැටියට මතුගම ප්‍රදේශයේ ප්‍රචලිතව හිටියා. දිස්ත්‍රික් දේශපාලන කටයුතුවල නියැලෙද්දීත් ඔහුට ඒ පිළිබඳව තිබුණු අවබෝධය නිසාම ජනතාව ඔහු සමග අත්වැල් බැඳ ගැනීමේ ස්වභාවයක් තිබුණා. පසු කාලයේ යම් රෝගාතුර තත්ත්වයක් තිබුණු නිසාම දේශපාලන ක්‍රියාවලියේ එපමණ ගැලී නොසිටියත් මන්ත්‍රී ධුරයක් අහෝසි වුණා කියලා ගෙදරට වෙලා තනි වුණේ නැහැ. අපේ සුසිල් ජයමිණි ගරු සභානායකතුමා කිව්වා වාගේ ගරු අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමා සමග අපේ වත්මන් මහ මාර්ග නියෝජ්‍ය

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

අමාත්‍ය ගරු නිර්මල කොතලාවල මැතිතුමා සමග විවිධ දේශපාලන චරිත සමග සම්බන්ධ වෙලා තමන්ට සුපුරුදු මහජන සේවා කටයුතු ඒ ආකාරයෙන්ම පවත්වාගෙන ගියා. ඉතින් මේ දේශපාලන චරිතය පිළිබඳව අපට ඉතාමත් නිර්භයව කථා කරන්න පුළුවන්. දන්න හඳුනන හිත මිතුරන් එක්ක සමකාලීන දේශපාලනය කරපු අය හැටියට, මේ වාගේ දේශපාලන චරිත අද සමාජයට බොහෝ ආදර්ශවත් චරිත හැටියටයි මා සලකන්නේ. මොකද, හේතුව ඔවුන්ගේ දේශපාලන කටයුතු නිමා කරනකොට ඔවුන්ට පෞද්ගලිකව හිමි වුණු දෙයක් නැහැ. මන්ත්‍රී ධුරය අත් හැරලා ගෙදර යනකොට ගියේ සාමාන්‍යයෙන් රැගෙන ආපු සාමාන්‍ය දේ පමණයි. ඊට එහා ඔහුට කිසිවක් තිබුණේ නැහැ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, අභාවප්‍රාප්ත ඩබ්ලිව්.ඩී. කරුණාරත්න අපේ දයාබර මිතුරා, අපේ දයාබර හිතවතා ඉතාමත් ශ්‍රේෂ්ට දේශපාලන ක්‍රියාශීලී නායකයා අද අප අතරින් වියෝ වී තිබෙනවා. මම හිතන්නේ විශේෂයෙන්ම මතුගම ප්‍රදේශයේ ජනතාවට සදාකාලයෙන්, සදාකාලයට ඩබ්ලිව්.ඩී. කරුණාරත්න කියන නාමය අමතක වෙන එකක් නැහැ. ඔහු ඒ තරම්ම ඔවුන්ට සමීප නායකයෙක් නිසා. සනාථන ධර්මතාවයන් අනුව අද ඔහු අප අතරින් සදහටම සමුගෙන ගොස් තිබෙනවා. දයාබර මිතුරාට, දයාබර ගරු මන්ත්‍රීතුමාට අපි ප්‍රාර්ථනා කරනවා. ජීවිතයේ අප අතරින් වෙන් වී ගියත් ඔහු ප්‍රාර්ථනා කරන ආගම දහම අනුව පුනර්භවයේ නැවත මුණ ගැසෙමින් අවසානයේ උතුම් වූ නිවනින් සැනසීම ලබන්න එතුමාට හේතු වාසනා වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මගේ පෞද්ගලික ශෝකයත්, පානදුර ප්‍රදේශයේ අපේ හිතවතුන්ගේ ශෝකයත් ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමාගේ පවුලේ සාමාජිකයන් වෙත පුද කරන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

ගරු සභාපතිතුමනි, අද දවසේ ඉතාම ශෝකී දනවන න්‍යාය පත්‍රයක අපට සාකච්ඡා වෙන්න සිද්ධ වුණේ. විශේෂයෙන් සුසිල් මුණසිංහ අපේ හිටපු ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ශෝක යෝජනාවෙන් අනතුරුව සුසිල් මුණසිංහ මැතිතුමන්ගේ සහෝදරයා අනිල් මුණසිංහ මැතිතුමාගේ දේශපාලන ප්‍රවේණියේ සමීපතම, කිට්ටුම අංකුර දේශපාලඥයෙක් හැටියට ගොඩ නැඟුනු බස්නාහිර පළාත් සභාවේ ඉතාම හොඳ ගුණගරුක, නිහතමානී, දක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරපු ඩබ්ලිව්.ඩී. කරුණාරත්නයන් පිළිබඳවයි අද මේ මිනිත්තු කිහිපය ගත වෙන්නේ. මම ඒ ශෝක යෝජනාවට පෙර මතක් කරන්න ඕනෑ දැන් සභාවේ පුරුද්දක් හැටියට සහෝදර මන්ත්‍රීතුමෙක් එහෙම නැත්නම් මන්ත්‍රීතුමියක්, එහෙම නැත්නම් ඇමැතිවරයෙක් දිවංගත වුණාම ඒ ශෝක යෝජනාව ගෙන එනකොට සභාවේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාගෙන්ම දැන ගන්න පුළුවන් අපි කොයිතරම් අපේ සහෝදර මන්ත්‍රීවරුන්ට ගරු කරන්න මොන තරම් අපේ හෘද සාක්ෂියට වග කියනවාද කියන කාරණාව. මම මූලාසනයේ ඉඳිද්දීත් පසුගිය දවසක ඔවැනි සිදුවීමක් වුණා. ගරු සභාපතිතුමනි, අපි ලොකු උත්සාහයක යෙදෙනවා පැමිණ සිටින දෙමව්පියෝ, සහෝදරයෝ ඉදිරියේදී කොහොමද අපි අපේ ආදරණීය දිවංගත සහෘදයා වෙනුවෙන් වගකීම උසුලන්නේ කියලා අවබෝධ කරවන්න. මම දන්නේ නැහැ මොනවාද වෙන්නේ කියලා. අද සුසිල් මුණසිංහ, අනිල් මුණසිංහ, අනගාරික ධර්මපාලතුමාගේ ප්‍රවේණියේ. සුසිල් මේ පළාත් සභාවේ සුවිශේෂී මෙහෙවරක් කරපු, අපි බොහොම ගරු කරන, බොහොම ආදරය කරන ජ්‍යෙෂ්ටතම නායකයෙක්. ඉතින් අපි අද එතැනදීත් එහෙමයි. මෙතැනදීත් එහෙමයි.

මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ පස්යොදුන් කෝරළයේ ලංකාවේ පහතරට වැවිලි ආර්ථිකයට බර දුන්නු හොඳ ග්‍රාමීය සෞන්දර්යාත්මක වටපිටාවක හරිත ගුණයෙන් පිරුණු ගහකොළ, කෙත්වතු, මේ රටේ ජාතික ආදායමට, විදේශ විනිමයට හොඳ බරක් තිබෙන ප්‍රදේශයක්. විශේෂයෙන් අපේ යූසුෆ් ගරු මන්ත්‍රීතුමා දන්නවා. වැවිලි ආර්ථිකයේ ඒ කාලේ රබර්, ලංකාවේ රබර් පර්යේෂණායතනය තිබෙන්නෙත් අගලවත්තේ.

දැන් තේ. රබර්, තේ, කෙත්වතු සරුසාර භූමි ප්‍රදේශයක්. ඉතාම හොඳ ඇළ දොළ, අදත් අපේ මන්ත්‍රීතුමන්ලා අගලවත්ත, පාලින්ද නුවර ප්‍රදේශයට යනවා. සැප පහසුව විඳ දරා ගන්න. මොකද ලෝකයේ විතරක් නොවෙයි ලංකාවේත් අද කාර්ය බහුලත්වය නිසා පීඩනයට පත් වෙලා ඉන්නේ. ඒ සුන්දර ප්‍රදේශයට, සුන්දර පළාතට අපේ අනිල් මුණසිංහ මහත්මයා එංගලන්තයේ ඉගෙනීම හමාර කරලා ලංකාවට ආවාම අගලවත්තේ මොහොමදි වත්තේ තිබුණු වතු කම්කරුවන්ගේ වෘත්තීය සටනට තමයි නායකත්වය දුන්නේ. එදා තමයි අනිල් මුණසිංහ දේශපාලනයට ප්‍රායෝගිකව අඩිය තිබ්බේ කියලා අපි අහලා තිබෙනවා. පසු කලක මේ අනිල් මුණසිංහ කියන දේශපාලඥයාගේ වටපිටාවට ඔහුගේ ප්‍රතිපත්ති, ඔහුගේ දේශපාලන ක්‍රියාකාරකම්, ඔහු ජනතාව වෙනුවෙන් පෙනී සිටි විවිධ අරගලවලට නායකත්වය දුන්නු ඒ සංවිධානය තුළ ගොනු වුණු තරුණ පිරිසක් ඒ කාලේ අනිල් මුණසිංහ අපේ නියෝජ්‍ය කථානායකතුමා, හිටපු ඇමැතිතුමා මේ රටේ ප්‍රවාහන සේවාවට හොඳ මෙහෙවරක් කළ නායකයෙක් හැටියට එතුමා වටා එකතු වුණා. ඒ කාලේ අනිල් මුණසිංහ කියන නමට විශාල ගෞරවයක් තිබුණා පස්යොදුන් කෝරළයේ. විශේෂයෙන්ම ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමනි, පස්යොදුන් කෝරළය බොහොම උසස් පළාතක්. ඒවග කියන්න ඕනෑ. මම මේ අනෙක් කෝරළ ගැන අවතක්සේරු කරනවා නොවෙයි. නමුත් ජාතික මට්ටමේ නායකයෝ බිහි වුණු පළාතක්. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර, අනිල් මුණසිංහ, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා වාගේ බොහොම දක්ෂ දේශපාලඥයෝ. ඒ වාගේම අද දවසේත් ජීවතුන් අතර ඉන්න අපේ බණ්ඩාරනායක මහත්මයාගේ ආණ්ඩුවේ ඒ ප්‍රගතිශීලී දේශපාලන ප්‍රතිපත්තියේ සංකේතය වාගේ, පංච මහා බලවේගයේ ඉතුරු වෙලා තිබෙන සංකේතය හඳුන් ගහක් වාගේ අපේ දයා ටී පැස්කුවෙල් මහත්මයා. අවුරුදු 102 යි. අපේ පළාතේ ඉන්නේ. වික්‍රමබාහු කරුණාරත්න මහත්මයාත් එහේ තමයි ප්‍රවේණිය.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

රෙජිනෝල්ඩ් කුරේ.

**ගරු රංජිත් සෝමවංශ** – නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

රෙජිනෝල්ඩ් කුරේ ගම්පහ දිස්ත්‍රික්කයට අයිති වෙන්නේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

නැහැ, නැහැ. කලමුල්ලේ.

**ගරු රංජිත් සෝමවංශ** – නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

ප්‍රවේණිය ගම්පහ දිස්ත්‍රික්කයේ. පැටිකිරිවල බලන්න කෝ? ඒ නිසාවෙන් අද මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේ හොඳ පළාතක තමයි මේ අපේ කරුණාරත්න මහත්මයා ඉපදුණේ. කරුණාරත්න මහත්මයා පිට කෙනෙක් නොවෙයි. අපේ ඩේවිඩ් අප්පුහාමි මහත්මයා, ඒ මැණියෝ කෙවිටියගල පළාතේ. ඕවිටිගලයි, කෙවිටියගලයි. මේ ඕවිටිගල කියන්නේ වික්‍රම් ගුණසේකර මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ බොහොම ගෞරවයට පාත්‍ර වුණු ප්‍රදේශයක්.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පන්දම් පත්තු කරන -

**ගරු රංජිත් සෝමවංශ** – නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

පන්දම් පත්තු කරන එකත් නරක දෙයක් නොවෙයි. පන්දම් පත්තු කළා. අදත් ඕවිටිගල ඒ කාරණාවලට ගොනු වුණේ හොඳ බෞද්ධාගමික ප්‍රබෝධයක් තිබුණු පළාතක්. අදත් ඒක තිබෙනවා. ඕවිටිගල අපේ සුමේධ නායක හාමුදුරුවන්ගේ විහාරස්ථානය. හැමදාම වර්ෂ අවසානය වනකොට විශාල පිංකම් මාලාවක් වර්ෂ ආරම්භ වනකොට විශාල පිංකම් මාලාවක් ඒ පළාතට, ජනතාවට, රටට සෙත් පතලා ජනතාවගේ සහයෝගීතාවය ජනතාවගේ දුකේදී, සැපේදී පන්සල මූලික කරගෙන තමයි ඕවිටිගල ජනතාව හැදුණේ, වැඩුණේ. ඉතාම සරුසාර කෙත් වතු, ගහකොළවලින් හැඳුණු හොඳ පවුලක ඉපදුණු කෙනෙක් තමයි කරුණාරත්න මැතිතුමා. ඉතින් කරුණාරත්න මන්ත්‍රීතුමාට ලොකු ප්‍රවේශයක් තිබුණා. මොකද, අලුත් දේශපාලඥයින්ට හොඳ ප්‍රවේශයක් තිබෙන - මම දන්නේ නැහැ දැන් කොහේ යනවාද කියලා. මේ කථාවෙන් පස්සේ කියන්න එපා රංජිත් සෝමවංශ මන්ත්‍රීතුමා පණ්ඩිතයා කියලා. පණ්ඩිතයා නොවෙයි. අපටත් පේනවා නේ යන පාරවල්. හැබැයි, ඒ කාලේ අනිල් මුණසිංහ ප්‍රවේණියත් එක්ක කරුණාරත්න මහත්මයාට හොඳ පාරක් කැපුනා. කරුණාරත්න මහත්මයා හරි ජනප්‍රිය වුණු දේශපාලඥයෙක්. ඒ පළාතේම හරි ජනප්‍රියයි. මිය යනකොටවත් කරුණාරත්න මහත්මයාට ඉතුරු වුණු දෙයක් නැහැ. අද බලන්න එපැයි ඉතින්. අද මම කියන්න ඕනෑ, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරු ගැන. මගේ පළාතේ එක සභාපතිවරයෙක් සෙවන්ටි කියන බයිසිකලයෙන් වැනි වැනී ආවේ. ළඟදී කණ්ඩායමක් ගියාලු කොහොමද සල්ලි හම්බ වුණේ කියලා හොයන්න. ෆුට් සයිකලෙත් නැහැ. ඒ නිසා දේශපාලනයේ තිබෙන පිරිසිදුකම, ප්‍රතිපත්තිගරුක භාවය, ජනතාවට වගකීම (බාධා කිරීමක්) වෙන්න පුළුවන්. ජනතාව වෙනුවෙන්ම තමයි න්‍යාය පත්‍රය හදන්නේ. එදා අනිල් මුණසිංහ මහත්මයාගේ දේශපාලන න්‍යාය පත්‍රය ජනතාවාදී න්‍යාය පත්‍රයක්. කරුණාරත්න මහත්මයාගේත් එහෙමයි. ඒ දවස්වල ආදරේට කියන්නේ කරු කියලා. කරු පාරට බැස්සාම ගෙදර එන වෙලාව ගෙදර අය දන්නේ නැහැ. මොකද, මළ ගෙවල්වල, බණ ගෙවල්වල, පිරිත් ගෙවල්වල හැම තැනම යනවා. එකක් නැර යනවා. රෑට ගෙදර එනකොට දන්නේ නැහැ. උදේට තාත්තා නිදි. පුතාලා, දුවලා ඉස්කෝලේ යනවා. අපේ හුඟක් දේශපාලඥයින්ට අද දවසේත් තිබෙනවා. මම කියන්නේ ඒ තරම් ජනතාවාදී වුණා. ඒ නිසාවෙන් මේ ප්‍රාදේශීය සභාවේ අනිල් මුණසිංහ මහත්මයාගේ ලේකම්

හැටියට කාලයක් හිටියා. හොඳ සේවයක් කළා. හොඳ සේවයක් කළා. ඒ වාගේම මතුගම ආසනයේ බල මණ්ඩලයේ ලේකම් හැටියට කාලයක් හිටියා. ඒ අපට ආණ්ඩුවක් නැති කාලේ. ආණ්ඩුවක් පෙනෙන මානයක්වත් ඒ කාලේ තිබුණේ නැහැ. ඒ කාලේ තමයි අපි ජනාධිපතිතුමාත් එක්ක පාද යාත්‍රා ගියේ. දම්වැල් ගැට ගැහුවේ. නලා පිම්බේ ඒ කාලේ. ඒ කාලේ පාද යාත්‍රා ගිය අය ඇඳ යට. පාද යාත්‍රාව දැකපු නැති අය ඇඳ උඩ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නලා පිඹපු කට්ටිය.

**ගරු රංජිත් සෝමවංශ** - නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

නලා පිඹපු අය අහලකවත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන් තරම් අපි ශෝක ප්‍රකාශ යෝජනාවට එමු.

**ගරු රංජිත් සෝමවංශ** - නියෝජ්‍ය සභාපතිතුමා
Hon. Ranjith Somawansa - Deputy Chairman

ඒ නිසාවෙන් කරුණාරත්න ඒ පළාතට විශේෂ මෙහෙවරක් කළා. මම කියන්න ඕනෑ. හැම පාසලකටම කරුණාරත්න මහත්මයා යනවා. අපි දෙන්නා හරි යාළුයි. මෙතැන හිටියා අපේ තවත් යාළුවෙක්. අනිල් කුමාර විජේසිංහ. එයා DNF එකෙන් ආවේ. ලලිත් ඇතුලත්මුදලි මහත්මයාගේ. ඊට කලින් එක්සත් ජාතික පක්ෂයෙන් ආවේ. යූසුප් ගරු මන්ත්‍රීතුමා එහෙම බොහොම ළඟින් ඇසුරු කළා. අපි හරි මිත්‍රයි. කිසිම ගැටළුවක් තිබුණේ නැහැ. අදත් අපි යූසුප් ගරු මන්ත්‍රීතුමා සමග හිතවත්ව කටයුතු
[ ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා ]

කරනවා. අපි එකට වැඩ කරන්නේ. ඒ කාලේ අපි හැම පාසලකටම යනවා. හැම පාසලකම අඩුපාඩු බලනවා. මතුගම ශාන්ත මරියා විද්‍යාලය එතුමා ඉගෙන ගත්තු පාසලක්. ඒ පාසල දියුණු කරන්න හොඳ සේවයක් කළා. මතුගම පාන්තිය මහ විද්‍යාලය කණිෂ්ටයක් වෙලා තිබුණේ. කණිෂ්ටය මහ විද්‍යාලයක් කළෙත් මමයි කරුණාරත්න මන්ත්‍රීතුමයි යෝජනා කරලා. ඒ කාලේ අපේ විදුහල්පතිතුමාත් දේශපාලනය කරපු කෙනෙක්. කොමියුනිස්ට් පක්ෂයේ. ඒ කාලේ වටේම පාසල් රාශියක් හදන්න අපි, කරුණාරත්න මන්ත්‍රීතුමා පළාත් සභාවේ ඉඳගෙන කටයුතු කළා. අලුත් ගොඩනැගිලි. පාසල් ළමුන්ගේ තිබෙන අවශ්‍යතාවන් හුඟාක්. ඒ වාගේම මතක තියා ගන්න ඕනෑ. ප්‍රාදේශීය සභා සභාපතිවරයා ඉඳිද්දී මතුගම ශ්‍රවණාගාරය හදන්න, ඒ වාගේම පුස්තකාලය හදන්න, වටේ පාරවල් ටික ලස්සනට හදන්න, ඈත දුෂ්කර ගම්වල මිනිස්සුන්ට උදව් කරන්න, රැකී රක්ෂා දෙන්න, විදුලිය දෙන්න, මිනිසුන්ගේ ඕනෑ එපාකම් සියල්ලටම බොහොම හොඳ දායකත්වයක් දුන්නා. ඒ දායකත්වය තුළ අපේ ජිනරත්න මන්ත්‍රීතුමා, මම හිතවත්කමට කියන්නේ ගුණතිලක මහත්මයා කියලා. ඒ පවුලේ ප්‍රාදේශීය සභා උප සභාපතිවරයෙක් හැටියටත් දීර්ඝ කාලයක් සේවයක් කළා. සමාජයට බර වුණු, දූෂිත චංචාවන් නැති යහ ගුණයෙන් පිරුණු පවුලක තමයි කරුණාරත්න මහත්මයා ජන්ම ලාභය ලැබුවේ. ඉතින් මම හිතනවා, අද දවසේ අපේ යුතුකමක් - මට ආරංචියක් ලැබුණා අද සවස් භාගයේ ගෙදර පිංකමකුත් තිබෙනවා. එතුමාගේ ගුණ සමරා පිං පැමිණ වීමේ පිංකමකුත් තිබෙනවා කියලා.

විශේෂයෙන් කරුණාරත්න මන්ත්‍රීතුමා මේ සභාවේ අභිවෘද්ධිය සඳහා, බස්නාහිර පළාත් සභාවේ උන්නතිය සඳහා, අපේ ජනතාවත් එක්ක ගනුදෙනු කරනකොට, ගැටළු හදා නොගත් කෙනෙක්. අපේ පක්ෂයේ නොවන මන්ත්‍රී කෙනෙක් වුණත් බොහොම මිත්‍රශීලීව කටයුතු කළා. ඒ නිසාවෙන් අපි ලොකු වේදනාවකට පත් වුණා. එතුමා හදිසියේ අභාවප්‍රාප්ත වීම නිසාවෙන්. එතුමා කෙටි කාලයක් රෝගාතුර වෙලා හිටියා. යම් යම් අසනීප තත්ත්වයන් තුළම තමයි එතුමාට මෙලොව හැර දා යන්නට ඒ කනගාටුදායක අවස්ථාව ලැබුණේ. හොඳ දූ දරුවෝ ටිකක් ඉන්නවා. විශේෂයෙන් දියණිවරු. ඒ නිසාවෙන් හොඳ පවුලක, හොඳ මන්ත්‍රීවරයෙක් හැටියට අද එතුමා අප අතර නැති වුණත් එතුමා ගැන හොඳ දේවල් කථා කරන්න පුළුවන්. හෘද සාක්ෂියට එකහව එතුමාට ගරු කරන්න පුළුවන්. හුඟක් හොඳ සාමාජීය වටපිටාවක්, පරිසරයක් එතුමා අපට ඉතුරු කරලා දීලා තිබෙනවා. ඒ නිසාවෙන් අද බස්නාහිර පළාත් සභාව හැටියට අපේ ගරු සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාවට මමත් එකතු වෙනවා. විශේෂයෙන් මගේ කල්‍යාණ මිත්‍රයෙක්. සහෘදයෙක්. ඒ වාගේම අපේ පළාතේ ඥාතිවරයෙක්. ඒ නිසාවෙන් මේ වෙලාවේ පවුලේ ආදරණීය බිරිඳ, ඒ වාගේම සොහොයුරන් තුන් දෙනෙක්ම ඉන්නවා. ජිනරත්න මහත්මයා පැමිණ සිටිනවා මම දුටුවා. ඒ වාගේම පවුලේ දූ දරුවන් කිහිප පොලක්ම ඉන්නවා මම දුටුවා. ඒ සියලු දෙනාටම මේ මොහොතේදී මගේ පෞද්ගලික ශෝකයත්, ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ අපි සියලු දෙනාගේම ශෝකයත් යළිත් පළ කර සිටිනවා. නිහතමානී, ගුණ ගරුක පුංචි මිනිස්සුන්ගේ පැත්තේ ඉඳලා හොඳ ගෞරවාන්විත සේවයක් කරන ලද්දා වූ කරුණාරත්නයන් බඳු දේශපාලඥයෝ ඉදිරියට තව තවත් බිහි වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, එතුමාට නිවන් සුවම අත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

ගරු සභාපතිතුමනි, අද දින මේ මොහොතේ ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා වෙනුවෙන් ශෝකය පළ කරන අවස්ථාවේ කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරපු ගරු මන්ත්‍රීවරයෙක් හැටියට කාලයේ ප්‍රශ්නයක් තිබුණත් වචනයක් හරි කථා කළ යුතුයි කියන අදහස මට ආවා. ඇත්තටම අපේ වයසත් එක්ක එතුමා ගැන මුලින් අපි නොදන්නවා වුණාට එතුමාගේ අග භාගයේදී ඉතාමත්ම සමීපව

එතුමාව ආශ්‍රය කරන්න ලැබීම සතුටට කරුණක්. එතුමාගේ අදහස්, එතුමාගේ ඒ වැදගත් චරිත ලක්ෂණ අපි ඇත්තටම දැක්කා. ඒ තුළින් අපට හිතා ගන්න පුළුවන් අද දිනයේ අපේ ගරු සභානායකතුමා, කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා, ඒ.එම්. යුසුෆ් ගරු මන්ත්‍රීතුමා, රංජිත් සෝමවංශ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මතක් කළ පරිදි එතුමා මේ සමාජයේ සුවිශේෂී සේවයක් දේශපාලඥයෙක් වශයෙන් සිටිය යුතු හැම ස්ථානයකම එතුමා ඉටු කරන්න කටයුතු කරලා තිබෙන බව. ආසන බල මණ්ඩලයේ ලේකම්තුමා හැටියට. ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා හැටියට. පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා කටයුතු කරලා තිබෙනවා. පහළ තැන ඉඳලා දේශපාලනයට ඇවිල්ලා එතුමාට කරන්න පුළුවන් සේවය ඒ කැපවීම තුළ සේවය ඉටු කරලා, ඒ සේවය තුළ අද මේ කථා කරපු ආකාරයට මතුගම ශ්‍රවණාගාරය, ඒ වාගේම පාසල් පද්ධතිය, විශේෂයෙන් අදිකාරී පාසල පිහිටුවන්න කටයුතු කළා. එතුමා අද නැති වුණත් එතුමාගේ සේවය තුළින් සමාජයට ලොකු වටිනාකමක් දෙන්න, සමාජයට වැඩදායී වන වැඩ පිළිවෙළවල් එතුමා ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ නිසා ඇත්තටම ආශ්‍රය කරන අවසාන කාලයේ අපි හිතුවේ නැහැ ඔය තරම් ඉක්මණට අපෙන් සමුගනියි කියලා. නමුත් ඒ රෝගාබාධත් එක්ක එතුමාට සමුගන්න සිද්ධ වුණා. මට මතකයි ඒ අවසාන භාගයේදී වරාය හා මහා මාර්ග අමාත්‍ය, මගේ නායක නිර්මල කොතලාවල මැතිතුමාගේ කාර්ය මණ්ඩලයේ එතුමාට තැනක් හිමි වෙලා තිබුණා. ඒ තුළින් හැමදාම එතුමාගේ අදහස්, එතුමාගේ වැඩ කටයුතුවලට අපට සම්බන්ධ වෙන්න පුළුවන් වුණා. ඇත්තටම එතුමා ඒ මහජන නියෝජිතකමෙන් පස්සෙත් මිය යනතුරු එතුමාගේ සමාජ සේවය නොකඩවා ඉදිරියට ගෙන ගියා කියන එක මතක් කරන්න ඕනෑ.

ඒ නිසා ඇත්තටම එතුමා මිය යන මොහොතේ, ඒ වාගේම අවසන් කටයුතු කරපු දවසේ මම හිතන්නේ, මේ සමාජයට ලොකු ආදර්ශයක් දුන්නා. එදා ශ්‍රවණාගාරයට ඒ දේහය ගෙනැල්ලා තැන්පත් කරපු වෙලාවේ ඉතිහාසයේ කවදාවත් නැති ආකාරයට පරණ දේශපාලන නායකයින්, ඒ නායකයින්ගේ පුත්තු ශ්‍රවණාගාරයට එකතු වුණා. සමහරු දැකලත් නැහැ. ඒ තරම් ගරුත්වයක්. අපේ අනිල් මුණසිංහ මැතිතුමාගේ පුත්‍ර රත්නය සමඟ, සමහර වෙලාවට මතුගමට නොපැමිණි පරණ හොඳ දේශපාලන නායකයින්ගේ පුත්තු, දේශපාලන නායකයින් ඉතාමත් සුන්දර මොහොතක් හැටියට මම එදා එය දැක්කා. ඒ අවමංගල කටයුතු වෙලාවේ වුණත්. ඇත්තටම ඒ තරම් දෙයක් කරන්න, ඒ තරම් හැඟීමක් ඇහට එන්නේ එතුමා කටයුතු කරපු ආකාරයටයි කියලයි මම විශ්වාස කරන්නේ. ඉතින් අපේ කරුණාරත්න මැතිතුමාගේ පවුලේ සමාජ සේවයට ලැදි බොහෝ පිරිසක් ඉන්නවා. අපි දන්නවා ආරියදාස මහත්මයා, ජිනරත්න මහත්මයා හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් හැටියට දැනටත් සුවිශේෂී කාර්ය භාරය ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් නියෝජනය, සමාජ සේවය කරන ඒ සහෝදරයා. ඒ වාගේම පවුලේ සියලු දෙනාට මගේ පෞද්ගලික ශෝකය පළ කරන ගමන්, අපේ ආගමේ හැටියට අපි සියලු දෙනාම මතක් කළා වාගේ එතුමාට නිවන් සුව අත් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිවංගත හිටපු පළාත් සභා මන්ත්‍රී ගරු ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ කිරීමේ යෝජනාවට අදහස් දැක්වීම මින් අවසන් වෙනවා. මම මේ අවස්ථාවේදී ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා වෙනුවෙන් ශෝක ප්‍රකාශ ඉදිරිපත් කළ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කර සිටිනවා. ඒ වාගේම ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා ගැන කථා කරනකොට සමකාලීන දේශපාලඥයෙක් වශයෙන් 1991 පළාත් පාලන හා සම්බන්ධව කටයුතු කරන කාලේ පටන් හඳුනා ගත්තු ඉතාමත්ම වටිනා මිතුරෙක් තමයි අපේ ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා. එයට හේතු කාරණා කිහිපයක් තිබෙනවා. මොකද, මගේත් ගම් ප්‍රදේශය. පස්යොදුන් කෝරළයේ වලල්ලාවිට ගම. නිරන්තරයෙන්ම අපි පොඩි කාලේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා රංජිත් සෝමවංශ මැතිතුමාලා අපි මතුගම ගමත් එක්ක බොහොම සම්බන්ධ වුණු අය. පාසල් යාමට පවා, යම් යම් හේතු කාරණා අපට තිබුණා. එදා ආශ්‍රය කරපු හිතවත්කම්, මිත්‍රත්වය 1993 දී බස්නාහිර පළාත් සභාව නියෝජනය කිරීමට එතුමාටත් අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාවේ පටන් එතුමා පළාත් සභාව තුළ පවා අපත් සමග බොහොම කල්‍යාණශීලී මිත්‍රයෙක් වාගේ කටයුතු කළා. පළාත් සභාවේ අනාගතය වෙනුවෙන් සහ විශේෂයෙන් එතුමා නියෝජනය කරපු කළුතර දිස්ත්‍රික්කය වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කරපු පළාත් සභා මන්ත්‍රීවරයෙක්. මම හිතන්නේ, ඒ ගැන මම දීර්ඝ වශයෙන් කථා කරන්න අවශ්‍ය නැහැ. අදහස් ප්‍රකාශ කළ අපේ රංජිත් සෝමවංශ ගරු නියෝජ්‍ය සභාපතිතුමා, අනෙක් ගරු මන්ත්‍රීතුමන්ලා, ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා එතුමා ගැන පැහැදිලි හැඳින්වීමක් කළා එතුමා කෙබඳු පුද්ගලයෙක්ද කියන එක. ඒ නිසා එතුමාගේ අභාවය අපි හැමෝටම විශාල පාඩුවක්. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බරපතළ පාඩුවක්. කෘතහස්ත දේශපාලඥයෝ අපත් එක්ක සිටිය යුතු යුගයක්. නමුත් මම හිතන්නේ, එතුමා දේශපාලන වශයෙන් හැමෝම කිව්වා වාගේ මුදල් හම්බ කරපු මන්ත්‍රීවරයෙක් නොවෙයි. නමුත් මිනිස්සු හම්බ කළා. ඒකයි අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළේ. අවසාන උත්සවය වෙලාවේදීත් සවස් වෙලාවේදීත් විශාල ජනතා සහභාගීත්වය තුළින් අපට එය තේරුම් යනවා. ඒ නිසා මේ අවස්ථාවේදී අභාවප්‍රාප්ත ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමා වෙනුවෙන්, එතුමාත් එක්ක සමකාලීන දේශපාලඥයෙක් වශයෙන්

මම මේ අවස්ථාවේ මගේ පවුලේ සහ මගේ පෞද්ගලික ශෝකය එතුමාගේ ආදරණීය බිරිඳ ඇතුළු පවුලේ ඥාතීන්ට පුද කර සිටිනවා. මම හිතන්නේ එතුමා වෙනුවෙන් තුන් මාසේ බණත් අදට යෙදිලා තිබෙන්නේ. එතුමාගේ බිරිඳ සහභාගී නොවුණත් මම ලේකම්තුමාට උපදෙස් දෙනවා මේ සියලුම ශෝක ප්‍රකාශ යෝජනා ඇතුළත් හැන්සාඩ් වාර්තාව පවුලේ ඥාතීන්ට ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස. ඒ වාගේම මේ අවස්ථාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ අමාත්‍යවරු මේ අවස්ථාවේ නොසිටියත් ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම අමාත්‍යවරුන්ගේ ශෝකය මේ අවස්ථාවේදී පවුලේ ඥාතීන්ට පුද කර සිටිනවා. ඒ වාගේම අදහස් දැක් වූ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේත්, බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් බස්නාහිර පළාත් සභාවේම කනගාටුව ශෝකය ඒ ආදරණීය බිරිඳ ඇතුළු පවුලේ ඥාතීන්ට මේ අවස්ථාවේදී පුද කරමින් ලේකම්තුමාට උපදෙස් ලබා දෙනවා අදාළ වාර්තා පවුලේ ඥාතීන්ට ලැබෙන්නට සලස්වන ලෙස. අවසාන වශයෙන් අපෙන් සමුගත්, අපේ හිතවත්, කලණ මිතුරු ඩබ්ලිව්.ඩී. කරුණාරත්න මැතිතුමාට අපි කවුරුත් ප්‍රාර්ථනා කරන අති උතුම් අජරාමර අමා මහ නිවන් සුව ප්‍රාර්ථනා කරමින් ශෝක ප්‍රකාශ යෝජනාව අවසන් කරනවා.

## රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න

QUESTIONS PRESENTED UNDER RULE NO : 30

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඇසීම සඳහා ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා අවස්ථාව.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු ප්‍රධාන ඇමැතිතුමාට ප්‍රශ්න දෙක ඉදිරිපත් කරනවා.

01.

අ. බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත 2012 වසරේ පළාත් සභා මගින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද?

ආ. එම මුදල් ප්‍රමාණය වෙන් කරන ලද්දේ කුමන ආකාරයකටද?

ඇ. (i) භෞතික සම්පත් දියුණු කිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද?

(ii) එම මුදල සම්පූර්ණයෙන් වැය කර තිබේද?

(i) පළාත් සභා ප්‍රතිපාදනවලට අමාතරව වෙනත් ආකාරයකින් ප්‍රතිපාදන ලැබුණේද?

(ii) එසේ නම් ඒ කොපමණද?

(iii) ඒ කුමන මාර්ගවලින්ද?

ඈ. (i) 2013 වසරේදී අධ්‍යාපන විෂයය සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද?

(ii) භෞතික සම්පත් වැඩි දියුණු කිරීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද?

(iii) පළාත් සභා ප්‍රතිපාදනවලට අමතරව වෙනත් ආකාරයෙන් මුදල් ලැබී තිබේද?

(iv) ඒ මොනවාද?

02.

අ. 2012 වසරේ බස්නාහිර පළාතේ පාසල්වල තීන්ත ආලේප කිරීම සඳහා වියදම් කළ මුදල කොපමණද?

ආ. එම මුදල් ලබා දෙන ලද්දේ කුමන වැඩ සටහන් යටතේද?

ඇ. පළාතේ පාසල් කොපමණ සංඛ්‍යාවක් සඳහා මෙම මුදල් ලබා දුන්නේද?

ඈ. ලබා දුන් මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැඩිපුර මුදල් අය කිරීමට බලධාරීන් වෙත උපදෙස් හෝ බලය ලබා දී තිබුණේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද උදෑසන 09.20 සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී ඇසීම සඳහා ඉහත සඳහන් ප්‍රශ්න දෙක මට භාර දුන්නා. ඒ පිළිබඳව අපි ගරු ප්‍රධාන ඇමැතිතුමාත් දැනුවත් කළා. එතුමාටත් පිටපතක් ලබා දුන්නා. නමුත් මේ අවස්ථාවේදී ගරු ප්‍රධාන ඇමැතිතුමා සභා ගර්භයේ නොමැති නිසා සහ මේ වනතුරු අපට ඒ සම්බන්ධව පිළිතුරක් ලැබුණේත් නැති නිසා තව මොහොතකින් සභා කටයුතු කාරක සභාව පැවැත් වෙනවා. මම හිතන්නේ ඔබතුමාත් ඒ අදහසට කැමැති වෙයි. අද දින සභා කටයුතු කාරක සභාවට එය යොමු කරලා ඊළඟ න්‍යාය පත්‍රයට ඔබතුමාගේ ප්‍රශ්නය අනිවාර්යයෙන්ම යොමු කරන්න කටයුතු සූදානම් කරන බවත් මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

***අනතුරුව ප්‍රශ්නය ඊළඟ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*Later, the Hon. Chairman ordered to refer the question to the next Council sitting.*

## කල් තැබීම
## ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව ප. භා. 02.00 ට, 2013 මාර්තු මස 05 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 02.00 p.m till 9.30 a.m. on 05.03.2013*